SEC ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# ස්ථාවරත්වය සමඟ වර්ධනය



වාර්ෂික වාර්තාව 2013

# පටුන


| | |
|---|---|
| අපගේ දැක්ම / අපගේ මෙහෙවර | 01 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 04 |
| ආයතන ප්‍රධානිගේ සමාලෝචනය | 08 |
| කොමිෂන් සභා සාමාජිකයන් | 14 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | 20 |
| සාර්ව ආර්ථික විවරණය | 22 |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාලෝචනය | 25 |
| කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය | 29 |
| මෙහෙයුම් කටයුතු සමාලෝචනය | 36 |
| අතිරේක තොරතුරු | 68 |
| දත්ත ගොනුව | 72 |

**මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 76 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 78 |
| මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය | 79 |
| සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 80 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 81 |
| සෙස් අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 82 |
| වන්දි අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 83 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 84 |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 87 |

**මූල්‍ය ප්‍රකාශන - පියවීම සහතික කිරීමේ අරමුදල**

| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 98 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 100 |
| මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය | 101 |
| ශුද්ධ වත්කම් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 102 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 103 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 104 |
| ආයතනික තොරතුරු | ඇතුල් පිට කවරය |




# ස්ථාවරත්වය සමඟ වර්ධනය

වෙනස්වීම් වලට සහ අභියෝග වලට නොසැලී මුහුණදීමට නම් ස්ථාවරත්වය මත පදනම් වූ අඩිතාලමක් තිබිය යුතුය. 2013 වර්ෂය සඳහා අපගේ පණිවිඩය වනුයේ මෙම ස්ථාවර පදනමයි. අවම උච්චාවචනයන් සහිත ස්ථාවර ප්‍රාග්ධන වෙළෙඳපොළක් තුළින් අනාගත වර්ධනය සඳහා හිතකර වාතාවරණයක් ඇති කළ, වඩාත් අභියෝගාත්මක මෙන්ම වැඩදායක වසරක් දැකගත හැකි විය. නවීන නියාමන රාමුවක්, ශක්තිමත් පාලන යාන්ත්‍රණයක් සහ දුර දක්නා සැළසුම් තුළින් අනාගත සමෘද්ධිය සඳහා ස්ථාවර පදනමක් වසර තුළ අප, ගොඩනංවා ඇත. සාධාරණ විනිවිදභාවයෙන් යුතු, හා කාර්යක්ෂම ආයෝජන පරිසරයක් සඳහා පදනමක්ද තබන ලදී.

## අපගේ දැක්ම

ඵලදායී, කාර්යක්‍ෂම සහ ක්‍රියාකාරී සුරැකුම්පත් වෙළෙඳපොළ
විධිමත්කරණයෙහි දකුණු ආසියාවේ ප්‍රමුඛයා බවට පත්වීම

## අපගේ මෙහෙවර

සාධාරණ සහ කාර්යක්‍ෂමවූත්, නියමානුකූල සහ පාරදෘෂ්‍යවූත්,
සුරැකුම්පත් වෙළෙඳපොළක් ප්‍රවර්ධනය, සංවර්ධනය සහ පවත්වාගෙන යෑම



# කළමනාකාරීත්වයේ

## තොරතුරු

# සභාපතිතුමාගේ සමාලෝචනය



ගෝලීය ආර්ථිකය 2013 වසරේදී නොයෙකුත් අභියෝග මධ්‍යයේ වුවද බලාපොරොත්තු ඇති කරමින් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මූල්‍ය අර්බුදයේ අහිතකර බලපෑම් කෙමෙන් පහව ගොස් ගෝලීය ආර්ථිකය තුළ ධනාත්මක මෙන්ම ඍණාත්මක සිදුවීම්ද ඇති විය. ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපය හා චීනයේ ආර්ථික ස්ථාවර වීම නැගී එන ආර්ථිකයන්ට සම්ප්‍රේෂණය වුවද මෙම ආර්ථිකයන් තුළ එතරම් සීඝ්‍ර වර්ධනයක් විද්‍යාමාන නොවීය.

මෙවන් වාතාවරණයක් මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය අඛණ්ඩව වර්ධනය විය. දළ දේශීය නිෂ්පාදනය 7.3% ක වර්ධන වේගයක් සනිටුහන් කළ අතර අනිකුත් ආර්ථික දර්ශකද සුභවාදී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථනයන්ට අනුව 2014 සිට 2019 යන කාල සීමාව තුළ මෙරට ආර්ථික වර්ධන වේගය 6.5% ක් - 7% ත් අතර අගයක් වාර්තා කරමින් ආසියාවේ අනිකුත් රටවල් (6.5% - 6.7% ) වලට සාපේක්ෂව වැඩි අගයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කරයි.

සියලුම ධනාත්මක තත්ත්වයන් පැවතියත් ප්‍රධාන අභියෝග හා සැලකිය යුතු තත්ත්වයන් එසේම පවතී. ශ්‍රී ලංකාවට මධ්‍ය ආදායම් තත්ත්වය තහවුරු කර ගැනීමට නම් දැනට 31% වන දළ දේශීය නිෂ්පාදනයේ ආයෝජන අනුපාතය 2016 වන විට 33% කින් වර්ධනය කරගත යුතුය. තවද ඇමරිකානු ඩොලර් බිලියන 9.4 ක් වන අයවැය හිඟය සමස්ත විදේශ වත්කම් වලට (2013 වසරේදී ඇමරිකානු ඩොලර් බිලියන 8.5) හා රුපියල් 129 පමණ අගයක දෝලනය වූ විනිමය අනුපාතිකයට අහිතකර ලෙස බලපෑම් කරන ලදී. ඍජු විදේශ ආයෝජනය 2004 සිට 2013 කාල සීමාව තුළ ඇමරිකන් ඩොලර් මිලියන 230 සිට ඇමරිකානු ඩොලර් බිලියනයකට වඩා වර්ධනය වුවද අපේක්ෂිත ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීමට තවදුරටත් වර්ධනය විය යුතුය.

ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විචක්ෂණශීලි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. එමගින් උද්ධමනය තනි අංකයක මට්ටමක පවත්වාගෙන යාමටත් මූලික ප්‍රතිපත්ති අනුපාතයන් වන මහ බැංකු ප්‍රති මිලදී ගැනීමේ අනුපාතය 6.5% මට්ටමකද, මහ බැංකු ප්‍රති විකුණුම් අනුපාතය 8.5% අගයක් පවත්වා ගෙන යාමට හැකි විය.

මීට සමගාමීව ශ්‍රී ලංකාව පිළිබඳ ගෝලීය ආකල්පද ධනාත්මක විය. අනිකුත් ආසියානු රටවල් අභිබවමින් ශ්‍රී ලංකාව ආර්ථික ස්වතන්ත්‍රණ දර්ශකයේ 81 වන ස්ථානයට පත්විය. තවද ගෝලීය තරඟකාරී දර්ශකයේ 65 ස්ථානය ගනිමින් දකුණු ආසියාවේ දෙවැනි ස්ථානයට පත්විය.



**"2013 වසරේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ කාර්ය සාධනය ධනාත්මක මෙන්ම ඍණාත්මක සිදුවීම්වලින් සමන්විත විය. කොළඹ කොටස් හුවමාරුවේ නව ලැයිස්තුගත කිරීමක් පමණක් වාර්තා වුවද ණයකර වෙළෙඳපොළ සීඝ්‍ර ලෙස වර්ධනය විය. ණයකර නිකුතූන් 28 ක් වාර්තා වූ අතර එහි මුළු වටිනාකම රුපියල් බිලියන 68.2 ක් විය. එය වසරකදී වාර්තා වූ ඉහළම අගය විය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මැදිහත් වීමෙන් 2013 ජාතික අයවැයෙන් ලබා දුන් බදු සහන මෙවන් සීඝ්‍ර වර්ධනයකයට හේතු විය."**

ආචාර්ය නාලක ගොඩහේවා
සභාපති

# සභාපතිතුමාගේ සමාලෝචනය

2013 වසරේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ කාර්ය සාධනය ධනාත්මක මෙන්ම ඍණාත්මක සිදුවීම්වලින් සමන්විත විය. කොළඹ කොටස් හුවමාරුවේ නව ලැයිස්තුගත කිරීමක් පමණක් වාර්තා වුවද ණයකර වෙළෙඳපොළ සීඝ්‍ර ලෙස වර්ධනය විය. ණයකර නිකුතූන් 28 ක් වාර්තා වූ අතර එහි මුළු වටිනාකම රුපියල් බිලියන 68.2 ක් විය. එය වසරකදී වාර්තා වූ ඉහළම අගය විය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මැදිහත් වීමෙන් 2013 ජාතික අයවැයෙන් ලබා දුන් බදු සහන මෙවන් සීඝ්‍ර වර්ධනයකයට හේතු විය.

2013 වසර තුළ සියලු කොටස් මිල දර්ශකය 4.8% ක යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කාර්යඵල මිනුම් වශයෙන් 2012 වර්ෂයේදී සමස්ත කොටස් මිල දර්ශකයේ (ASPI) ප්‍රතිලාභය 7.1% ඍණාත්මක අගයක් පෙන්නුම් කළද 2013 වර්ෂයේදී ඊට සාපේක්ෂව 4.8 % ධනාත්මක අගයක් තරමක හිතකර ප්‍රතිලාභයක් පෙන්නුම් කරන ලදී. 2013 වර්ෂයේදී වෙළෙඳපොළ ප්‍රතිලාභය එතරම් ආකර්ෂණීය නොවුවද පෙර වර්ෂයේ පැවැති ඍණාත්මක ප්‍රතිලාභ තත්ත්වයන් පහව ගොස් ධනාත්මක ප්‍රතිලාභ මට්ටමකට වෙළෙඳපොළ 2013 වර්ෂයේදී පරිවර්තනය වී ඇත. විදේශීය මිලදී ගැනුම්වල ස්ථාවර වර්ධනයක් සමඟ විදේශීය ආයෝජනයන්ගේ සහභාගීත්වයේ ඉහල යෑමක් දක්නට ලැබිණි. වඩාත් වැදගත් වන්නේ 2011 රුපියල් බිලියන 19 ක්ව පැවැති ශුද්ධ විදේශ විකුණුම් 2012 වර්ෂයේදී රුපියල් බිලියන 38.6 ක හා 2013 වර්ෂය රුපියල් බිලියන 22.7 ක ශුද්ධ විදේශ ගැණුම් ලෙස විශාල ප්‍රගතියක් පෙන්නුම් කිරීමයි. අනෙකුත් නැගී එන ආර්ථික සමග ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළහිද 15 ගුණයක මිල ඉපැයුම් අනුපාතයන් දක්නට ලැබුණි. 2008 සිට 2013 දක්වා සැසැඳීමේදී වසරකට 32% සාමාන්‍ය ප්‍රතිලාභයක් කොළඹ කොටස් වෙළෙඳපොළෙන් හිමිකර දී ඇත. එය නැගී එන වෙළෙඳපොළවල්වල 12% ක සාමාන්‍ය අගයන් ෆ්‍රොන්ටියර් වෙළෙඳපොළවල්වල 4% ක සාමාන්‍ය අගයන් හා සැසඳීමේදී ඉතා ආකර්ෂණීය ප්‍රතිලාභයකි.

**අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට විශාල කාර්යභාරයක් පැවරී ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තම ද්විත්ව භූමිකාව හඳුනාගෙන ඊට අනුකූලව පැහැදිලි අරමුණු සකස් කොට ඇත.**

ඒකක භාර කර්මාන්තය 2013 වසර තුළ 75% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2012 තුළ රුපියල් බිලියන 31 ක්වූ ශුද්ධ වත්කම් වටිනාකම 2013 දෙසැම්බර් 31 වන විට රුපියල් බිලියන 54 ක් දක්වා වර්ධනය විය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය හා සංවර්ධනය යන දෙවැදෑරුම් අරමුණු සාක්ෂාත් කරගනිමින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ මූලික පාර්ශවකරුවන්ගේද සහාය ඇතිව වෙළෙඳපොළ සංවර්ධනයට අවශ්‍යවූ උපාය මාර්ග විධිමත්ව සකස් කරන ලදී. ඉහත කී උපාය මාර්ගයන්ගේ අභිමතාර්ථය වී ඇත්තේ වෙළෙඳපොළේ ඉදිරි දැක්මට අවශ්‍යවන්නා වූ පදනම සකස් කිරීම, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හා නීති සම්පාදනය තුළින් ආයෝජන ක්‍රියාපටිපාටිය වඩාත් ඵලදායි මගකට යොමු කිරීම සහ ආයෝජන විශ්වාසය ඉහළ නැංවීමයි. මෙම අරමුණු අතර හා ගෝලීය දායකත්වය වැඩි කිරීමට හා විදේශ ආයෝජන ආකර්ෂණය කිරීමේ අදිටනින් මුම්බායි, ඩුබායි හා හොංකොං යන රටවල ආයෝජන සම්මන්ත්‍රණ පැවැත්විය.


ඉතා වැදගත් තක්සේරු කිරීම් වලින් නිරූපණය වන්නේ 2013 වසරේ උපාය මාර්ගික සැලසුම්වලට අනුගතවී වෙළෙඳපොළ ප්‍රතිව්‍යුහගත වීමයි. කොටස් වෙළෙඳපොළ අසාමුහීකරණය තුළින් වෙළෙඳපොළේ තරඟකාරිත්වය හා ඵලදායිතාවය ඉහළ නැංවීමට අමතරව කොටස් වෙළෙඳපොළ ලාභ අරමුණු කර නොගත් ආයතනයක් සිට ලාභ අරමුණු කර ගත් ආයතනයක් දක්වා පරිවර්තනය කිරීමට නියමිතය. ඊට සමගාමීව ගෙවීම් සඳහා සහතික ලබාදීම මෙන්ම හිඟ විකුණුම් සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ මධ්‍යම ප්‍රතිපාර්ශවීය ආයතනයක් හා පැවරුම් එදිරිව ගෙවීම් ක්‍රමවේද අවදානම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කිරීමට නියමිතයි. ඊට අමතරව අවදානම කළමනාකරණ පද්ධතියක් තුළින් ව්‍යුහගත නිෂ්පාදන හා ව්‍යුත්පන්න හඳුන්වා දීමට අවශ්‍ය පදනමද සකස් කිරීමට නියමිතය.

අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට විශාල කාර්යභාරයක් අප හට පැවරී ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තම ද්විත්ව භූමිකාව හඳුනාගෙන ඊට අනුකූලව පැහැදිලි අරමුණු සකස් කොට ඇත. මෙම අරමුණු අතර වර්තමාන ෆ්‍රොන්ටියර්  වෙළෙඳපොළ දර්ශකයේ සිට මෝගන් ස්ටැන්ලි නැගී එන ආර්ථිකයන් දර්ශකයේ ස්ථානයක් ආරක්ෂා කර ගෝලීය හඳුනාගැනීම තහවුරු කිරීමත් නව ලැයිස්තුගත කිරීම් වැඩි කර ගැනීමක් සහ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය දළ දේශීය නිෂ්පාදනයෙන් 50% දක්වා ඉහළ නැංවීමෙන් වෙළෙඳපොළ පුළුල් කිරීමත් ප්‍රධාන ස්ථානයක් ගනී.

මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අතිගරු මහින්ද රාජපක්ෂ මහතාට හා භාණ්ඩාගාර ලේකම් වන පී. බී. ජයසුන්දර මහතාට ගෙවී ගිය වසර තුළ ලබා දුන් මඟපෙන්වීම හා නොබඳ සහයට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. කොමිෂන් සභා සාමාජිකයන්ට විශේෂ ස්තුතිය පිරි නැමීමට මෙය අවස්ථාවක් කර ගතිමි. වර්ෂය පුරා ලබා දුන් සහයෝගය උදෙසා මහ බැංකුවේ අධිපතිතුමාටත්, වෙළෙඳපොළ සංවර්ධනයට උරදුන් කොළඹ කොටස් හුවමාරුවේ සභාපතිතුමාටත්, අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණයටත්, තැරැව්කාර ආයතනවලටත්, ඒකකභාර ආයතනවලටත් හා අනිකුත් වෙළෙඳපොළ පාර්ශ්වකරුවන්ටත් මාගේ ස්තුතිය පුදකිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන් ඉහළ වෘත්තියභාවයෙන් තම කාර්ය ඉටුකරමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ උන්නතිය උදෙසා කටයුතු කල ආයතනික ප්‍රධානී/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා, අධ්‍යක්ෂ මණ්ඩලය හා ලේකම් කාර්ය මණ්ඩලයට මාගේ හද පිරි කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

2013 වසර තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ කැපී පෙනෙන ස්ථාවරභාවයක් පෙන්නුම් කරන ලදී. ප්‍රාග්ධන වෙළෙඳපොළ තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාදාමේදීද ප්‍රමුඛස්ථානය ගෙන කටයුතු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බැඳී සිටින අතර එමගින් ජාතික සංවර්ධනයට උරදිය හැකි ප්‍රබල හා කාර්යක්ෂම වෙළෙඳපොළක් බිහි කිරීම අපගේ අපේක්ෂාවයි.



ආචාර්ය නාලක ගොඩහේවා

සභාපති

2014 මැයි 20

# ආයතන ප්‍රධානිගේ සමාලෝචනය



2012 වර්ෂයේ පැවැති අභියෝග හා අවිනිශ්චිතතාවයන් ගෝලීය වශයෙන් යහපත් තත්ත්වයකට පරිවර්තනය වෙමින් 2013 වර්ෂය බලාපොරොත්තු ඇති කරන වර්ෂයක් බවට පත්විය. බොහෝ ආර්ථික විශ්ලේෂකයින්ගේ මතය වූයේ සංවර්ධිත මෙන්ම නැගී එන ආර්ථික ද යහපත් ආර්ථික ප්‍රතිචාර දක්වන බවත් ගෝලීය වශයෙන් නිවැරදි ආර්ථික මාර්ගයකට අවතීර්ණ විය හැකි බවත්ය.

පශ්චාත් යුධ සමයේ පැවති දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන රටාවම තවදුරටත් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාවට හැකි විය. මේ අනුව ශ්‍රී ලංකාවේ රජය රටේ ආර්ථිකය වර්ධනය වන ආකාරයට තම සාර්ථක ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක  කළේය. පොලී අනුපාතය ආර්ථික වර්ධනයට පිටුවහලක් වන ලෙස පහළ මට්ටමක පවත්වාගෙන ගිය අතර උද්ධමනය හා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ද පහළ මට්ටමක පවත්වාගෙන යන ලදී. අයහපත් කාලගුණ තත්ත්වයන් හා දියුණු ආර්ථික වල පසුබැස්ම මධ්‍යයේත් ශ්‍රී ලංකාවේ දල දේශීය නිෂ්පාදනය ප්‍රශංසනීය 7.3% ක වර්ධනයක් අත්පත් කර ගත්තේය.

වසර 2013 දී කොළඹ කොටස් වෙළෙඳපොළ ක්‍රමානුකූල වර්ධනයක් සටහන් කළේය. 2013 වසරේදී සියලු කොටස් මිල දර්ශකය 4.8 % කින්ද, S&P ශ්‍රී ලංකා 20 දර්ශකය 5.8% කින්ද, වර්ධනය විය. සියලු කොටස් මිල දර්ශකය ඒකක 5,912.8 ලෙසද S&P ශ්‍රී ලංකා 20 දර්ශකය ඒකක 3,263.9 ලෙසද වසර අවසානයේදී සටහන් විය. S&P ශ්‍රී ලංකා 20 දර්ශකය 2012 වසරේදී ආරම්භ කර අතර 2012 වසරේදී සියලු කොටස් මිල දර්ශකය 7.1% කින් පහළ වැටිණි.

2013 වර්ෂය අවසානයේ කොළඹ කොටස් වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 2,459.9 වූ අතර 2012 වසර අවසානයේදී පැවැති වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 2,167 ක් වූ අතර 2013 වසර අවසානයේ අගය හා සසඳන විට එය 13.4% ක වර්ධනයකි.

වාර්ෂික සමස්ත වෙළෙඳපොළ  පිරිවැටුම රුපියල් බිලියන 200.4 ක් වූ අතර දෛනික සාමාන්‍ය පිරිවැටුම රුපියල් මිලියන 828.4 ක් විය. සමස්ත පිරිවැටුමෙන් 36.1% ක දායකත්වය ලබාදී තිබුණේ විදේශීය ආයෝජකයන් වන අතර දේශීය සහභාගිත්වය 63.9 % ක් විය. 2012 වසරේදී සමස්ත පිරිවැටුමට විදේශ සහ දේශීය ආයෝජකයන්ගේ දායකත්වය පිළිවෙලින් 24.9% හා 75.1% ක් විය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙළෙඳපොළ සහභාගිකරුවන් විසින් ගන්නා ලද උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස විදේශ ආයෝජකයන්ගේ සහභාගිත්වයේ වර්ධනයක් අත්පත් කර ගැනීමට හැකි විය.

**“නියාමන භූමිකාව තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි නව පනත සඳහා යෝජිත සංශෝධිත කිරීම් දැනට අවසන් කර ඇති අතර එය කැබිනට් අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීමට ප්‍රථම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ විශේෂ කමිටුවක් මගින් නැවත විමර්ශනයක් කරමින් පවතී.”**

ධම්මික පෙරේරා
ආයතන ප්‍රධානී/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

# ආයතන ප්‍රධානිගේ සමාලෝචනය

2013 වසරේ දී විදේශ ආයෝජකයන් ශුද්ධ ගැණුම්කරුවන් වූ අතර ශුද්ධ මිලදී ගැනීම් රුපියල් බිලියන 33.9 ක් විය. (රුපියල් බිලියන 22.7 ක් ද්විතියික වෙළෙඳපොළෙන්ද රුපියල් බිලියන 11.1 ක් ප්‍රාථමික වෙළෙඳපොළෙන්ද වාර්තා විය.) මෙය ගණනය කිරීමට සාංගමික ණයකර වල ශුද්ධ විදේශ ගලා ඒම් ඇතුළත් කර නොමැත.

2013 වසරේදී ප්‍රාථමික වෙළෙඳපොළෙන් රැස්කර ගත් අරමුදල් ප්‍රමාණය රුපියල් බිලියන 119.4 ක්වූ අතර එය වසරක සටහන් කළ වැඩිම අගයයි. ණයකර මූලික ප්‍රසිද්ධ නිකුතුන් 28 කින් වාර්තාගත රුපියල් බිලියන 68.2 ක් රැස්කර ගැනීමට හැකිවිය. ලැයිස්තුගත සමාගම්වල ණයකරවලට අදාළ 10% රඳවා ගැනීමේ බදු සහ පොලී මත වන ආදායම් බදු නිදහස් කරන ලද අතර මෙම දීමනාව සැලකිය යුතු ලෙස ණයකර වෙළෙඳපොළේ වර්ධනයට බලපාන ලදී. ද්විතීයික ණයකර වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සලකා බලන විට සමස්ත පිරිවැටුම රුපියල් බිලියන 2.2 ක් ලෙස වාර්තා වූ අතර 2012 වසරේදී මුළු පිරිවැටුම රුපියල් මිලියන 75.1 ක් විය. මෙය සැලකිය යුතු වර්ධනයකි.

ආසියානු කලාපයේ කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය හා සසඳන විට කොළඹ කොටස් වෙළෙඳපොළට 5 වැනි ස්ථානය හිමි විය. කොළඹ කොටස් වෙළෙඳපොළට ඉදිරියෙන් සිටි වෙළෙඳපොළවල් සලකා බලන විට කරච්චි 56% ක වර්ධනයක්ද, වියට්නාමය 22% ක, මැලේසියාවේ බර්සා කොටස් වෙළෙඳපොළ 12.4% කින්ද, තායිවානය 11.8% ක වර්ධනයක් ද වාර්තා කළේය. ඉන්දියාවේ ජාතික කොටස් වෙළෙඳපොළ 3.6% කින්ද බොම්බායේ කොටස් වෙළෙඳපොළ 3.3% කින්ද, හොංකොං 2.9% කින්ද, වර්ධනය වූ අතර කොළඹ කොටස් වෙළෙඳපොළ මෙම වෙළෙඳපොළවල් තුන හා සසඳන විට ඉදිරියෙන් සිටියේය.

වෙළෙඳපොළ ඇගයීමේ මූලධර්ම සැලකීමේදී කොළඹ කොටස් වෙළෙඳපොළ කොටස් වෙළෙඳපොළවල් හා සම මට්ටමක පැවතිනි. 2013 මිල ඉපැයීමේ අනුපාතය 15.9 ක් වූ අතර එය 2012 වසර හා සසඳන විට නොවෙනස්ව පැවතිනි. 2013 දී මිල පොත් අගය අනුපාතය 2.0 ක් වූ අතර 2012 දී පැවති 2.1 හා බලන විට සුළු අඩුවීමකි. ලාභාංශ ඵලදාව 2012 දී 2.4% ක් වූ අතර 2013 දී එය 2.9% ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වුවත් ඉදිරි මිල ඉපයුම් අනුපාතය 12.5 ලෙස රොයිටර් තොරතුරු අනුව වාර්තා විය.

ජාතික අයවැය මගින් විදේශීය ආයෝජකයන්ට සහ විදේශවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඒකකභාරවල ආයෝජනය කිරීමේ ක්‍රියාවලිය වඩාත් පහසු කළ අතර ඒකක භාර සමාගම් වල ලාභ සහ ආදායම් මත පනවන බද්ද 10 % ක් දක්වා අඩු කරන ලදී. මෙම අනුග්‍රහයන් සහ වෙළෙඳපොළ පාර්ශ්වකරුවන් විසින් ගත් උත්සාහයන් හේතුවෙන් 2013 වසරේදී ඒකකභාර කර්මාන්තය තුළ සැළකිය යුතු වර්ධනයක් දැක ගැනීමට හැකිවිය. 2013 දෙසැම්බර් 31 වන දිනට ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 54 ක් වූ අතර එය පසුගිය වසරේදී රුපියල් බිලියන 31 ක් විය. මෙය 75% ක වර්ධනයකි. මීට අමතරව ඒකකභාර අරමුදල්වල ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ඒකීය තක්සේරු ක්‍රමයන් යොදාගැනීම අනිවාර්ය කරමින් කොමිෂන් සභාව ඒකක භාර කළමනාකරණ සමාගම් හා භාරකරුවන් වෙත විධානයක් නිකුත් කරන ලදී.

2013 වර්ෂය ඉතා වැදගත් සිද්ධීන් රාශියකින් සංයුක්ත විය. ණයකර ගනුදෙනු කාර්යක්ෂම කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ සහ කොමිෂන් සභාව එක්ව වෙළෙඳපොළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස ස්වයංක්‍රීය ගනුදෙනු පද්ධතියේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගත්තේය. තවද රජයේ ණයකර වල ගනුදෙනු කරන ප්‍රාථමික වෙළෙන්දන්හට සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ තුළ වෙළෙඳාමේ නියැලීමට අවස්ථාව දීම පිණිස ලැයිස්තුගත රීතීන් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැගී එන ආර්ථිකයක් බවට පත් කිරීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ අඛණ්ඩව වැදගත් මෙහෙවරක් ඉටු කරයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළේ සාධාරණත්වය සහ පාරදෘශ්‍යභාවය රැක ගැනීම පිණිස වෙළෙඳපොළ නියාමනය කරන නමුත් වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීමටද පහසුකම් සැපයිය යුතු වේ. මෙම පසුතලයේදී කොමිෂන් සභාව වසර 3 ක උපායශීලි ක්‍රියාමාර්ග සැලැස්මක් 2012 ඔක්තෝබර් මස හඳුන්වා දෙන ලදී.මෙම සැලැස්මට අදාළ වැදගත් උපායමාර්ග කීපයක්ම 2013 වසරේදී දියත් කළේය. මෙම සැලැස්මේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ වෙළෙඳපොළ නියාමනය, ආයෝජක ආරක්ෂාව, වෙළෙඳපොළ ප්‍රවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, මූල්‍ය සාක්ෂරතාව දියුණු කිරීම සහ අවදානම් කළමනාකරණයයි. මෙම සැලැස්ම

2013 වසරේදී ක්‍රියාවට නැංවීමට හැකි වූ අතර සතුටුදායක ප්‍රගතියක් දැකගත හැකි විය. මෙම සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා බොහොමයක් වෙළෙඳපොළ පාර්ශ්වකරුවන් දායක විය. (සංඛ්‍යා සටහන 01)

සංඛ්‍යා සටහන *01:* ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලික ව්‍යාපෘති 10

- කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහිකරණය
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය
- අවදානම් කළමනාකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම, ගෙවුම් කළ පසු සේවා සැපයීම ක්‍රමය (DVP) හා මධ්‍යම පාතිපාර්ශවීය ආයතන ක්‍රමයක් ස්ථාපිත කිරීම.
- සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය
- නව ගණුදෙනු උපකරණ හඳුන්වාදීම.
- ඒකක භාර කර්මාන්තය සංවර්ධනය කිරීම
- අධ්‍යාපනය හා දැනුවත් භාවය ඉහල නැංවීම
- නව සමාගම් ලැයිස්තුගත කිරීම් (රාජ්‍ය අංශය හා පෞද්ගලික)
- නව අරමුදල් ආකර්ෂණය (දේශීය හා විදේශීය)
- යටිතල පහසුකම් සංවර්ධනය - කොටස් තැරැව්කරුවන්ගේ කාර්යාලීය අභ්‍යන්තර පද්ධති

නියාමන භූමිකාව තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි නව පනත සඳහා යෝජිත සංශෝධිත කිරීම් දැනට අවසන් කර ඇති අතර එය කැබිනට් අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීමට ප්‍රථම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ විශේෂ කමිටුවක් මගින් නැවත විමර්ශනයක් කරමින් පවතී. ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම නීතිමය රාමුවක් තුළින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ඵලදායිතාවය හා ආකර්ෂණීයත්ව උසස් කළ හැකි අතරම නිෂ්පාදිත පරාසයද පුළුල් කළ හැකිය.

වර්තමානයේදී සාමාජික හිමිකාරිත්වයක් ඇති ලාභ අරමුණු කර නොගත් ඇපයෙන් සීමිත සමාගමක් වන කොළඹ කොටස් හුවමාරුව, ලාභ අරමුණු කරගත් කොටස් හිමියන් සහිත සමාගමක් බවට පරිවර්තනය කිරීම නැතහොත් කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය සඳහා ද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට කැබිනට් අනුමැතිය ලැබී ඇත. අසාමූහීකරණය තුළින් කොටස් හුවමාරුවේ අයිතිය, කළමනාකරණය හා ගනුදෙනු හිමිකම එකිනෙකට වෙන්ව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

පද්ධතිවල ගනුදෙනු අවදානම කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අදාළ පාර්ශවකරුවන් සමග සහයෝගීව තත්කාලීන හිමිකම් ගනුදෙනු පැවරුම් එදිරිව ගෙවීම් (DVP) සඳහා විශේෂාංග ඇතුළත් කොට ආකෘතියක් ගොඩනගන ලදී. තවදුරටත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මහ බැංකුව හා කොළඹ කොටස් හුවමාරුව සමග ඒකාබද්ධව ඵලදායීව අවදානම් කළමනාකරණය කිරීම සඳහා සංකලිත මධ්‍යම ප්‍රතිපාර්ශවීය පද්ධතියක් සකස් කිරීම ආරම්භ කර ඇත. මධ්‍යම ප්‍රතිපාර්ශවීකරණ පද්ධතියක් (CCP) හා පැවරුම් එදිරිව ගෙවීම් පියවීම්කරණය (DVP) තුළින් ගැණුම්කරුගේ හා විකුණුම්කරුගේ ප්‍රතිපාර්ශවීය නිරාවරණය කිරීම සැලකිය යුතු අන්දමින් අඩුකිරීමට අපේක්ෂා කරනු ලැබේ.

වසර 2013 දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොල සංවර්ධනය සඳහාත් ඉහළ ක්‍රියාකාරිත්වයකින් දායක වන ලදී. එසේම වෙළෙඳපොළට අවතීර්ණවීම සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා නව අර මුදල් කළමණාකරුවන්ට පෙන්වා දීමට ද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ක්‍රියාකාරීව දායක වන ලදී. ඒ තුළ කොළඹ කොටස් හුවමාරුව සමග ඒකාබද්ධව මුම්බායි, හොංකොං හා ඩුබායි යන අන්තර් ජාතික වැඩමුළු ඉතා සාර්ථකව පවත්වන ලදී. දේශීය වශයෙන් උතුරු හා මධ්‍යම පළාත්වල ව්‍යාපාරික ප්‍රජාව උදෙසා ලැයිස්තුගත කිරීම් ප්‍රවර්ධන වැඩමුළු පැවැත්වූ අතර ඒ තුළින්
ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා අරමුදල් සම්පාදනය කරගනිමින් ව්‍යාපාර පුළුල් කරන ආකාරය පිළිබඳ දැනුවත් භාවයන් ඒ ප්‍රදේශවල ව්‍යවසායකයන්ට ලබාදෙන ලදී.

ඊට අමතරව 2014 අයවැය යෝජනා මගින් කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත වන සමාගම් සඳහා වසර 03 ක් සඳහා 50%ක් ආදායම් බදු අඩුකිරීමක සහනය ද ලබාදෙන ලදී.

# ආයතන ප්‍රධානිගේ සමාලෝචනය

ද්විතීයක වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාවය ඉහළ නැංවීම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදෙන කර්තව්‍යයක් වන අතර ඒ සඳහා ආයෝජකයින් ආරක්ෂාවන අන්දමට හා වෙළෙඳපොළ සාධාරණභාවය ආරක්ෂාවන අන්දමින් සංශෝධන ඇතුළත් කොට සමාගම් ලැයිස්තුගත කිරීමේ ක්‍රමවේදයක් වන "හඳුන්වාදීමේ" (Introduction) ක්‍රමය නැවත ස්ථාපිත කරන ලදී. එසේම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම් සඳහා අනිවාර්ය අවම මහජන පංගුවක්ද හඳුන්වාදෙන ලදී. එය අන්තර්ජාතික හා කලාපීය වෙළෙඳපොළ විශාල ප්‍රමාණයක දක්නට ලැබෙන ප්‍රමිතීන් වලට අනුගතවීමක් ලෙස විශ්ලේෂණය කර හැක. ඒ තුළින් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ඉහළ නැංවීම හා හොඳ මිල ආවරණ ක්‍රම වේදයකට පහසුකම් සැපයුමද අපේක්ෂා කරයි.

වර්ෂය තුළදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම්වල සාංගමික යහපාලනය ශක්තිමත් කිරීමට හා තවදුරටත් කොටස් හිමියන්ගේ සුළුතරය ආරක්ෂා කිරීම සඳහා සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සඳහා යහපුරුදු සංග්‍රහයන්ද හඳුන්වා දෙන ලදී. තවද වෙළෙඳපොළ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂකවරු හා ප්‍රධාන විධායක නිලධාරීන් සිදුකරන කොටස් ගනුදෙනු තොරතුරු වෙළෙඳපොළට අනාවරණය කිරීම සම්බන්ධව නියෝගයන්ද නිකුත් කරන ලදී.

විවිධ පාර්ශවයන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩමුළු විශාල ප්‍රමාණයක්ද වසර තුළ සංවිධානය කරනු ලැබීය. එම වැඩසටහන් පාසල් සිසුන්, විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්, වෘත්තිය සංවිධානවල සාමාජිකයින්, මාධ්‍ය හා පොදු ජනතාව මූලික කරගත් වැඩමුළු වූ අතර දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා අවශ්‍ය දැනුම එම පාර්ශව කරුවන්ට ලබාදීමට හැකියාව ලැබෙන පරිදි එම වැඩමුළු සකස් කර ඇත.

2013 වර්ෂයේදී වෘත්තිය ප්‍රමිති පවත්වා ගැනීම සඳහා වෙළෙඳපොළ වෘත්තිකයන්ගේ සුදුසුකම් ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සුදුසුකම් රාමුවක් පිහිටුවා ඇත.

2013 වර්ෂයේදී ප්‍රාග්ධන වෙළෙඳපොළේ ධනාත්මක වර්ධනයන් සමග ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාවට හා අඛණ්ඩ වෘත්තිය වැඩසටහන් වලට සහභාගි වූ පිරිස පෙර වර්ෂයට සාපේක්ෂව විශාල වර්ධනයක් දක්නට ලැබුණු අතර ඉන් බහුතරයක් ප්‍රාග්ධන වෙළෙඳපොළ රැකියා අවස්ථා අපේක්ෂා කරන අය වේ.


සුරැකුම්පත් නියාමකයින් අතර දැනුම ඵලදායි ලෙස හුවමාරු කරගැනීමට හා සහයෝගීතාවය ශක්තිමත් කිරීමට මෙන්ම නියාමක ගැටලු සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, සුරැකුම්පත් නියාමකයින්ගේ ජාත්‍යන්තර සංවිධාන (IOSCO) සහ ආසියා පැසිෆික් ආර්ථික සහයෝගිතා මූල්‍ය නියාමකයින් පුහුණු අංශය (APEC, FRTI). ආසියා සංවර්ධන බැංකුව සමග ඒකාබද්ධවී විවිධ රටවල නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථක වැඩමුළු 2ක් කොළඹදී පවත්වන ලදී. එම ක්‍රියාමාර්ගය තුළින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට කලාපීය සහයෝගීතාවය වර්ධනය කර ගැනීමට විශාල ශක්තියක් ලැබී ඇත.

අඛණ්ඩව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි සේවක මණ්ඩලයෙහි පුහුණුව හා සංවර්ධනය උදෙසා විශාල අවධානයක් යොමුකර ඇති අතර ඒ තුළින් ඔවුන්ගේ රාජකාරී ඵලදායිව හා කාර්යක්ෂමව ඉෂ්ඨ කිරීමට විශාල රුකුලක් ලැබේ. මෙහිදී සේවකයන්ගේ දැනුම හා දක්ෂතාවය සංවර්ධනය සඳහා දේශීය හා අන්තර්ජාතික පුහුණු අවස්ථා උදාකර දී ඇත.

උපායශීලි ක්‍රියාමාර්ග සැලසුම පිහිටුවීම මෙන්ම අනෙකුත් ඉතා වැදගත් පියවරයන් තුළින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ ස්ථායිතාවය ආරක්ෂා කරගෙන ඇත. ඊට අමතරව එම ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන් සඳහා උපකාර වන සාධාරණ හා කාර්යක්ෂම වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට උපකාර වනු ඇත.

අවසාන වශයෙන් මෙම ප්‍රගතිය කරා ළඟාවීමට උපකාරී වූ හා මාර්ගෝපදේශකත්වය සැපයූ සභාපතිතුමා ඇතුළු

කොමිෂන් සභා සාමාජිකවරුන්ට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි. තවද භාණ්ඩාගාර ලේකම් තුමාට ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රවර්ධනයට ලබාදුන් මඟපෙන්වීමට මම කෘතඥ වෙමි. තව දුරටත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාමාර්ග සඳහා උපකාරි වූ සියළුම පාර්ශවකරුවන්ට ද මාගේ කෘතඥ පුද කරමි. එසේම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවක මණ්ඩලය, ඔවුන් දැනුමෙන් හා වෘත්තීය නිපුණතාවය තුළින් කළ මෙහෙය හා දායකත්වය සඳහා ප්‍රසාදය පළකිරීමට කැමැත්තෙමි. සාමුහික පරිශ්‍රමයන් හා දායකත්වයන් තුළින් ශක්තිමත් හා කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළක් පවත්වා ගැනීම සඳහාත් රටේ ආර්ථික අභිවෘද්ධිය සඳහා දායක වීමටත් අප හට ශක්තිය ලැබූ බව සහතිකය.



ධම්මික පෙරේරා
ආයතන ප්‍රධානි / නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

2014 මැයි 20

# කොමිෂන් සභා සාමාජිකයන්

වමේ සිට: ආචාර්ය නාලක ගොඩහේවා (සභාපති), ලෝලිත අබේසිංහ මහතා, මොහමඩ් සුරයිෂ් හිෆාස් හෂීම් මහතා, ඩී. ඩී. ඩබ්. ආනන්ද ද සිල්වා මහතා,



වමේ සිට:  ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා, ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා, ආචාර්ය බී. එම්. එස්. බටගොඩ, ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා, අර්ජුන හේරත් මහතා



# කොමිෂන් සභා සාමාජිකයන්

## ආචාර්ය නාලක ගොඩහේවා

ආචාර්ය නාලක ගොඩහේවා මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වර්තමාන සභාපති වරයා වේ. ඔහු මීට පෙර ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති ධුරය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂක ධුරයද දරා ඇත.

එකිනෙකට වෙනස් වූ අධ්‍යාපනික ක්ෂේත්‍ර 03 කින් අධ්‍යාපනික සුදුසුකම් සපුරා ඇති ආචාර්ය නාලක ගොඩහේවා මහතාට මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හා දකුණු ඕස්ට්‍රේලියා විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියක්ද ලබාගෙන ඇත. එසේම, වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හා එංගලන්තයේ වරලත් අලෙවිකරණය පිළිබඳ ආයතනයේ සාමාජිකයකු ද වේ.

## ලෝලිත අබේසිංහ මහතා

ලෝලිත අබේසිංහ මහතා වෘත්තීය ව්‍යාපාර උපදේශකයකු වන අතර වෙලීනා කැපිටල් කෝපරේෂන් (පුද්) සමාගම යන නාමය යටතේ විවිධ ආකෘති (රාජ්‍ය හා පෞද්ගලික) උපයෝගි කරගනිමින් ව්‍යාපෘති කළමනාකරණයට ප්‍රමුඛතාවය ලබාදෙමින් උපදේශක ආයතනයක් පවත්වාගෙන යයි. තවද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වින්ග්‍රොව්ස් බිස්නස් සොලුෂන්ස් පෞද්ගලික සමාගම, චීන විද්‍යා තාක්ෂණ ජාත්‍යන්තර සැපයුම් සහයෝගිතා ලංකා සමාගම, වෙලීනා නැෂනල් ඉංජිනියරින් බියුරො ඔෆ් ඩුබායි ලංකා ලිමිටඩ් සමාගම්වල කළමනාකාර අධ්‍යක්ෂවරයා වේ.

ලෝලිත අබේසිංහා මහතා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයාගේ උපදේශකවරයෙකු ලෙසද කටයුතු කරයි. එසේ රාජ්‍ය ප්‍රවාහන අමාත්‍යවරයාගේ කළමනාකරණ උපදේශන ලෙසත්, ජාතික හස්ත කර්මාන්ත මණ්ඩලයේ සභාපතිවරයාගේ උපදේශක ලෙසත් කටයුතු කරයි.

ඔහු එක්සත් ජනපදයේ ටොරොන්ටෝ මධ්‍යස්ථානයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියකු හා ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකුද වේ. එසේම ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත සම්මේලනයේ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සහතික පත්‍ර ලාභියෙකු මෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ උසස් මෙහෙයුම් ක්‍රම පිළිබඳ සහතික පත්‍ර ලාභියෙක්ද වේ. මේ වන විට ඔහු ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ හදාරමින් සිටී

බහු ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කර ඇත.

ලෝලිත අබේසිංහ මහතා ෆෝ සීසන්ස් හොස්පිට්ල්ස් (පෞද්) සමාගම, කැන්ටන් එනර්ජී (පෞද්) සමාගම, AGSS ඉන්ටර්නැෂනල් කන්සල්ටන්ස් (පෞද්) සමාගම, නොබෙල් ගේම් ලිමිටඩ්, SLN පැකේජින් ඉන්ඩස්ට්‍රීස් (පෞද්) සමාගම, මැනේජ්මන්ට් එඩියුකේෂන් ඩිවලොප්මන්ට් ඒජන්සී, මෙඩි ස්මාර්ට් /UAK සප්ලයර්ස්, ඉම්පැක්ට් ඉන්ටර්නැෂනල් කන්සල්ටන්ට්ස් (පෞද්) සමාගම, නොබෙල් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම, ෆෝකස් ඉන්ටනැෂනල් (පෞද්) සමාගම, සැරිරෝ ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම, ඉවෝක් ප්‍රොජෙක්ට්ස් (පෞද්) සමාගම, වොක්ෂෝල් කෝපරේෂන් (පෞද්) සමාගම, ලංකා ලයිට් ඉන්ඩස්ට්‍රියල් ප්‍රොඩක්ට්ස් ඉම්පෝර්ට් / එක්ස්පෝර්ට් (පෞද්) සමාගම, හයිබ්‍රිඩ් ස්ට්‍රක්චර්ස් ලංකා (පෞද්) සමාගම, ලංකා ග්‍රීන් එනර්ජී (පෞද්) සමාගම, අකාමායි කමියුනිකේෂන් කම්පනි(පෞද්) සමාගම, SAR එම්බෙලිෂ්මන්ට් (පෞද්) සමාගම, ඇරාඩේස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම සහ මෙගා පුත්‍ර (පෞද්) සමාගම යන ව්‍යාපාර වල අධ්‍යක්ෂවරයෙකු /උපදේශකයකු වශයෙන් කටයුතු කර හෝ කරමින් සිටි.

ලෝලිත අබේසිංහ මහතා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා, / වැඩමුළු හා සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයකට සහභාගි වී ඇත. එමෙන්ම ඔහු ජාත්‍යන්තර සම්මන්ත්‍රණ කිහිපයකට ලිපි පළ කර ඇත.

## මොහමඩ් සුරයිෂ් හිෆාස් හෂීම් මහතා

මොහොමඩ් හිෆාෂ් හෂීම් මහතා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරියෙකු මෙන්ම මිඩ්ල් ටෙම්පල් හි අධිනීතිඥයකු ද වේ. ඔහු මැල්ෂිෆ් සමාගම් සමූහයේ, ඩිවලොප්මන්ට් ඉන්ටර්ප්ලෑන් සිලෝන් ලිමිටඩ් හා කෙරී මැල්ෂිෆ් ලොජිස්ටික්ස් ලංකා පුද්ගලික සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂවරයකු ද වේ. ඔහු ශ්‍රී ලංකා එළවළු හා පළතුරු නිෂ්පාදන, සැකසීමේ හා අපනයන සංගමයේ මහ ලේකම්වරයා ද වේ. ඔහු ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විවිධ දේශීය හා විදේශීය ව්‍යාපාරික සමුළු ගණනාවකට ද සහභාගී වී ඇත.

## බී. ඩී. ඩබ්. ආනන්ද සිල්වා මහතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවුරුදු 31 ක් සේවය කර ඇති බී. ඩී. ඩබ්. ආනන්ද සිල්වා මහතා එහි සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, ආර්ථික සමීක්ෂණ හා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි දෙපාර්තමේන්තුවල සේවය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කළ අවුරුදු 30 තුළ මූල්‍ය ප්‍රතිපත්ති, බැංකු අධීක්ෂණ, මූල්‍ය පද්ධති ස්ථායීකරණය, විනිමය අනුපාත ප්‍රතිපත්ති, විදේශ වෙළෙඳාම සහ ගෙවුම් ශේෂය වැනි ක්ෂේත්‍රවල මනා පළපුරුද්දක් ලබා ඇත.

ආනන්ද සිල්වා මහතා යාපනය විශ්වවිද්‍යාලයේ පළමු පංතියේ විද්‍යාවේදී උපාධියක්ද, ඇමරිකා එක්සත් ජනපදයේ ආයෝවා විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක්ද, ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයිස් විශ්වවිද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක්ද හිමිකර ගෙන ඇත. එසේම ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙසද කටයුතු කරන අතර ශ්‍රී ලංකා මහ බැංකුව මෙහෙයවන ඉහල මට්ටමේ පාඨමාලා බොහොමයකට සම්පත් දායකත්වය සපයනු ලැබේ.

වර්තමානයේදී ආනන්ද සිල්වා මහතා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපති ධූරය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සභාපතිධූරය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකධූරයද, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සාමාජික ධූරයද, අපි වෙනුවෙන් අපි අරමුදලේ අධ්‍යක්ෂක ධූරයද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ තත්ත්ව සහතික මණ්ඩලයේ සාමාජික ධූරයද සහ සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් සමාගමේ අධ්‍යක්ෂ ධූරයද දරනු ලැබේ. එසේම ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රතිසම්පාදක කමිටු සාමාජිකත්වයද දරනු ලැබේ.

## ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා

ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා 1993 වසරේදී කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී දෙවන පෙළ ගෞරව උපාධියක් ලබා ඇති අතර 1994 දී ශ්‍රී ලංකා නීති විද්‍යාලය මෙහෙය වූ අවසාන විභාගයෙන් පළමු ගෞරව උපාධියක් සහිතව නීතිඥයෙකු ලෙස සුදුසුකම් ලබන ලදී. 1993 වර්ෂයේදී නීති පීඨය සංවිධානය කළ ජූරි සභා විවාදයකට සහභාගි වී රන් පදක්කමක් හිමිකරගෙන ඇති අතර ඔහු නීති විද්‍යාල විවාද කණ්ඩායමේ නායකයා ලෙසද කටයුතු කර ඇත. ප්‍රතිභා මහානාමහේවා මහතා 2000 වර්ෂයේදී ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයෙන් නීතිපති ගෞරව උපාධියත්, 2005 වර්ෂයේදී ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ T C බර්නි නීති විද්‍යාලයෙන් නීතිය පිළිබඳ ආචාර්ය උපාධියක් හිමිකරගෙන ඇත. 2002/2005 කාලය තුළ ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙහි T C බර්නි නීති විද්‍යාලයේ තුලනාත්මක නීති මධ්‍යස්ථානයේ පර්යේෂණ පිළිබඳ ආදී ශිෂ්‍යයෙකු ද විය. ඔහු 2003 වර්ෂයේදී අන්තර්ජාතික නීති සංගමයෙන් පිරිනැමෙන දක්ෂතම තරුණ නීතිඥයාට හිමි සම්මානයක්ද හිමිකර ගෙන ඇත.

තම අධ්‍යාපන වෘත්තිය කටයුතු ආරම්භ කළේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙසය. පසුව නීති පීඨයේ ස්ථිර අධ්‍යාපන කාර්යමණ්ඩලය සඳහා තෝරා ගැණුනු අතර ඊට පසුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු දක්වා උසස්වීමක් ලබා ඇත. ඔහු වර්තමානයේදී කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති තනතුර ද හොබවයි. තවද ඒ මහතා කටාන ශ්‍රී ලංකා පොලිස් පුහුණු පීඨයේ, ත්‍රිකුණාමලය නාවික හමුදා පුහුණු පීඨයේ, කළුතර ශ්‍රී ලංකා පොලිස් පුහුණු විද්‍යාලයේ, කටුකුරුන්ද විශේෂ කාර්ය බළකා පුහුණු මධ්‍යස්ථානයේ, නේපාලයේ ට්‍රිබුවාන් විශ්වවිද්‍යාලයේ (ශාස්ත්‍රපති උපාධිය), මානව හිමිකම් නීති පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කරයි. තවද ඒ මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා හා ඉංජිනේරු අංශය මෙහෙයවන, විද්‍යාපති උපාධි පාඨමාලා සඳහාත්, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේත්, ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනයේ නීතිය පිළිබඳ ඉගැන්වීම් කටයුතුවල නිරතව සිටී. ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨයේ හා කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන පීඨවල උසස් පාඨමාලා නිබන්ධන අධීක්ෂකයෙකු ලෙසට කටයුතු කරයි. එසේම කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ව්‍යාපෘති වාර්තා අධීක්ෂකවරයෙක් ලෙසත්, බරණැස හින්දු විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි නිබන්ධන අධීක්ෂණ තනතුරක්ද හොබවනු ලබයි. ප්‍රතිභා මහානාමහේවා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයා ලෙසද කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකා පොලිස් පුහුණු පීඨයේ අධ්‍යාපන හවුලේ සාමාජිකත්වය, මානව සම්පත් සංවර්ධන ආයතනයේ වෙළෙඳාම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ උපදේශක මණ්ඩල සාමාජිකයකු, කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ මණ්ඩල සාමාජිකයකු, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ සහ ශ්‍රී ලංකා නීතිඥ සභාවේ සාමාජිකයකු මෙන්ම ශ්‍රී ලංකා නීතිඥ

# කොමිෂන් සභා සාමාජිකයන්

සභාවේ තොරතුරු තාක්ෂණ කමිටුවේ හිටපු සභාපතිවරයාද වේ. තවද මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා හා ඉංජිනේරු අංශයේ, ජාත්‍යන්තර නීතිඥ සභාවේ (එක්සත් රාජධානිය) සහ ඕස්ට්‍රේලියාවේ නීති ආචාර්යවරුන්ගේ සංගමයේ උපදේශන මණ්ඩලයේ සාමාජිකයකුද වේ.

ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා  මෑතකදී ව්‍යාපෘති 2 ක් සම්පූර්ණ කළ ඒවා නම් දුරකථන මධ්‍යස්ථාන සේවක අධීක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් කළ සමීක්ෂණය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය වෙනුවෙන් කළ ඉලෙක්ට්‍රොනික් නීති සමීක්ෂණයයි.

ඔහුට පර්යේෂණ ප්‍රදාන කිහිපයක්ද ලැබී ඇත. ඒවා අතර 2008 ජාතික විද්‍යා පදක්කමේ ප්‍රදානය, දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2007/2008 පර්යේෂණ ප්‍රදානය, 2002/2005 ලෝක බැංකු ආචාර්ය උපාධි පර්යේෂණ ප්‍රදානය, 2004 වසරේ පෝලන්තයේ පැවැති ලෝක දන්ත ආරක්ෂණ කොමසාරිස්වරුන්ගේ සමුළුව සඳහා ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයෙන් පිරිනැමෙන සංචාරක ප්‍රදානය, 2002 වසරේ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත උපාධි සඳහා පිරිනැමෙන පර්යේෂණ ප්‍රදානය හා 2004 අනාගත පර්යේෂකයින් සඳහා පිරිනැමෙන ඕස්ට්‍රේලියානු පර්යේෂණ සභා ප්‍රදානය ප්‍රධාන තැනක් ගනී.

ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා නීති ක්ෂේත්‍රය වෙනුවෙන් දක්වන ලද විශේෂඥායකත්වය වෙනුවෙන් 2000 වර්ෂයේදී ප්‍රංශයේ මානව හිමිකම් ශිෂ්‍යත්ව පිළිබඳ ජාත්‍යන්තර ආයාතනයෙන් ප්‍රදානයක්ද 2003 වර්ෂයේද සැන්ෆ්‍රැන්සිස්කෝහි ජාත්‍යන්තර නීතිඥ සංගමයේ තරුණ නීතිඥයන් සඳහා පිරිනැමෙන ප්‍රදානය හා  2004 වසරේ එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ ඉලෙක්ට්‍රොනික් පෞද්ගලික තොරතුරු මධ්‍යස්ථානයෙන් පිරිනැමෙන පෞද්ගලිකත්වයේ නව යුගය යන සංචාරක ප්‍රදානයටද හිමිකම් කියන ලදී.

## පී. ඩී. ජේ. ප්‍රනාන්දු මහතා

බැංකු ක්ෂේත්‍රය තුළ වසර 35 කට වැඩි පළපුරුද්දක් ඇති අයෙකි. තවද විවිධ හැකියාවන් පෙන්වමින් ජ්‍යෙෂ්ඨ තනතුරුවලද ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු කර ඇත. 2010/2011 කාලය තුළ මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය දරා ඇති ප්‍රනාන්දු මහතා මුල්‍ය ක්‍රම ස්ථායිතාවය පිළිබඳ හා සාංගමික සේවා පර්ෂදයේ  ප්‍රධානියා වශයෙන් කටයුතු කර ඇත. පී. ඩී. ජේ. ප්‍රනාන්දු මහතා  බැංකු හා මුල්‍ය ක්ෂේත්‍ර නියාමනය, උපාය මාර්ගික සැලසුම්කරණය හා කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, ජාතික ගිණුම් හා සංඛ්‍යාලේඛන, ජාතික ගෙවුම් හා බේරුම්කරණ යන අංශයන්හි විශේෂඥ දැනුමක් හා ඒ පිළිබඳ ප්‍රවීණයෙකු ද වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු කළ කාලය තුළ මුල්‍ය ස්ථායිතා කමිටුවේ සභාපති මුල්‍ය ප්‍රතිපත්ති කමිටු සාමාජික, අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජික හා ජාතික ගෙවුම් කවුන්සිලයේ සභාපතිවරයා ලෙසද කටයුතු කර ඇත. 2011 වර්ෂයේදී මුල්‍යමය වශයෙන් දුෂ්කරතාවයට පත් ලියාපදිංචි මුල්‍ය සමාගම් 07 ක් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මහ බැංකුව විසින් පත්කළ නිලධාරි කණ්ඩායමේද පී. ඩී. ජේ. ප්‍රනාන්දු මහතා සාර්ථකව කටයුතු කර ඇත.

පී. ඩී. ජේ. ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය දැරූ කාලය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ හා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නිල බලයෙන් පත්වන සභා සාමාජිකත්වයද, ණය තොරතුරු කාර්යාංශයේ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සභාපති ධුරයද දරා ඇත. එසේම සේවක භාරකාර අරමුදලේ, ලංකා ක්ලියර් (පෞද්) සමාගම හා ලංකා මුල්‍ය සේවා කාර්යාංශයේ සාමාජික මණ්ඩල සාමාජිකත්වයද දරා ඇත.

මේ වන විට පී. ඩී. ජේ. ප්‍රනාන්දු මහතා  ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකධුරයට අමතරව යුනියන් බැංකුව. කොමර්ෂල් ෆිනෑන්ස් ඇන්ඩ් ලීසිං ලිමිටඩ්, කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්, තැප්‍රොබේන් හෝල්ඩිංග්ස් ලිමිටඩ්, හම්බාන පෙට්‍රො කෙමිකල් කම්පැනි ලිමිටඩ් ආයතනවල අධ්‍යක්ෂ ධුරය දරනු ලබයි.

ප්‍රනාන්දු මහතාගේ වෘත්තිය ගමන් මගෙහි ජාතික වශයෙන් වැදගත් වූ මූලික ව්‍යාපෘති ගණනාවකම මූලිකත්වය ගෙන කටයුතු කළ අතර ජාතික ගෙවුම් හා බේරුම්කරණය සම්බන්ධව ව්‍යාපෘතිය විශේෂයෙන් සඳහන් කළ හැකියි.

තවද ප්‍රනාන්දු මහතා විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජාතික මට්ටමේ කමිටු රාශියකකම නියෝජනය කළ අතර ශ්‍රී ලංකාව හා ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් විදේශීය සමුළු ගණනාවකට සහභාගි වී ඇත.

## ආචාර්ය බී. එම්. එස්. බටගොඩ

ආචාර්ය බී. එම්. එස්. බටගොඩ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. එක්සත් රාජධානියේ නැගෙනහිර ඇන්ග්ලියා විශ්වවිද්‍යාලයෙන් පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක්ද ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් රජයේ විශ්වවිද්‍යාලයෙන් සම්පත් ආර්ථික විද්‍යාව  පිළිබඳ විද්‍යාපති උපාධියක්ද හිමිකරගෙන ඇත. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිවේදියෙකු වන ආචාර්ය බටගොඩ මහතා ෆුල්බ්‍රයිට් මෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වලාභියෙකු වේ.

ආචාර්ය බටගොඩ මහතා ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු වේ. ඊට අමතරව සාර්ක් සංවර්ධන අරමුදල, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව,ලංකා ලිට්‍රෝ ගෑස්, ලංකා සීනි සමාගම, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා කාබන් අරමුදල, ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිෂන් සභාව එක්සත් ජනපද- ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිෂම, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වැනි ආයතන වල මණ්ඩල සාමාජිකත්වයද දරනු ලබයි.

අචාර්ය බී.එම්. එස්. බටගොඩ මහතා රටේ වැදගත් තනතුරු කිහිපයකම කටයුතු කරනු ලබයි. ඒවා අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ගෝලීය කටයුතු අධ්‍යක්ෂක ධුරයද, අතිගරු ජනාධිපතිතුමාගේ සහකාර ලේකම් ධුරයද ප්‍රධාන තැනක් ගනී.

ආචාර්ය බටගොඩ මහතා විසින් ඉතා වටිනා ග්‍රන්ථ කිහිපයක්ද රචනාකර ඇත. ඒවා නම් “ශ්‍රී ලංකාවේ පාරිසරික තත්වය” හා “ශ්‍රී ලංකාවේ කඩොලාන වනාන්නතරවල විකල්ප ප්‍රයෝජන පිළිබඳ ආර්ථික තක්සේරුව” නම් ග්‍රන්ථයි. තවද නාගරික වායු ගුණාත්වය කළමනාකරණය, ශ්‍රී ලංකාවේ පාරිසරික තක්සේරුව පිළිබඳ න්‍යායාත්මක අත්පොත හා ශ්‍රී ලංකාවේ වාහන හා ඉන්ධන පිළිබඳ පිස්කල් ප්‍රතිපත්ති ආදි ග්‍රන්ථවල සම කර්තෘවරයෙකු ද වේ.

## ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා

ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරියෙකි.
එමෙන්ම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබාගෙන ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා ලියාපදිංචි වී ඇත. ඔහු වෘත්තියෙන් නීතිඥයෙකි. සිරිවර්ධන මහතා 1988 දී සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට සමාගම් පරීක්ෂකවරයෙකු ලෙස සම්බන්ධ වූ අතර 2001 වර්ෂයේදී සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු ලෙස උසස් කරන ලදී. වර්තමානයේදී ඔහු වැඩබලන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන් කටයුතු කරනු ලැබේ. එසේම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිලබලයෙන් පත්වූ මණ්ඩල සාමාජිකයතු වේ.

## අර්ජුන හේරත් මහතා

අර්ජුන හේරත් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ සභාපති ධුරය දරන අතර අර්නස්ට් සහ යංග් ආයතනයේ හවුල් කරුවෙක් හා උපදේශන සේවා ප්‍රධානියා ලෙසද කටයුතු කරයි. එසේම දකුණු ආසියානු ගණකාධිකරුවන්ගේ සම්මේලනයේ උප සභාපති ධුරයද දරනු ලැබේ. ඔහු ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂක ධුරයක්ද දරයි. එසේම ඔහු ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ හා විගණන ප්‍රමිති කමිටුවේ සාමාජිකත්වයද දරයි. අර්ජුන හේරත් මහතා අන්තර්ජාතික ගණකාධිකරුවන්ගේ සම්මේලනයේ වෘත්තීය ගණකාධිකරණ සංවිධාන සංවර්ධන කමිටු සාමාජිකත්වයද දරනු ලබයි. ඔහු වරලත් ගණකාධිකරුවකු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධියක්ද, මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද ලබාගෙන ඇත. එමෙන්ම එක්සත් රාජධානිය ස්ට්‍රැක්ලයඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්ද හිමිකරගෙන ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය




ආයතන ප්‍රධානි/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්




අධ්‍යක්ෂ මුදල් සහ පරිපාලන




අධ්‍යක්ෂ අධීක්ෂණ කටයුතු




අධ්‍යක්ෂ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන කටයුතු




අධ්‍යක්ෂ ආවේක්ෂණ කටයුතු




අධ්‍යක්ෂ නීති සහ බලාත්මක කිරීම්




අධ්‍යක්ෂ විමර්ශන කටයුතු




අධ්‍යක්ෂ සාංගමික කටයුතු




අධ්‍යක්ෂ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන, පුහුණු සහ පර්යේෂණ කටයුතු




සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ කටයුතු




සහකාර අධ්‍යක්ෂ බාහිර සම්බන්ධතා සහ වෙළෙඳපොළ සංවර්ධන කටයුතු




සහකාර අධ්‍යක්ෂ සාංගමික කටයුතු




උපදේශක - විශේෂ ව්‍යාපෘති, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය





උපදේශක - විශේෂ ව්‍යාපෘති, ප්‍රාග්ධත වෙළෙඳපොළ සංවර්ධනය

# සාර්ව ආර්ථික විවරණය

ගෝලීය වශයෙන් ආර්ථික තත්වයන් සලකා බැලීමේදී 2013 වර්ෂයේදී ස්ථිර සාර්ව ආර්ථික මූලධර්ම ධනාත්මක හා සෘණාත්මක ආකාරයේ වෙනස්වීම් තරමක් දුරට මඟහරවා කටයුතු කරන ලදී. සංවර්ධිත හා නැගී එන ආර්ථිකවල පාරිභෝගික විශ්වාසනීයත්වය ඉහළ යාමත් සමග සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල හා වෙළෙඳ ශේෂයේ ධනාත්මක ප්‍රවණතාවයක් ඇති වී ඇත. 2013 වර්ෂය තුළ සුබවාදී වෙනස්වීම් තුළින් පැවති අපහසුතා මඟහැරීමත්, ගෝලීය මූල්‍ය ව්‍යාපාර වූ නියාමන රාමුව නැවත යාවත්කාලීන කොට සවිබල ගැන්වීමත් සිදුවිය. එසේම සම්මේලන මණ්ඩලයට අනුව 2013 වර්ෂය තුළදී උද්ධමනය ගැළපූ පසු ගෝලීය ආර්ථික වර්ධනය 2.9%ක් අපේක්ෂා කර ඇත.
(රූප සටහන 01)

රූප සටහන 01 : උද්ධමනය





එමෙන්ම 2013 වසර තුළ ආර්ථික අභියෝග වලින් හා භූ දේශපාලනික තත්වයන්ගෙන් සමන්විත විය. සිරියානු අර්බුදය හේතුවෙන් ගල්ෆ් සහයෝගිතා කවුන්සිලයේ ඛනිජ තෙල් නිෂ්පාදනය කරන රටවලට අහිතකර බලපෑම් එල්ල කිරීමේ තර්ජනයක් පැවැති අතර මෙම වසර තුළදීම යුරෝපීය රටවල් ද තම ආර්ථික දුෂ්කරතාවලින් මිදීමට උත්සාහ ගන්නා ලදී. එමෙන්ම 2013 වසරේදී ඇමරිකා එක්සත් ජනපදයේ අයවැය ප්‍රතිපාදන අර්බුදය නිසා ආර්ථිකය නවතාලීම අකර්මන්‍ය වීමකටද ලක්විය. එසේම ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිතය තම බැඳුම්කර මිලදී ගැනීමේ වැඩසටහනෙන්ද ඉවත්වීමට තීරණය කරන ලදී. මෙම සංසිද්ධීන් වසර තුළ ප්‍රධාන ශීර්ෂ පාඨ සැපයූ ප්‍රවෘත්ති විය. සමස්ත ලෝක ආර්ථිකය ඉහත කී සමහර අභියෝගවලට සාර්ථකව මුහුණ දෙන ලදී. තවදුරටත් කැපී පෙනුන සිද්ධීන් වූයේ එක්සත් ජනපදය සාර්ථකව අයවැයි ප්‍රතිසම්පාදන ඇතිකර ගැනීමත්, යුරෝපීය රටවල 2012 වසරේදී පැවැති අස්ථාවර තත්ත්වයන් 2013 වසරේදී යම්තාක් දුරට සමනය කරගැනීම මෙන්ම ග්‍රීසියේ අර්බුදය අනෙකුත් යුරෝපීය රටවල් වලට පැතිරීම වැලැක්වීමට හැකිවීමත්ය. එසේම මෙම වසර තුළ අරමුදල් පිටතට ගලායෑමේ ප්‍රවණතාවයකට නැගී එන වෙළෙඳපොළවල් මුහුණ දුන් නමුත් එම තත්ත්වය සමනය කර ගැනීමට එම වෙළෙඳපොළවල්වලට හැකියාව ලැබුණි.

## ශ්‍රී ලංකාවේ අවධානය යොමුවූ සිද්ධීන්

ගෝලීය ආර්ථිකයේ තවමත් පවත්නා අස්ථිරත්වයන් හා අපහසුතාවයන් නොතකා ශ්‍රී ලංකා ආර්ථිකය ධනාත්මක හා ස්ථිර සාරව ආර්ථික කළමනාකරණයන් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා රජය ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනය කර ඇත. ඒ හේතුවෙන් වෙනදාට වඩා ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික වර්ධනය වඩාත් ශක්තිමත් වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව යුද්ධය පැවති සමයේ රටෙහි දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයේ සාමාන්‍යය 5% කට වඩා අඩු අගයක් වුවද 2010 සිට එම වර්ධනය 7.5%ක් දක්වා වර්ධනය වී ඇත. 2013 දී දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය 7.3%ක් වී ඇත. දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය කර්මාන්ත ක්ෂේත්‍රයේ (ද.දේ.නි. යට 30% දක්වා වේ.) විශාල ප්‍රසාරණයකින් සමන්විත වූ අතර එය 9.9%ක පමණ ප්‍රසංශනීය අගයකි. දළ දේශීය නිෂ්පාදනයට වැඩිම දායකත්වය සපයන සේවා අංශයද (ද.දේ.නි. යට 59% දායක වේ.) 6.4%ක වර්ධනයක් පවත්වා ඇත. දළ දේශීය නිෂ්පාදනය 11% දායකත්වයක් සපයන කෘෂිකාර්මික අංශය 2013 වර්ෂයේදී 4.7%කින් වර්ධනය වී ඇත.
(රූප සටහන 02)

රූප සටහන 02 : දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය



## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද යෝග්‍ය සාර්ව ආර්ථික මිණුම්දඬු

ගෝලීය ආර්ථිකය ඉදිරියේ ඇති බාධක නොසලකා හැරී ශ්‍රී ලංකා මහ බැංකුව වඩාත් උපක්‍රමශීලී ප්‍රතිපත්ති රාමුවක් යොදාගන්නා ලදී. මෙහි ප්‍රධාන විචල්‍යයක් වනුයේ 2013 දී 6.9%ක් ව පවතින වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2014 දී 6% කට අඩු අංගයකට ගෙන ඒමට අපේක්ෂා කරයි. මෙහිදී ලොව පුරා වෙළෙඳ භාණ්ඩවල මිලයන්හි ඉහළ නොයාමේ ප්‍රවනතාවයක් අපේක්ෂා කරයි.

විනිමය අනුපාත කලමනාකරණයේදී අභියෝග පැවතියද එය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට හැකිවිය. ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති වෙනස් කිරීමට තීරණය කර අතර වෙළෙඳපොළ මිල මත බලපෑම් නොකළ නිසා 2012 වර්ෂයේ 10.43%ට සාපේක්ෂව 2013 වර්ෂයේදී 2.75%ක් ශ්‍රී ලංකා රුපියල ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වී ඇත.

තවද ශ්‍රී ලංකා රජය කාර්යක්ෂමතා මිනුම් පිළිබඳවද අවධානය යොමුකර ඇත. එහිදී සැලකිල්ලට ගනු ලැබූ වැදගත් නිර්ණායක දෙකක් වනුයේ මූල්‍ය විනය හා ඒකාබද්ධකරණයයි. 2013 වර්ෂයේදී අයවැයි හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් 5.8%කි. එය 1978 විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ පසු වාර්තා කළ අඩුම අගය වේ. 2013 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයට රජයේ ණය අනුපාතය 78%ක් වූ අතර එය 2014 වර්ෂයේදී 74% දක්වා තවදුරටත් අඩු කරගැනීමට අපේක්ෂිතය.


එසේම ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් රටේ ප්‍රධාන ප්‍රතිපත්තියක් වන පොලී අනුපාත නැවත පරීක්ෂා කර ප්‍රතිසංශෝධන කිරීම ආරම්භ කර ඇත. මහ බැංකු ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය වර්ෂය ආරම්භයේදී 7.5% සිට 6.5% දක්වා මේ වන විට අඩුවී ඇත. එසේම මහ බැංකු ප්‍රතිවිකුණුම් අනුපාතය 9.5% සිට 8.0% දක්වා අඩුවී ඇත. මෙම ප්‍රතිපත්තිමය මිනුම් සමග වෙළෙඳපොළ පොලී අනුපාත වල පහළයාමක් අපේක්ෂා කරයි. මෙම තත්ත්වයන් හමුවේ මූලික ණය පොලී අනුපාතය 2012 වර්ෂයේ 14.4% සිට 2013 වර්ෂයේදී 10.13% දක්වා අඩු වී ඇති අතර තැන්පතු පොලී අනුපාතය 2012 වර්ෂයේදී 10.10% සිට 2013 වර්ෂයේ 9.37% දක්වා අඩුවී ඇත. (රූප සටහන් 3.4)

මෙම සියළු දේ නොසලකා පෞද්ගලික අංශයට ණය සම්පාදනය අඩු ප්‍රතිශතයක් ගෙන ඇත. මෙසේ 2013 වර්ෂය තුළ ණය ප්‍රසාරණය අඩු නැඹුරුවක් පෙන්නුම් කළේ 2012 වර්ෂය තුළ සාර්ව ආර්ථික ස්ථායීකරණය කෙරෙහි වැඩි වශයෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම නිසාවෙනි. 2011 වර්ෂය තුළද පෞද්ගලික අංශයට ණය සම්පාදනය 36.5% කින් වර්ධනය වී ඇති අතර 2012 වර්ෂයේදීද 21.5% වැනි සැලකිය යුතු ප්‍රතිශතයකින් වර්ධනය වී ඇත. ණය ප්‍රසාරණය 2013 වර්ෂයේදී 8.6% වැනි සැලකිය යුතු මට්ටමකට අඩු වී ඇත.

තවදුරටත් රට ගෝලීය අභියෝග හමුවේ මෙන්ම අභ්‍යන්තර අභියෝගවලින්ද මිදී නැත. අභ්‍යන්තරික වශයෙන් නිරන්තරව පවතින වෙළෙඳ හිඟය හා ජංගම ගිණුමේ හිඟය ආර්ථිකය දුර්වල කිරීම තවදුරටත් සිදුකර ඇත. පසුගිය වසර දෙකෙහි ඇ.ඩො. බිලියන 9.5 ආසන්නයේ රැඳුනු වෙළෙඳ හිඟය ඇ.ඩො. බිලියන 7.6 කට අඩුවී ඇත. එය ආනයන වියදමෙන් 24% කි. බණිජ තෙල් මිල ඇ.ඩො. 97 වුවද බණිජ තෙල් ආනයන වියදම ඇ.ඩො. බිලියන 4.30 තිබීම වැදගත්කොට සැලකිය හැක.


2013 වර්ෂය තරමක සුබවාදී තත්වයන් ඇති කාලවකවානුවකි. වෙළෙඳ හිඟය පියවීම සඳහා මූලික යෙදවුමක් වන ප්‍රේෂණ ඇ.ඩො. බිලියන 6.4 කි. සංචාරක ක්ෂේත්‍රයෙන් ලැබීම් ඇ.ඩො. බිලියන 1.7 ක් වූ අතර එය 2012 සිට 68% ක ශක්තිමත් වර්ධනයකි. 2013 වර්ෂයේදී විදේශීය සෘජු ආයෝජන ඇ.ඩො. බිලියන 0.9 ක් වූ අතර එය සාර්ව ආර්ථික වර්ධනය පිළිබිඹු කරන මිනුම් දණ්ඩකි.

රූප සටහන 03 : මහ බැංකු පොලී අනුපාත



# සාර්ව ආර්ථික විවරණය

රූප සටහන 04 :




## අවසාන නිගමනය

ශ්‍රී ලංකා ආර්ථික තත්ත්වය සලකා බැලීමේදී දකුණු ආසියාවේ පමණක් නොව සමස්ත ආසියාවේම ප්‍රධාන තැනක් ගන්නා දකුණු ආසියාවේ වේගවත් හා තිරසාර නැගී එන ආර්ථිකයක් බවට පත්වී ඇත. තවද ඓතිහාසික අභ්‍යන්තරික ශක්තීන්ට හා පුළුල් වූ ආයතනික රාමුවක් හා බැඳුණු ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී පදනම නිසා ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම ප්‍රතික්ෂේප කළ නොහැකි මෙන්ම ඉතා සිත්ගන්නා සුලුය. මෙම සියලුම තත්ත්වයන් සලකා බැලීමේදී විදේශීය සෘජු ආයෝජන හා විදේශීය ආයතනයක ආයෝජකයින්ගේ අරමුදල් ගලාඒම සඳහා ශක්තිමත් ආනාගත නැඹුරුවක් පෙන්නුම් කරයි. අවසාන වශයෙන් මෙම සියලුම සාධකයන් සමස්තයක් ලෙස ගත් කළ ඉදිරි වර්ෂ තුළදී ප්‍රාග්ධන වෙළෙඳපොළ ඉතා ආකර්ෂණීය ප්‍රතිලාභ ප්‍රදර්ශනය කරනු ඇත.

මූලාශ්‍රඃ මහ බැංකු වර්තාව - 2013, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක පසුබිම සම්මේලන මණ්ඩලය

# ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාලෝචනය

### වෙළෙඳපොළ


යුද්ධයේ අවසානයත් සමග කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතුවල විශාල පිබිදීමක් දැක ගත හැකි වූ අතර මේ වන විට එම දැඩි ලෙස ඉහළයාම ක්‍රමයෙන් අඩු වී වඩාත් ශක්තිමත් මෙන්ම ස්ථාවර අවධියකට ප්‍රවිෂ්ඨ වී ඇත. වෙළෙඳපොළ අවදානම අවම කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හඳුන්වා දුන් ණය සීමාවන් 2013 දී වෙළෙඳපොළ ඉහළ නැංවීමේ අරමුණෙන් ඉවත් කරන ලදී.

වසර දෙස බැලීමේදී දේශීය හා විදේශීය සිදුවීම් හමුවේ කොළඹ කොටස් වෙළෙඳපොළේ ප්‍රධානතම මිල දර්ශකය වන සියළු කොටස් මිල දර්ශකය පෙර වසර දෙකෙහි 15% ක්වූ සමුච්චිත පහළ යාමට සාපේක්ෂව 4.7% කින් ඉහළ යාමක් පෙන්නුම් කළේය. මම ඉහළයාම මගින් මුම්බායි, සිංගප්පූරුව සහ හොංකොං යන කලාපීය ප්‍රධාන කොටස් වෙළෙඳපොළවල් විසින් වසර තුළ පිළිවෙළින් පෙන්නුම් කරන ලද 3.3%, 0.01% සහ 2.9% වර්ධනයන් අභිබවා ගියේය. 2009 සහ 2010 යන වසර වලදී පෙන්නම් කරන ලද වාර්තා ගත ඉහළ යාමට පසුව පෙන්නම් කළ හොඳම ඉහළයාම 2013 වසර යළිත් පෙන්නුම් කරන ලදි. S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකයද වසර තුළ 5.79% වර්ධනයක් පෙන්නම් කළ අතර වසර අවසානයේදී ඒකක 3,263.87ක් ලෙස සටහන් විය.


කොටස් හා ණයකර නව නිකුතුන් හරහා ලැයිස්තුගත වූ සමාගම් මගින් රුපියල් බිලියන 68.7 ක ප්‍රාග්ධනයක් සම්පාදනය කර ගනු ලැබූ අතර ඒ සඳහා වැඩි දායකත්වයක් විදේශීය ආයෝජකයන් විසින් දක්වන ලදි. වෙළෙඳපොළට අවශ්‍ය කරන ද්‍රවශීලතාවය ඉහළ දැමීමට හේතු වූයේ ප්‍රතිලාභ ලබා ගැනීමේ අපේක්ෂාව ඇතිව දියුණු වෙළෙඳපොළවල් වෙතින් ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන වෙළෙඳපොළවල් වෙත විදේශීය ප්‍රාග්ධනය ගලා ඒමයි.

2013 වසරේ පළමු කාර්තුව තුළ, කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනුවල කැපී පෙනෙන වර්ධනයක් දැකගත නොහැකි වූ අතර ප්‍රධාන මිල දර්ශකවලද අගය කළ හැකි වෙනසක් සිදු නොවීය. දෙවන කාර්තුවේදී යම් මට්ටමක වර්ධනයක් පෙන්නුම් කළ අතර එයට විදේශීය ආයෝජකයන් වෙතින් ගලා ආ ඉල්ලුමත් රුපියල අවප්‍රමාණයවීම වැනි ආර්ථික දර්ශකවල සිදුවූ වෙනස්කම් හේතු විය. අප්‍රේල් සිට මැයි මස දක්වා කාලය තුළ 12.6% සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළද ඊට පෙර මාස දෙක තුළ වෙළෙඳපොළ පහළයෑමක් වාර්තා විය. තෙවන කාර්තුව තුළ වෙළෙඳපොළ තවදුරටත් පහළ ගිය අතර අවසාන කාර්තුවේදී ද ගණුදෙනුවල එතරම් වෙනසක් දැකගත නොහැකි විය. ඒ අනුව සිව්වන කාර්තුව අවසානයේදී සියලු කොටස් මිල දර්ශකයේ අගය ඒකක 5912 ක් ලෙස සටහන් විය. මෙම කාර්තුව තුළ විශේෂ සිදුවීමක් වූයේ කොළඹ කොටස් හුවමාරුවේ ඉතිහාසය තුළ සිදුකළ විශාලතම හිමිකම් නිකුතුව වූ ජෝන්කීල්ස් හෝල්ඩිංග්ස් පීඑල්සී සමාගමේ රුපියල් බිලියන 23 ක් වටිනා හිමිකම් නිකුතුව සිදුකිරීමයි. මෙම හිමිකම් නිකුතුවේ ප්‍රධාන අරමුණ වූයේ සමාගමේ යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කර එමගින් ද්විතීයික ප්‍රධාන අරමුණ වූයේ සමාගමේ යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීමයි. එමගින් ද්විතීයික වෙළෙඳපොළ ද්‍රවශීලතාවය යම් දුරට අඩාල කළේය. (රූප සටහන් 05, 06)

රූප සටහන 05 : සියළු කොටස් මිල දර්ශකය සහ වෙළෙඳපොළ පිරිවැටුම




රූප සටහන 06: සියළු කොටස් මිල දර්ශකයේ වාර්ෂික වර්ධනය



# ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාලෝචනය

## ප්‍රාථමික වෙළෙඳපොළ හා සම්පත් යෙදවීම

වසර දෙස අවධානය යොමු කිරීමේදී ප්‍රාග්ධන වෙළෙඳපොළ තත්ත්වය මන්දගාමී ස්වරූපයක් උසුලමින් නව ලැයිස්තුගතවීම දෙකක් පමණක් වාර්තා කරන ලදි. එහෙත් පෙර වසරේ ලැයිස්තුගත වූ නව සමාගම් සංඛ්‍යාව 17කි. මෙම පහළයාම තුළින් පිළිබිඹු වනුයේ ආයෝජන ඉල්ලුමේ සහ සමස්ත වෙළෙඳපොළ විශ්වාසයේ පහළ යෑමයි. ඒ අනුව ආයෝජන නැඹුරුව තව දුරටත් පහළ මට්ටමක පැවති අතර පෙර වසරේ සිදු කළ බොහෝ මූලික ප්‍රසිද්ධ නිකුතුන් වලින් සෘණාත්මක ප්‍රතිලාභයන් වාර්තා විය. (සංඛ්‍යා සටහන 02)


සංඛ්‍යා සටහන *02:* ප්‍රාථමික වෙළෙඳපොළ සම්පත් යෙදවීම

| සමාගම | ලැයිස්තුගත වූ ආකාරය | නිකුත් කළ කොටස් සංඛ්‍යාව | නිකුත් මිල රුපියල් | ලැයිස්තුගත දිනය | රැස්කළ අරමුදල් ප්‍රමාණය රු.මි. |
|---|---|---|---|---|---|
| අනිලානා හොටෙල් ඇන්ඩ් ප්‍රොපර්ටීස් | මූලික මහජන නිකුතුව | 40,000,000<br>40,000,000 | 12.00 | 2013 ජූලි 17 | 494.4 |
| එයිට්කන් ස්පෙන්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් | හඳුන්වාදීමක් | - | - | 2013 මැයි 03 | - |

සමාගම් විසින් 2013 වසරේදී කොළඹ කොටස් හුවමාරුව හරහා සම්පාදනය කරගත් අරමුදල් වල වටිනාකම රුපියල් බිලියන 119.4 වූ අතර එය පෙර වසරේ රුපියල් බිලියන 29.5 ක් ලෙස සටහන් විය. මෙයට කොටස් ණයකර නිකුත් කරමින් සිදු කළ මූලික කොටස් නිකුතුන්, හිමිකම් නිකුතුන්, කොටස් බලපත්‍ර හා පෞද්ගලික කොටස් නිකුතුන් අයත් විය. සමාගම් දෙකක් පමණක් මූලික කොටස් නිකුතුන් සිදු කළ අතර එමගින් රුපියල් මිලියන 494.4 ක් සම්පාදනය කර ගන්නා ලදි. 2013 වර්ෂය තුළ හිමිකම් නිකුතුන් අටක් සිදු කරමින් රුපියල් බිලියන 25.5 ක් රැස්කර ගන්නා ලදි. 2012 වර්ෂය හා සංසංදනය කිරීමේදී සමාගම් 19ක් රුපියල් බිලියන 10.9 ක් හිමිකම් නිකුතුන් මගින් රැස්කර ගන්නා ලදි.

ලැයිස්තුගත සමාගම් 28 ක් විසින් සිදුකළ ණයකර නිකුතු මගින් රුපියල් බිලියන 68.3 ක් අරමුදල් ප්‍රමාණයක් සම්පාදනය කරගත් අතර එය පෙර වසරෙහි වූ රුපියල් බිලියන 12.5 ට වඩා ඉතා ඉහළ අගයකි. මෙය දෙන ලද වසරකදී ණයකර නිකුතු මගින් රැස්කළ ඉහළම අගය වේ. (රූප සටහන 07)

රූප සටහන *07:* ද්විතියික වෙළෙඳපොළ සම්පත් යෙදවීම




## ද්විතියික වෙළෙඳපොළ

### කොටස් වෙළෙඳපොළ දර්ශක වල කාර්යසාධනය

2013 වසර සඳහා සමස්ත පිරිවැටුම රුපියල් බිලියන 200.4 ක අගයක් ගන්නා ලද අතර එය පෙර වසරට සාපේක්ෂව 6.2% ක පහත වැටීමකි. එමෙන්ම වෙළෙඳපොළ පිරිවැටුමෙහි දෛනික සාමාන්‍යය රුපියල් මිලියන 828.4 ක් විය. කොටස් මිල ගණනන් වල ඉහළයාමක් දක්නට ලැබුණද ගණුදෙනු සංඛ්‍යාවේ පහත වැටීමක් පෙන්නුම් කරන ලදි. වසර තුළ ගණුදෙනු වූ මුළු කොටස් සංඛ්‍යාව මිලියන 9054ක් වූ අතර 2012 වසර හා සැසඳීමේදී 6.5% ක පහත වැටීමකි. වසර තුළ සිදුකළ ගණුදෙනු සංඛ්‍යාව 1,421,303 ක් වූ අතර 2012 පෙර වසර හා සංසංදනය කිරීමේදී එය 1,857,384ක් ලෙස සටහන් විය. ඒ අනුව 23.4% ක පහත වැටීමක් පිළිබිඹු විය.

මිල ඉපයුම් අනුපාතයේ වෙනෙසක් නොපෙන්වමින් තවදුරටත් 15.9 ක් ලෙස සටහන් විය. ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ මිල ගණන් අනෙකුත් නැගී එන වෙළෙඳපොළවල් හා දියුණු වෙළෙඳපොළවල් සමඟ සංසංදනය කිරීමේදී ඉහළ මට්ටමක පැවතුණි. මිල පොත් අගයද ඉතා වැදගත් තවත් මිණුම් දණ්ඩක් වන අතර එමගින් සමාගමේ වගකීම් ගෙවාදැමීමෙන් අනතුරුව කොටස් හිමියන්ට ලබා ගත හැකි ප්‍රතිලාභය පෙන්නුම් කරයි. ඒ අනුව මෙම වසර තුළ මිල පොත් අගය 2.1 සිට 2.0 දක්වා අඩුවීමක් වාර්තා කළේය.


## වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ප්‍රධානතම මිණුම් දණ්ඩ වන අතර එමගින් පෙන්නුම් කරනුයේ කොටස් වෙළෙඳපොළේ විශාලත්වයයි. ඉහළ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය මගින් වර්ධනය වන කොටස් වෙළෙඳපොළක් පිළිබිඹු කරයි. වසර දෙස අවධානය යොමු කිරීමේදී කොළඹ කොටස් හුවමාරුවේ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 2459.9 කින් ඉහළ ගිය අතර පෙර වසර හා සැසඳීමේදී එය රුපියල් බිලියන 2167 ක අගයක් වාර්තා කරමින් 13.4% ඉහළයාමක් පෙන්නුම් කළේය.

## විදේශීය මිලදී ගැනුම් හා විදේශීය විකුණුම්

වසර තුළ විදේශීය මිලදී ගැනීම් රුපියල් බිලියන 83.6 ක් ලෙස වාර්තා වූ අතර පෙර වසර හා සැසඳීමේදී 15.1% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදි. කෙසේ වෙතත් 79.2% ක ඉහළයාමක් විදේශීය විකුණුම් සම්බන්ධයෙන් දැක ගත හැකි වූ අතර එහි වටිනාකම රුපියල් බිලියන 60 ක් විය. සමස්ත ශුද්ධ විදේශීය ගලා ඒම ප්‍රමාණය රුපියල් බිලියන 22.7 ක් විය. එය පෙර වසර හා සංසංදනය කිරීමේදී 41.1% ක පහත වැටීමක් වන අතර වටිනාකම රුපියල් බිලියන 15.9 කි. පෙර වසරේ සමස්ත ශුද්ධ විදේශීය ගලා ඒම් ප්‍රමාණය ලංකා රුපියල් බිලියන 38.6කි. එය කොළඹ කොටස් හුවමාරුවේ ඉතිහාසය තුළ මෙතෙක් වාර්තා වූ ඉහළම ශුද්ධ විදේශීය ගලා ඒම් ප්‍රමාණයයි. විදේශීය සහභාගීකරුවන් 36.1%ක දායකත්වයක් සමස්ත වෙළෙඳපොළ පිරිවැටුමට ලබාදෙන ලදි. එය පෙර වසරෙහි වූ 24.8% ක දායකත්වයට වඩා වැඩි ඉහළයාමකි. (රූප සටහන 08)


### රූප සටහන 08: විදේශීය සහභාගිත්වය




## ණයකර වෙළෙඳපොළ

ශ්‍රී ලංකාව වැනි රටකට හොඳින් වැඩි දියුණු වූ ණයකර වෙළෙඳපොළක් ඉතා වැදගත් වන අතර එමගින් සමාගම් වල දිගුකාලීන අරමුදල් අවශ්‍යතා සම්පූර්ණ කරයි. එය විශේෂයෙන්ම යටිතල පහසුකම් වර්ධනය කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පාදනයට ඉවහල් වේ. එමෙන්ම සමාගම් වලට අවශ්‍ය අරමුදල සම්පාදනය සඳහා පවතින විකල්ප අතර ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ණයකර වෙළෙඳපොළ තුළ ප්‍රමුඛයා වන්නේ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළයි. මෑතකදී සිදු කළ ප්‍රතිපත්තිමය වෙනස්කම් මගින් ලැයිස්තු ගත ණයකර හිමියන්ට බදු සහන ලබා දෙන ලද අතර එය ලැයිස්තු ගත ණයකර නිකුතුන් සඳහා සමාගම් උනන්දු කර වීමටද හේතු විය. විශාලතම ණයකර ගැනුම් කරුවන් අතුරින් ප්‍රධාන වූයේ බැංකුය. සාංගමික ණයකර වෙළෙඳපොළෙහි පුළුල්වීමක් දැකගත හැකි වුවත් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ හා සැසඳීමේදී එය ඉතා කුඩා අගයකි. වසර තුළ සිදුකළ ණයකර නිකුතු ප්‍රමාණය 28 ක් වූ අතර එමගින් රැස්කර ගත හැකි වූ අරමුදල් ප්‍රමාණය රුපියල් බිලියන 68.3 කි. පෙර වසරේ වාර්තා වූයේ ණයකර නිකුතු 3ක් පමණක් වන අතර එමගින් රුපියල් බිලියන 12.5 ක් සම්පාදනය කර ගත හැකි විය. (රූප සටහන 09)

### රූප සටහන 09: ණයකර වෙළෙඳපොළ




## ආංශික කාර්යසාධනය

2013 කොළඹ කොටස් වෙළෙඳපොළ සංඛ්‍යා දත්ත පිරික්සීමේදී සමාගම් 57 ක් අතිරික්ත සමස්ත ප්‍රතිලාභයක් වාර්තා කරන ලද. සමාගම් 26ක් 30% ක අතිරික්ත ප්‍රතිලාභයක් පෙන්නුම් කරන ලක්‍ෂ. ආහාර පාන සහ දුම්කොළ ක්ෂේත්‍රයේ වසර තුළ ඉහළම වර්ධනය පෙන්නුම් කරන ලද අතර එය 28% ක අගයක් ගන්නා ලක්‍ෂ. එමෙන්ම විදුලි හා බලශක්ති අංශය 19.5% ක වර්ධනයක් සනිටුහන් කළ අතර තොරතුරු තාක්ෂණ අංශය වසර තුළ පහළම

# ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාලෝචනය

වර්ධන අගය වූ 27.3% ක අගයක් වර්තා කළේය. වෙළෙඳාම් අංශයේ පහළයාම 21.3% ක් ද ලෙස සටහන් විය.

වසර තුළ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් දෙස අවධානය යොමු කිරීමේදී ව්‍යාපාර ක්ෂේත්‍ර 7 ක් පමණක් ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළ අතර ව්‍යාපාර ක්ෂේත්‍ර 13 ක් පහළයාමක් පෙන්නුම් කරන ලදි. (සංඛ්‍යා සටහන 03)


සංඛ්‍යා සටහන 03: ආංශික කාර්යසාධනය

| ව්‍යාපාර ක්ෂේත්‍රය | වාර්ෂික ප්‍රතිශතක වෙනස |
|---|---|
| අහාරපාන සහ දුම්කොළ | 28.01 |
| විදුලි හා බලශක්ති | 19.51 |
| සෞඛ්‍ය හා සනීපාරක්ෂණ | 16.95 |
| ගබඩා පහසුකම් සැපයීම | (16.83) |
| වෙළෙඳාම් | (21.39) |
| තොරතුරු තාක්ෂණ | (27.33) |

## ඒකක භාර අරමුදල්

ඒකක භාර අරමුදල් වල ශුද්ධ වත්කම් වටිනාකම 2013 දෙසැම්බර් 31 වන දිනට රුපියල් බිලියන 54 ක් විය. 2013 වසරේ ශුද්ධ වත්කම් වටිනාකම අනුව එක් එක් ඒකක භාර කළමනාකරණ සමාගම් අතකර ගත් වෙළෙඳපොළ කොටස පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ. (රූප සටහන 10)

රූප සටහන 10: ඒකක භාර කළමනාකරණ සමාගම් වල වෙළෙඳපොළ කොටස




## ඒකක භාර අරමුදල් වල සමස්ත තත්ත්වය

2013 සහ 2012 යන වර්ෂයතුළ ඒකක භාර අරමුදල් වල සංඛ්‍ය දත්තයන්හී සංසන්දනාත්මක තොරතුරු පහත වගුවේ දැක්වේ. (සංඛ්‍යා සටහන 04)

සංඛ්‍යා සටහන 04: ඒකක භාර අරමුදල් වල සමස්ත තත්ත්වය

| | 2013.12.31 වන දිනට | 2012.12.31 වන දිනට | ප්‍රතිශතක වෙනස% |
|---|---|---|---|
| අවසරලත් ඒකක භාර අරමුදල් සංඛ්‍යාව | 62 | 48 | 29% |
| ඒකක භාර වල ශුද්ධ වත්කම් වටිනාකම (දළ වශයෙන් රුපියල් මිලියන) | 54,304 | 31,062 | 75% |
| ඒකක හිමියන් සංඛ්‍යාව | 29,648 | 27,952 | 6% |
| නිකුත් කර ඇති ඒකක සංඛ්‍යාව (දළ වශයෙන් මිලියන) | 4,134 | 2,251 | 84% |
| කොටස් වල ආයෝජනය (දළ වශයෙන් රුපියල් මිලියන) | 9,453 | 8,944 | 6% |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය (දළ වශයෙන් රුපියල් මිලියන) | 17,825 | 5,449 | 227% |
| අනෙකුත් උපකරණවල ආයෝජනය** (දළ වශයෙන් රුපියල් මිලියන) | 27,000 | 16,596 | 63% |

** වාණිජ බිල්පත්, භාර සහතික, ණයකර, බැංකු තැන්පතු, ආදිය

තොරතුරු: ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් නියාමන ආයතනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු

# කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය

කළමනාකාරීත්වයඃ වමේ සිට - මධුගයනි බලපිටිය මෙනවිය, සුනෙත් පෙරේරා මහතා, රන්මිණි ජයතිලක මහත්මිය, ෂර්මිලා පණ්ඩිතරත්න මෙනවිය.

වමේ සිට සිටගෙන - ඔලිවී සෝලංගආරච්චි මහත්මිය, කුමාරි සිරිවර්ධන මෙනවිය, බුද්ධිනි එන්. හේරත් මෙනවිය, එරන්දතී වෛද්‍යසේකර මහත්මිය, මහේෂ් අබේසේකර මහතා. ! වමේ සිට අසුන්ගෙන - නිමල් කුමාරසිංහ මහතා, එච්. කේ. ඒ. චමරි බුද්ධිකා මහත්මිය.





# කාර්ය මණ්ඩලය

වමේ සිට සිටගෙන - රෝෂිනී පීරිස් මෙනවිය, සුහදිනී වික්‍රමසිංහ මෙනවිය, ලුෂන්තිනී සිවනේෂරාජා මෙනවිය, නිසංසලා හේරත් මහත්මිය, ලක්ෂ්මි අතපත්තු මෙනවිය. ! වමේ සිට අසුන්ගෙන - එම්. පී. නිරෝෂිකා උදයංගනී මෙනවිය, ලලින්ද දයාරත්න මහතා.

වමේ සිට සිටගෙන - සුගත් අල්විස් මහතා, ජොයෙලීන් කරුණාරත්න මහත්මිය, ජේ. කේ. ප්‍රියදර්ශිනී මහත්මිය, නුආලා දේවදාසන් මෙනවිය, නිෂෝකා ජයතුංග මහත්මිය. ! වමේසිට අසුන්ගෙන - මංජුලා චන්ද්‍රරත්න මහත්මිය, ක්‍රිස්ටබල් සිල්වා මෙනවිය.





වමේ සිට සිටගෙන - අනුර පෙරේරා මහතා, අනුලා විජේසිංහ මහත්මිය, සමන්ති ගුණවර්ධන මහත්මිය, ආර්. කේ. වසන්ත සුනිමල් මහතා, ඈන් ක්‍රිෂන්ති ප්‍රනාන්දු මෙනවිය, බිම්බා ගමඇතිගේ මහත්මිය. ! වමේ සිට අසුන්ගෙන - ප්‍රියන්ත හේරත් මහතා, ජුලි අලගකෝන් මහත්මිය.

වමේ සිට සිටගෙන - රජ්මි මනතුංග මෙනවිය, මේබලා ජයපාල මෙනවිය, සෞමි කොඩිප්පිලි මහත්මිය, ප්‍රතිභානි හේරත් මහත්මිය, ශීනා ගුණරත්න මෙනවිය, ඇනස්ලම් ඩයස් මහතා. ! වමේ සිට අසුන්ගෙන - රඛිත බණ්ඩාර මහතා, චිරංගා මන්ත්‍රීරත්න මහත්මිය.





# කාර්ය මණ්ඩලය

වමේ සිට සිටගෙන - ශලිනි පෙරේරා මෙනවිය, තනිෂ්ක තිලකරත්න මහතා, ප්‍රභාෂිනී සමරකෝන් මහත්මිය, ක්‍රිෂාන්ති මුතුතන්ත්‍රි මහත්මිය, ධනේෂා රාජපුර මහත්මිය. ! වමේ සිට අසුන්ගෙන - අශෝකා කේ. දයාරත්න මහත්මිය, එම්. ජයසේකර මහතා.

වමේ සිට සිටගෙන - සිතාරා තිසේරා මහත්මිය, එස්. ඩී. ධර්මසිරි මහතා, වයි. ඩී. සඳමාලි මෙනවිය, ඒෂිනී බණ්ඩාර මහත්මිය, එම්. එම්. එස්. මලීහා මහත්මිය, ඩී එම්. ජී ප්‍රියන්ත මහතා. ! වමේ සිට අසුන්ගෙන - ලක්ෂ්මි වික්‍රමනායක මහත්මිය, සඳරුවන් විජේරත්න මහතා.






වමේ සිට  සිටගෙන - චන්ද්‍රන් නාගේන්ද්‍රන් මහතා, තක්ෂිලා ප්‍රැන්සිස් මහත්මිය, ජැන්සිදේවි කුහනේයන් මහත්මිය, ඩබ්. ආරියරත්න මහතා, එම්. එම්. ඒ. ඉම්රාන් මහතා. ! වමේ සිට සිටගෙන - පී. ඩී. කපිල කුමාර මහතා, ඩී. පැතුම් නිරෝෂන මහතා,

නොපැමිණිනි - සජීවනී බක්මීදෙනිය මහත්මිය, පී. ඩබ්. එල්. පියතිස්ස මහතා, පී. ඩී. පද්මරානි මහත්මිය, ප්‍රීනිකා නිලක්ෂි පෙරේරා මහත්මිය.





# මෙහෙයුම් කටයුතු

## සමාලෝචනය

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## නියාමනය

වඩාත් කාර්යක්ෂම මිල යාන්ත්‍රණයක් ඇති කිරීම, ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, පිළිගත හැකි අවදානම් මට්ටමක් පවත්වාගෙන යන බවට සහතිකවීම හා වෙළෙඳපොළ තුළ විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ප්‍රාග්ධන වෙළෙඳපොළකට අවශ්‍ය වන නිසි නියාමන රාමුවක් සකස් කරන අතර ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

### බලපත්‍ර නිකුත් කිරීම් හා ලියාපදිංචි කිරීම්

ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ක්‍රියාකාරකම් පවත්වා ගැනීමට බලාපොරොත්තු වන වෙළෙඳපොළ අතරමැදියන් සඳහා නිසි බලපත්‍ර නිකුත් කිරීමේ හා ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් අවශ්‍ය වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වඩාත් තරඟකාරී හා වෘත්තීමය සේවාවක් සැපයීම සඳහා වෙළෙඳපොළ අතරමැදියන්ට අවශ්‍ය බලපත්‍ර නිකුත් කිරීම් හා ලියාපදිංචි කිරීම් සිදු කරනු ලබයි. (සංඛ්‍යා සටහන 05)

### සංඛ්‍යා සටහන 05: 2013 වසර තුළ සිදුකළ බලපත්‍ර නිකුත් කිරීම් සහ ලියාපදිංචි කිරීම්

| වෙළෙඳපොළ සහභාගිකරුවන් | බලපත්‍රලාභී/ ලියාපදිංචි කර ඇති මුළු ආයතන ප්‍රමාණය | 2013 වර්ෂයේදී නිකුත් කළ බලපත්‍ර/ ලියාපදිංචි කිරීම් ප්‍රමාණය |
|---|---|---|
| කොටස් වෙළෙඳපොළ | 01 | - |
| කොටස් තැරැව්කාර සමාගම් (කොටස්/ණයකර) | 28 | - |
| කොටස් තැරැව්කාර සමාගම් (ණයකර) | 02 | 01 |
| කොටස් වෙළෙඳ සමාගම් | 08 | 02 |
| ඒකක භාර කළමනාකරණ සමාගම් | 13 | - |
| ඒකක භාර අරමුදල් | 62 | 14 |
| ආයෝජන කළමනාකරුවන් | 37 | 02 |
| ආන්තික සැපයුම්කරුවන් | 33 | - |
| ප්‍රාරක්ෂකයන් | 10 | - |
| ණය ප්‍රමානීකරණ ආයතන | 03 | - |
| නිෂ්කාෂණ ආයතන | 01 | - |

## ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සඳහා වන සංශෝධනයන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් හඳුනාගැනීම මේ වසරේදී අවසන් කරන ලදී. සම්පිණ්ඩනය කළ යෝජිත සංශෝධනයන් සහ ඒ සම්බන්ධව සකස් කළ ප්‍රතිපත්ති පත්‍රිකා 2013 ජූලි මස 26 වන දින කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. වත්මන් පනතේ දක්වා ඇති වගන්ති සහ නව යෝජිත නීති අතර සිදුකළ සංසන්දනාත්මක විග්‍රහයක්ද ඒ සමගම ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් හඳුනා ගැනීම සඳහා ලෝක බැංකුවේ මූල්‍ය ප්‍රතිසංස්කරණ අංශය මගින් අපට අවශ්‍ය කරන සහාය ලබාදුන් අතර මෙම සංශෝධනයන් කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර යෝජිත සංශෝධනයන් නැවත සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, සාංගමික ක්ෂේත්‍රය, නීතිඥ සංගමය සහ මුදල් අමාත්‍යාංශය නියෝජනය වන පරිදි ඉහළපෙලේ සාමාජිකයන් 14 කින් සැදුම්ලත් විශේෂ කමිටුවක් මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් මේ වන විට පිහිටුවා ඇත.

පනත සඳහා යෝජිත නව සංශෝධනයන් කෙටුම්පත්කර ඇත්තේ අන්තර්ජාතික සුරැකුම්පත් කොමිෂන් සභා සංවිධානය (IOSCO) විසින් ප්‍රකාශයට පත්කොට ඇති වර්තමාන ජාත්‍යන්තර යහ ප්‍රතිපත්තිවලට අනුකූල වන ආකාරයටයි.

කොමිෂන් සභා පනතට හඳුන්වා දීමට නියමිත සංශෝධනයන් අතරින් කිහිපයක් පහත පරිදි වේ.

- යම් යම් සුරක්ෂිත කිරීම්වලට යටත්ව, යාවජීව බලපත්‍රලාභී අසාමුහිකරණය කළ කොටස් හුවමාරු මධ්‍යස්ථාන, ව්‍යුත්පන්න හුවමාරු මධ්‍යස්ථාන, නිෂ්කාශන ආයතන සහ මධ්‍යම තැන්පතු ක්‍රමයන් වෙළෙඳ ආයතනයන් වශයෙන් හඳුන්වා දීම.
- සාංගමික මූල්‍ය උපදේශකවරු, මූල්‍ය සැලසුම්කරුවන්, විශ්ලේෂකයන්, ව්‍යුත්පන්න ගනුදෙනු තැරැව්කරුවන්, ව්‍යුත්පන්න ගනුදෙනු වෙළෙඳුන් සහ ඒකක භාර කළමනාකරුවන් නියාමනය කිරීම.
- ශ්‍රී ලංකාවේ සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මහජනතාවට ණයකර

නිකුත් කිරීම සිදු කරනු ලබන සහ ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සිදුකරන සමාගම් සහ වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීමට හැකි වන ආකාරයෙන් කොමිෂන් සභාවේ බලතල පුළුල් කිරීම.

- මධ්‍යම ප්‍රතිපාර්ශවකරුවෙකු ලෙස කටයුතු කරන නිෂ්කාශන ආයතනයක් පිහිටවීම සහ නියාමනය කිරීමට අවශ්‍ය බලතල.
- සිවිල් සහ පරිපාලනමය ප්‍රතිකර්මයන් හඳුන්වා දීම.
- කොටස් වෙළෙඳපොළ අයථා ක්‍රියාකාරකම් හේතුවෙන් පාඩු විඳීමට සිදු වූ ආයෝජකයන්ට වන්දි ලබාදීම.
- දේශීය සහ විදේශීය නියාමන ආයතන සමග අපට අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම සහ ආයෝජකයාගේ ආරක්ෂාව වඩාත් තහවුරු කිරීම සඳහා වන අතිරේක බලතල කොමිෂන් සභාව දීම.

### කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමුහිකරණය කිරීමේ බිල්පත

කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමුහිකරණ කිරීම පිළිබඳව ගන්නා ලද කැබිනට් තීරණය අනුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාව සමග සාකච්ඡා කරමින් පාර්ලිමේන්තු පනත් කෙටුම්පත සකස් කරමින් සිටී. කොමිෂන් සභාව විසින් මෙම ක්‍රියාවලිය සමාලෝචනයේදී සමාගම් රෙජිස්ට්‍රාර් තුමාගෙන්, ගරු නීතිපති තුමාගෙන් සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙන් උපදෙස් විමසන ලදී.

යෝජිත කෙටුම්පත, වර්තමාන සාමුහික අයිතිය හිමි ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක වන කොළඹ කොටස් වෙළෙඳපොළ, අසාමුහිකරණය වූ සහ කොටස් වලින් සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක වන්නට නියමිත කොටස් වෙළෙඳපොළක් බවට පරිවර්තනය කිරීම සඳහා සහ අනෙකුත් අනුශාංගික කටයුතු සඳහා ප්‍රතිපාදන සපයයි.

### පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය සඳහා කළ සංශෝධනයන්

පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය සඳහා යෝජිත සංශෝධනයන් අවසන් අදියරෙහි පවතින අතර නව සංග්‍රහය ගැසට් පත්‍රයේ පළ කිරීමට ප්‍රථමයෙන් නැවත වතාවක් මහජන අදහස් විමසීම උදෙසා යොමු කිරීමට නියමිතය.

### අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයක් ලෙස අවම කොටස් හිමිකාරත්වයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද රීති.

කොමිෂන් සභාව විසින් මහජන අදහස් විමසීම් තුනකින් පසුව අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයක් ලෙස අවම මහජන හිමිකාරත්වයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද රීති නිකුත් කරන ලදී. අනතුරුව එකී රීතීන් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ රීතීන්වලට ඇතුළත් කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළට යොමුකරන ලදී.

එකී රීති පහත සඳහන් පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගම් විසින් අවම මහජන හිමිකාරත්වයක් පවත්වාගෙන යාමට අනිවාර්යකර ඇත.

- ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත සමාගම්වලට කොටස් හිමියන් 750 ක් අතර 20% ක අවම මහජන හිමිකාරත්වයක් පවත්වාගෙන යාම හෝ අවම මහජන හිමිකාරත්වය 10% ක්ව පවත්වාගෙන යන අතරතුර වෙළෙඳපොළ ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 5 ක් මහජන කොටස් හිමියන් 500 ක් අතර පවත්වාගෙන යාම.
- දිරිසවි පුවරුවේ ලැයිස්තුගත සමාගම්වලට මහජන හිමිකාරත්වය 10% ක් පවත්වාගත යුතු අතර එය කොටස් හිමියන් 200 ක් අතර පවත්වා ගැනීම.

### විදේශීය කොටස් වෙළෙඳපොළ අතර සිදුවන ලැයිස්තුගත කිරීම්වලට අදාළ රීති

කලාපීය මූල්‍යමය ඒකාබද්ධවීම අරමුණු කරගෙන, දකුණු ආසියාතික කොටස් වෙළෙඳපොළ සම්මේලනය විසින් පසුගිය වසර තුළදී සංවිධානය කරන්නට යෙදුනු සම්මන්ත්‍රණ සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහභාගි වන ලදී. දකුණු ආසියාතික කලාපය තුළ ඇති සියලුම කොටස් වෙළෙඳපොළ සඳහා ඒකාබද්ධ නීතිමය රාමුවක් ස්ථාපිත කිරීම අරමුණු කරගෙන ඉහත කී සම්මේලනය විසින් කලාපීය කොටස් වෙළෙඳපොළ නීති ඇතුළත් ග්‍රන්ථයක් සම්පාදනය කරන ලදී. අප ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ක්ෂුද්‍රව්‍යුහය සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමයේදී මගපෙන්වීමක් ලෙස භාවිතා කිරීම සඳහා එකී ග්‍රන්ථය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත යොමුකරන ලදී.

මෙම වසර තුලදී දකුණු ආසියාතික කොටස් වෙළෙඳපොළ සම්මේලනය විසින් එම සම්මේලනය සඳහා කලාපීය සහයෝගීතාවය සඳහා වූ දකුණු ආසියාතික සමුළුවෙහි (SAARC) "Apex Body" තත්ත්වය ලබාගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. සුරැකුම්පත් සහ විනිමය

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

කොමිෂන් සභාව එකී අයදුම්පත සම්බන්ධයෙන් පිටසන් කිරීමක්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය වෙත මෙම වසර තුළදී ලබාදෙන ලදී.

### කොටස් වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ නීති

වර්තමානයේ බලපැවැත්වෙන කොටස් වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ නීතින් පරිපූර්ණ පුනරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව ගැසට් පත්‍රයේ පළ කිරීමේ කටයුතු සඳහා නීතිකෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදී.

### ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම් ලැයිස්තුගත කිරීම

විදේශ සෘජු ආයෝජන ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඒකාබද්ධව ආයෝජන මණ්ඩලය මගින් අනුමත කරන ලද සමාගම්හි සාමාන්‍ය කොටස් ගනුදෙනු කිරීම පිණිස වෙළෙඳ ක්‍රමවේදයක් සැපයීමට අවශ්‍ය රාමුවක් නිර්මාණය කිරීම.

### මහජන කොටස් හිමියන්ට පනවා තිබූ රඳවා තබා ගැනීමේ නියාමනය ලිහිල් කිරීම.

හඳුන්වාදීමේ ක්‍රමය යටතේ ලැයිස්තුගත කරන්නා වූ සමාගම්වල මහජන කොටස් හිමියන්ට එතෙක් බලපැවැත්වූ කොටස් රඳවා තබා ගැනීමේ නියාමනය ලිහිල් කිරීම සඳහා අභ්‍යන්තර මාර්ගෝපදේශනයක් නිර්මාණය කිරීම.

### කොටස් වෙළෙඳපොළ නීතිවලට අදාළ සංශෝධනයන්

මෙම වසර තුළදී පහත සඳහන් කොටස් වෙළෙඳපොළ නීති සංශෝධනයන් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය අනුමැතිය පිරිනමන ලදී.

### මධ්‍යම තැන්පතු ක්‍රමයට අදාල නීති

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ස්වයංක්‍රීය ගනුදෙනු පද්ධතියට හඳුන්වාදුන් 7 වන අනුවාදයට අදාළව ණයකර සම්බන්ධ ගනුදෙනු කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයට අදාළ රීති සංශෝධනයන් සඳහා මෙම වසර තුළදී කොමිෂන් සභාව අනුමැතිය ලබාදෙන ලදී.

### කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීමේ රීති

මෙම වසර තුළදී කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීමේ රීතින් සඳහා පහත සංශෝධනයන් සිදුකරන ලදී.

- ණයකර නිකුත් කිරීමේදී ඉදිරිපත් කරන භාර ඔප්පුව සම්බන්ධයෙන් වූ සංශෝධනයන් ලැයිස්තුගත කිරීමේ නීති අංක 3 ට හඳුන්වා දෙන ලදී.
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වර්ෂ 2013 ඔක්තෝබර් 11 සහ අගෝස්තු 23, වර්ෂ 2011 සැප්තැම්බර් 14 සහ වර්ෂ 2010 නොවැම්බර් 22 යන දින දරන විධානයන්ට අනුශාංගිකව ලැයිස්තුගත කිරීමේ නීති අංක 2, 3, 5 සහ 7 ට සංශෝධනයන් මෙම වසර තුළදී සිදුකරන ලදී. එමගින් යම් සමාගමක් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගතවීමෙන් අනතුරුව, එම සමාගමෙහි ප්‍රවර්ධකයන් සතුව ඇති එකී සමාගම ලැයිස්තුගත කිරීමේදී සිදුකළ මූලික මහජන කොටස් නිකුතුවට පෙර එම ප්‍රවර්ධකයන් වෙත නිකුත් කර ඇති එම සමාගමෙහි කොටස් යම් සීමිත කාලසීමාවක් සඳහා කොටස් වෙළෙඳපොළෙහි ගනුදෙනු කළ නොහැකි අකාරයට අගුළු දැමීමක් සිදුවේ. තවද මෙම සංශෝධනයන් මගින් පොදු මහජන කොටස්කරුවන් විසින් මූලික මහජන කොටස් නිකුතුවට පෙර දරා සිටි සමාගමේ කොටස් අගුළු දැමීමෙන් සිදු කරන ලදී.
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ සාංගමික ණයකරවලට අදාළ වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා ගනු ලැබූ මූලික පියවරක් ලෙස ණයකරවලට අදාළව දැනට පවත්වන ලැයිස්තුගත කිරීමේ රීතීන්හි පරිපූර්ණ පුනරීක්ෂණයක් සිදුකරන ලදී. එහිදී එම කටයුත්ත සඳහා විශේෂයෙන් පත්කළ කමිටුව විසින් මේ සම්බන්ධව සංශෝධනයන් රාශියක් යෝජනා කරන ලද අතර එකී සංශෝධනයන් කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව පවත්නා ලැයිස්තුගත රීතීන්ට සංස්ථාපනය කරන ලදී.

### කොටස් තැරැව්කරුවන් සම්බන්ධ රීති

මෙම වසර තුළදී කොටස් තැරැව්කරුවන් සම්බන්ධ රීති අංක 6 ට සිදුකළ සංශෝධනයන් තුළින් කොටස් තැරැව්කාර සමාගම්වල නියෝජිතයන් ලෙස විදේශීය සමාගම් හෝ පුද්ගලයන් පත්කිරීමට අවසර ලබා දෙන ලදී.

### කොළඹ කොටස් වෙළෙඳපොළ ස්වයංක්‍රීය ගනුදෙනු පද්ධති සම්බන්ධයෙන් වන රීති

මෙම නීතින්හි නීති අංක 8.1 ට සිදුකළ සංශෝධනයන් තුළින් කොටස් වෙළෙඳපොළ ස්වංයක්‍රීය ගනුදෙනු පද්ධතියෙහි යම් ලැයිස්තුගත සමාගමක කොටසක සමාප්ති මිල ගණනය සඳහා ඇති ක්‍රමවේදය සම්බන්ධ වූ සංශෝධනයන්, වෙළෙඳපොළට හඳුන්වාදී ඇත.

## විධානයන්

මෙම වසර තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් පහත විධානයන් නිකුත් කරනු ලදී.

- රුපියල් මිලියන විස්ස ඉක්මවන සියලුම කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ සහතික කළ අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය පනවමින් මීට පෙර පනවා තිබූ විධානය ලිහිල් කරමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත නව විධානයක් නිකුත් කරන ලදී. මෙම නව විධානය නිකුත් කරන ලද්දේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් සිදුකරන කොටස් ගනුදෙනුවලදී මුදල් පියවීමේ කටයුතු සම්බන්ධව පැන නැගිය හැකි අවදානම් සමථය කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග සහ පියවර ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ගෙන ඇති බවට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත සිදුකළ කරුණු තහවුරු කිරීමකින් අනතුරුවය.

- මූලික මහජන කොටස් නිකුතුවකට පෙර යම් සමාගමක ප්‍රවර්ධකයන් සහ අනෙකුත් මහජන නොවන කොටස් කරුවන් සතුව තිබූ එම සමාග මේ කොටස් යම් කාලසීමාවන් සඳහා ගනුදෙනු කළ නොහැකි ආකාරයට අගුළු දැමීම නියෝග කරමින් කොමිෂන් සභාව විසින් විධානයන් නිකුත් කරනු ලදී. මෙම විධානය මහජනතාව වෙත නිකුත් කරන කොටස් නිකුතු සහ විකුණුම් අර්පණයන්ට පමණක් අදාළ වේ.

- ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී. සමාගමේ කටයුතු සම්බන්ධව කොමිෂන් සභාව විසින් සිදුකරන ලද මූලික විමර්ශනයෙන් අනතුරුව එම සමාගමේ යම් යම් තොරතුරු වෙළෙඳපොළ වෙත නිකුත් කරන තෙක් එහි කොටස් ගනුදෙනු කිරීම අත්හිටුවමින් කොමිෂන් සභාව විසින් විධානයන් දෙකක් සැප්තැම්බර් මස නිකුත් කරන ලදී.

- ආයෝජකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී. සමාගමෙහි ශේෂ පත්‍රයෙහි සඳහන් කිසිදු ජංගම නොවන වත්කමක් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව අත්පත් කරගැනීම, පවරාදීම, විකිණීම, උකස් කිරීම, බදුදීම හෝ වෙනත් කිසිදු ආකාරයක අන්සතු කිරීමක් සිදුකිරීම වළක්වමින්ද සමාගමෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී පවත්වාගෙන යන වාර්තා සහ  පොත්පත්වල සඳහන් කිසිදු තොරතුරක් විනාශ කිරීම, සැඟවීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ එම වාර්තා හෝ පොත්පත් ඉවත් කිරීම වළක්වාලමින්ද, කොමිෂන් සභාව විසින් සිදුකරගෙන යනු ලබන විමර්ශන කටයුතු සඳහා සමාගමෙහි පූර්ණ සහයෝගය ලබාදීම අනිවාර්ය කරමින්ද කොමිෂන් සභාව විසින් ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී. වෙත නියෝගයක් නිකුත් කරන ලදී.

- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කොටස් ලැයිස්තුගත කිරීමේ ක්‍රමවේදයක් ලෙස "හඳුන්වාදීමේ ක්‍රමය" නැවත ස්ථාපිත කරමින් කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත විධානයක් නිකුත් කරන ලදී. මෙහිදී හඳුන්වාදීමේ ක්‍රමයට අදාළව සුදුසුකම් මැන බැලීමේ නිර්නායක, ලැයිස්තුගත කිරීමට ප්‍රථම නිකුත් කර ඇති කොටස් අගුළු දැමීමේ කාලසීමාවන්, හඳුන්වාදීමේ ක්‍රමයේදී වෙළෙඳපොළට ඉදිරිපත් කරන "හඳුන්වාදීමේ ලේඛනයෙහි" අන්තර්ගත කළයුතු අමතර කරුණු සහ වත්මන් ලැයිස්තුගත කිරීමේ නීතිවල අන්තර්ගත අවශ්‍යතාවයන්ට අමතරව අතිරේක අවශ්‍යතාවයන්ද පනවමින් ඉහත කී විධානය නිකුත් කරන ලදී.

- දිරිසවි පුවරුවෙහි ලැයිස්තුගත වීමට බලාපොරොත්තුවන සමාගම් සතුව තිබිය යුතු සුදුසුකම් නිර්ණායක සංශෝධනය කරමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරන ලදී. මෙහිදී ලැයිස්තුගත කරන අවස්ථාවේදී සමාගමේ මුළු කොටස් ප්‍රතිශතයෙන් 10% ක ප්‍රතිශතයක් අවම වශයෙන් "මහජන" කොටස් කරුවන් 200 ක් විසින් දරාසිටීම අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස පනවන ලදී.

- කොමිෂන් සභාව විසින් ඒකක භාර කළමනාකාර සමාගම් සහ භාරකරුවන් වෙත විධානයක් නිකුත් කරමින් සෑම අවස්ථාවකදීම සෑම ඒකක භාරයක් සඳහාම අවම වශයෙන් ඒකක හිමියන් පස්දෙනෙක්වත් පවත්වාගෙන යායුතු බව අනිවාර්යය කරන ලදී.

- සියලුම ලැයිස්තුගත සමාගම්වල ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නියාමනය කිරීම සඳහා සැකසූ රීති සංග්‍රහය අනුගමනය කිරීම අනිවාර්ය කරමින් සියලුම ලැයිස්තුගත සමාගම් වෙත කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

- ඒකක භාර අරමුදල්වල ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ඒකීය තක්සේරු ක්‍රමයන් යොදාගැනීම අනිවාර්යය කරමින් කොමිෂන් සභාව විසින් ඒකක භාර කළමනාකාර සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී.

- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගම් සඳහා අඛණ්ඩව පවත්වා ගත යුතු නීතිමය අවශ්‍යතාවයක් ලෙස වර්ෂ 2014 දී ජනවාරි මස පළමුවන දින සිට බලපැවැත්වෙන පරිදි අවම මහජන කොටස් හිමිකාරත්වයක් පවත්වාගෙන යෑම අනිවාර්ය කරමින් කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරන ලදී. වර්ෂ 2014 ජනවාරි පළමුවන දින වන විට එකී නීතින්ට අනුකූල නොවන ලැයිස්තුගත සමාගම් සඳහා අදාළ නීතින්ට අනුගතවීමට වසර 3 ක සහන කාලයක් ලබාදෙන ලදී.

- ලැයිස්තුගත සමාගම්වල සියලුම අධ්‍යක්ෂකවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් විසින් සිදුකරන කොටස් ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ සමාගම විසින් වෙළෙඳපොළට සිදුකළ යුතු අනාවරණයක් සම්බන්ධව සහ එම අනාවරණයක් සිදුකළ යුතු කාලපරාසයන් සම්බන්ධව විධානයක් කොමිෂන් සභාව විසින් මෙම වසර තුළදී නිකුත් කරන ලදී.

## අනුමැතිය පිරිනැමීම

### විශ්වීය කලාපීය සහ රාෂ්ඨ අරමුදල් සඳහා අනුමැතිය පිරිනැමීම

මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් කොමිෂන් සභාවට ලබාදෙන නිර්දේශය මත පදනම්ව, විශ්වීය කලාප සහ රාෂ්ඨ අරමුදල්වලට, මෙරට කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත පොදු සමාගම් වල ආයෝජනය කිරීම සඳහා අනුමැතිය ලබාදෙනු ලැබේ. එසේ ලබාදෙන අනුමැතිය 2006 අංක 05 දරන මුදල් නිශෝධනය කිරීම වැළැක්වීමේ පනත, 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, විනිමය පාලන රෙගුලාසි සහ සුරැකුම්පත් සම්බන්ධයෙන් මෙරට ක්‍රියාත්මක වන අනෙකුත් නීති සහ රෙගුලාසිවලට යටත්ව පිරිනමනු ලබයි.

2013 වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් එවැනි අරමුදල් 178 ක් සඳහා අනුමැතිය පිරිනමන ලද, අනුමැතිය පිරිනැමූ අරමුදල් 32 ක නම් වෙනස් කිරීම්ද සටහන් කරන ලදී.

### සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ පරිපාලනය කිරීම

අර්පනලාභියා ලැයිස්තුගත පොදු සමාගමක් වන අවස්ථාවල දී සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීම් සම්බන්ධයෙන් 1995 සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය (2003 වසරේදී සංශෝධිත) අදාළ වේ. සංග්‍රහය මගින් පවරා ගැනීමකට යටත් වන සමාගමක එක සමාන වර්ගයේ කොටස්කරුවන් සියලු දෙනාටම එක හා සමාන ලෙස සලකන බවට සහතික වන අතර, සංග්‍රහයේ රීති හරහා අර්පනලාභී සමාගමේ කොටස්කරුවන් වෙත සිය සමාගමේ පවරා ගැනීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයකට එළැඹීම සඳහා අවශ්‍ය කරන තොරතුරු සහ උපදෙස් ප්‍රමාණවත් ලෙස නිසි වෙලාවට ලැබෙන බවට සහතික වේ. ලැයිස්තුගත සමාගමක් අත්පත් කර ගැනීමේ දී එය සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව සිදුවන බවට අපි සහතික වන්නෙමු.

සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ අනිවාර්ය අර්පන පහක් සහ ස්වේච්ඡා අර්පනයන් දෙකක් මෙම වසර තුළ කොමිෂන් සභාවේ නියාමනයට යටත්ව සිදුකරන ලද අතර ඒවායේ විස්තර පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 06)

සංඛ්‍යා සටහන 06: වසර තුළදී සමාගම් පවරාගැනීම් සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ සිදුකළ අර්පන

| අර්පනකරු | අර්පනලාභියා | අර්පනයේ ස්වභාවය |
|---|---|---|
| ලංකා කොමොඩිටි බ්‍රෝකර්ස් ලිමිටඩ් | ඒසියා සියාකා කොමොඩිටීස් පීඑල්සී | අනිවාර්ය අර්පනය |
| රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී | ලංකා සෙරමික් පීඑල්සී | අනිවාර්ය අර්පනය |
| හේමාස් මැනුෆැක්චරින් ප්‍රයිවට් ලිමිටඩ් | ජේ. එල්. මොරිසන් සන්ස් ඇන්ඩ් ජෝන්ස් (සිලෝන්) පීඑල්සී | අනිවාර්ය අර්පනය |
| එල් ඔ එල් සී, මයික්‍රෝ ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් සහ බිරැක් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් (ඒකාබද්ධ අර්පනය) | නන්ද ඉන්වෙස්ට්මන්ඩ් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | අනිවාර්ය අර්පනය |

| අර්පනකරු | අර්පනලාභියා | අර්පනයේ ස්වභාවය |
|---|---|---|
| ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | ඔරියන්ට් ගාමන්ට්ස් පීඑල්සී | අනිවාර්ය අර්පනය |
| ඒ අයි ඒ කම්පැනි ලිමිටඩ් හොංකොං | ඒ අයි ඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී (කලින් අවිවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පීඑල්සී) | ස්වේච්ඡා අර්පනය |
| හේමාස් මැනුෆැක්චරින් ප්‍රයිවට් ලිමිටඩ් | ජේ එල් මොරිසන්ස් සන්ස් ඇන්ඩ් ජෝන්ස් (සිලෝන්) පීඑල්සී | ස්වේච්ඡා අර්පනය |

## සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ (28 අ) වගන්තිය යටතේ පිරිනමන අනුමැතීන්

කොටස් වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත වීම සඳහා අපේක්ෂා කරනු ලබන සෑම සමාගමක්ම එසේ ලැයිස්තුගත වීමට අපේක්ෂා කරන දිනට පෙර වසරක කාල සීමාවක් තුළදී යම් පුද්ගලයෙකු හට කොටස් බෙදාහැරීමක් සිදුකර ඇත්නම් කොමිෂන් සභාවේ ලිඛිත අවසරයක් මත හැර එකී කොටස් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ නොහැක. එකී වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාව පහත සඳහන් අනුමැතීන් 2013 වසර තුළදී ප්‍රදානය කරන ලදී.

* අනිලානා හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපර්ටි ලිමිටඩ්

* අමානා බෑන්ක් ලිමිටඩ්

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ පිරිනමන අනුමැතීන්

ලැයිස්තුගත සමාගමක් විසින් ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් නිකුත් කිරීමේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

අදාළ වසර තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (ආ) වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීමට කාර්යාංශයට බලය පැවරීමට නිර්නායක නිර්මාණය කරන ලදී.

පහත සඳහන් ආයතන සඳහා මෙම වර්ෂය තුළදී කොමිෂන් සභාව උක්ත අනුමැතීන් ප්‍රදානය කරන ලදී. (සංඛ්‍යා සටහන 07)

**සංඛ්‍යා සටහන් 07: සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ පිරිනමන අනුමැතීන්**

| ආයතනයේ නම | නිකුතුවේ ස්වභාවය | සුරැකුම්පත් වර්ගය | අනුමත කරන ලද මුදල | කාලසීමාව |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | පුද්ගලික පැවරුම | ජාත්‍යන්තර ණයකර | ඇ. ඩො. මි. 500 | වසර 05 |
| ඩී. එෆ්. සී. සී. බැංකුව | පුද්ගලික පැවරුම | ජාත්‍යන්තර ණයකර | ඇ. ඩො. මි. 250 | වසර 10 |
| එන්. ඩී. බී. බැංකුව | පුද්ගලික පැවරුම | ජාත්‍යන්තර ණයකර | ඇ. ඩො. මි. 250 | වසර 10 |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී. එල්. සී. | පුද්ගලික පැවරුම | ලැයිස්තුගත නොකළ, ජ්‍යෙෂ්ඨ අනාරක්ෂිත නිදහස් කළ හැකි ණයකර | රු. මි. 500 අධිදායකත්වයකදී තවත් රු. මි. 750 | වසර 04 |
| එන්. ඩී. බී. කැපිටල් හෝල්ඩින්ග්ස් පී. එල්. සී. | පුද්ගලික පැවරුම | ලැයිස්තුගත නොකළ, නිදහස් කළ හැකි වරණීය කොටස් | රු. මි. 300 | උපරිම වසර 8 ක් දක්වා (උපරිම මාස 18 සහන කාලයක් සහිතව) |

## වෙළෙඳ භූමියෙන් බැහැර කොටස් ගණුදෙනු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 28 (1) වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක ලැයිස්තුගත කරන පොදු සමාගමක කොටස් දරණ කිසියම් තැනැත්තෙකු, විසින් බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක් විසින් යොදා ගනු ලබන කාර්යය පටිපාටියට අනුකූල නොවන ලෙස, එකී කොටස් මිල දී ගැනීම, විකිණීම හෝ ගනුදෙනු කිරීමේ කාර්යයන් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව නොකළ යුතුයි.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දී විශේෂිත ගනුදෙනු 455 ක් සහ කොටස් ත්‍යාග පැවරුම් 158 ක් සඳහා අනුමැතිය ප්‍රදානය කෙරිණි.

මෙහිදී විශේෂිත ගනුදෙනු යටතට ආන්තික ගනුදෙනු, අනිවාර්ය අර්පනයන්, ස්වේච්ඡා අර්පනයන්, සමාගම් ලේඛනයෙන් බැහැර කිරීම් තනි හිනුමකින් ඒකාබද්ධ හිනුමකට පැවරීම සහ දත්ත පිවිසුම්, වැරදි නිවැරදි කිරීම් අයත් වේ.

## සුපරීක්ෂණය සහ අනුකූලතාවය

මනාව ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වෙළෙඳපොළකට විශ්වාස හා ස්ථාවරත්වය අත්‍යවශ්‍ය සාධකයන් වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ තුළ පවතින අවදානම් අවම මට්ටමකට ගෙන ඒමටත්, වෙළෙඳපොළ ඵලදායීව නියාමනය කිරීමටත් නිරන්තරයෙන් උත්සාහ කරමින් සිටියි. වෙළෙඳපොළ අතරමැදියන් විසින් ද්‍රවශීලතා සීමාවන් හා හෙළිදරව් කිරීම් වැනි නිසි ප්‍රමිතීන් පිළිපදිමින් තම ව්‍යාපාර කටයුතු වල නියැලෙන්නේද යන්න ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විමසිල්ලෙන් පසුවෙයි.

### ලැයිස්තුගත සමාගම් සුපරීක්ෂණය

සියලු  ලැයිස්තුගත සමාගම් විසින් මූල්‍ය වර්ෂය අවසානයේ සිට පස් මසක් තුළ ඔවුන්ගේ වාර්ෂික වාර්තා සිය කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් වෙළෙඳපොළට ඉදිරිපත් කළ යුතු වේ.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලැයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා විමර්ශනය කිරීමත්, අනුකූලතාවයන් එකී සමාගම් වෙත දැනුම් දෙයි. ලැයිස්තුගත සමාගම්, සභාවේ මෙම ක්‍රියාදාමයට ඉහළ ප්‍රතිචාර දක්වා ඇත.

ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය වාර්තාකරණය සහ තොරතුරු බෙදාහැරීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම මෙම ක්‍රියාවන්හි අරමුණ වේ. සුරැකුම්පත් වෙළෙඳපොළෙහි වගකීම හා විනිවිදභාවය ගොඩනැංවීම උදෙසා වන වෘත්තීය ප්‍රමිත මට්ටම් පවත්වා ගැනීම, ප්‍රමාණවත් තොරතුරු අප්‍රමාදව බෙදා හැරීමත් ලැයිස්තුගත සමාගම් විසින් සිදුකළ යුතු බවට අපේක්ෂා කෙරේ.

වාර්ෂික වාර්තා විමර්ශනයේදී පහත අංශ වෙත  අවධානය යොමු කරනු ලබයි.

* කොළඹ කොටස් වෙළෙඳපොළ නියමනයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සම සමාගම් පනතේ අදාළ විධිවිධාන සඳහා වන අනුකූලතාවයන්
* මූල්‍ය අවධාරණයන්
* සභාපතිවරයාගේ වාර්තාව
* සාංගමික යහ පැවැත්ම පිළිබඳ භාවිතයන්
* අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
* විගණන වාර්තාව
* කොටස් හිමියන්ගේ හා ආයෝජකයන්ගේ තොරතුරු
* මූල්‍ය  දත්ත

වසර තුළදී ලැයිස්තුගත සමාගම් 70 ක වාර්ෂික වාර්තා විමර්ශනය ආරම්භ කරන ලදුව එයින් 65 ක් විමර්ශනය අවසන් කර ඇත. මීට අදාළව විවේචනාත්මක ලිපි 38 ක් නිකුත් කර තිබේ.

### වෙළෙඳපොළ සහභාගිකරුවන් අධීක්ෂණය

### කොටස් තැරැව්කාර සමාගම්

ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනැගීම සහ ආරක්ෂා කිරීම සඳහා වෙළෙඳපොළ අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම පිණිස එතැන් සහ විතැන් අධීක්ෂණ ක්‍රම වේදයන් තුළින් බලපත්‍රලාභී ආයතනයන්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ශඛ්‍යතාවය තහවුරු කිරීම අධීක්ෂණ අංශයේ මූලික අරමුණ වේ.

කොටස් තැරැව්කාර සමාගම්වල එතැන් පරීක්ෂාවන් (on-site inspections) සිදුකරනු ලබන්නේ අදාළ නීති හා රෙගුලාසින්ට අනුකූලවීම අවධාරණය කරමින් විචක්ෂණ, ද්‍රවශීලතා, මූල්‍ය, ණය, නීතිමය සහ මෙහෙයුම් අවධානම වැනි විවිධ අවදානම් ක්ෂේත්‍රයන් කේන්ද්‍රකරගත් අවදානම් පදනම් වූ ප්‍රවේශයක් මගිනි. 2013 වසර තුළදී කොටස් තැරැව්කාර සමාගම්වල අභ්‍යන්තර පාලන පටිපාටීන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ඇතුළත් කරමින් එතැන් පරීක්ෂා විගණන වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කරන ලදී. 2013 වසරේදී සියලුම බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම් සඳහා එතැන් පරීක්ෂාවන් පැවැත්වීමට අධීක්ෂණ අංශයට හැකිවිය.

මාසික ගිණුම් වාර්තා සහ අනුකූලතා වාර්තා පදනම් කර ගනිමින් විතැන් පරීක්ෂා (off-site reviews) සිදුකරනු ලබයි. නීති හා රෙගුලාසීන්ට අනුකූල නොවීම් සහ තැරැව්කාර සමාගම් අසමත්වීමට ඇති අවදානම වැඩි වශයෙන් අරමුණු කර ගනිමින් විතැන් පරීක්ෂා පැවැත්වේ. එහිදී අනාවරණය කරගනු ලබන අනුකූල නොවීම් සහ විෂමතාවයන් නිවැරදි

කිරීම සඳහා අදාළ සමාගම්වලට දැනුම්දී ඇත. එසේම කොටස් තැරැව්කාර සමාගම් විසින් සති දෙකකට වරක් ඉදිරිපත් කරනු ලබන "ණයගැති ප්‍රකාශනය" මගින් ණය අවදානම වඩාත් සමීපව පරීක්ෂා කරනු ලැබේ.

2012 වසර සමග සන්සන්දනය කිරීමේදී 2013 වසර තුළදී කොටස් තැරැව්කාර කර්මාන්තයේ මුළු පිරිවැටුම මන්දගාමී විය. එම නිසා 2013 වර්ෂයේදී ශුද්ධ අලාභය තවදුරටත් වර්ධනය වී ඇත. කොටස් තැරැව්කාර සමාග ම්වල කාර්යසාධනය ඇතුළත් සංසන්දනාත්මක සංඛ්‍යා ලේඛනය පහතින් දක්වා ඇත. (සංඛ්‍යා සටහන 08)

### සංඛ්‍යා සටහන 08: කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්යසාධනය

| | 2013 (රු.'000) | 2012 (රු.'000) | වෙනස % |
|---|---|---|---|
| පිරිවැටුම | 1,745,186 | 1,921,489 | -9.2% |
| ශුද්ධ තැරැව්කාර ගාස්තුව | 1,541,338 | 1,756,498 | -12.2% |
| මෙහෙයුම් අලාභය | (619,374) | (436,094) | 42.0% |
| වෙනත් ආදායම් | 810,282 | 786,300 | 3.0% |
| බදුවලට පෙර ශුද්ධ අලාභය | (711,484) | (557,819) | 27.5% |
| බදුවලට පසු ශුද්ධ අලාභය | (711,091) | (299,234) | 137.6% |
| මුළු වත්කම්* | 10,265,557 | 10,781,900 | -4.8% |
| මුළු වගකීම් * | 4,462,858 | 4,308,204 | 3.6% |
| ශුද්ධ ප්‍රාග්ධනය* | 4,742,514 | 4,926,718 | -3.7% |

* 2013.12.31 දෙසැම්බර් දිනට

මූලය : සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන.

## ඒකක භාර කර්මාන්තය

ඒකක භාර කර්මාන්තය සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීමේ අදහස් පෙරදැරිව අයවැයෙන් ලබාදුන් බදු සහන හේතුවෙන් සීඝ්‍රයෙන් වර්ධනය කරා යන ගමනක් එකී කර්මාන්තයෙහි පසුගිය වර්ෂයේදී දැක ගන්නට ලැබිණි.

එකී සංවර්ධනයට සමගාමීව තම නියාමන බලතල තවදුරටත් දැඩි කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පියවර ගන්නා ලදී.

සාමාන්‍ය ගනුදෙනු කරුවන්ට ආයෝජනය කිරීමට මාර්ග යක් ලබාදීමේ අරමුණින් ඇති කරන ලද ඒකක භාරවල එකී අරමුණ තවදුරටත් තහවුරු කරමින් එක් ඒකක භාරයක් පවත්වා ගත යුතු අවම ඒකක භාර ආයෝජකයින් සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් නියම කරන ලදී.

තවදුරටත් ශ්‍රී ලංකා ඒකක භාර සංගමයේ ඉල්ලීම පරිදි ස්ථාවර ආදායම් සුරැකුම්පත් වල දෛනික ඇගයීම් ක්‍රමවේදයෙහි නිරවද්‍යභාවය හා ඒකාකාරීත්වය රැකීම උදෙසා කොමිෂන් සභාව විධානයක් නිකුත් කරන ලදී.

2013 වසරේදී ඒකක භාර කළමනාකරණ ආයතන 13 සඳහා පවත්වන ලද අවදානම් මූලික ක්ෂේත්‍රගත අධීක්ෂණයන් හරහා නියාමන අධීක්ෂණය දැඩි කරන ලදී.

ඒකක භාර කළමනාකරණ ආයතනයක මූල්‍ය ශක්තිය මැන බැලීම සඳහා එකී ආයතනයේ මෙහෙයුම් හා කළමනාකරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මතාවය අභ්‍යන්තර පාලන ක්‍රමවේදයට ඇති අනුකූලතාවය, යහපාලනය, තොරතුරු පද්ධතිය හා රීති නියාමන රෙගුලාසි සඳහා එකී ආයතනයේ පවතින විධිවිධාන, අවදානම් මූලික ක්ෂේත්‍ර අධීක්ෂණය මගින් සොයා බලන ලදී.

ඒකක භාර කළමනාකරණ ආයතන විසින් කොමිෂන් සභාව මගින් නියම කරන ලද අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරන්නේද යන වග හා එකී ආයතනවල මූල්‍ය ස්ථාවරත්වය මැන බැලීම විගණනය නොකරන ලද මාසික මූල්‍ය වාර්තාවන් පරීක්ෂාවට ලක් කිරීමෙන් අධීක්ෂණය කරන ලදී.

ඒකකභාර වල ද්‍රවශීලතාවය හා භාරයේ අනාවෘත මට්ටම් ඒකක භාර සංග්‍රහය, භාර ඔප්පුව හා කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද විධානයන්ට අනුකූලව පවතින්නේද යන වග මාසික වාර්තා මගින් තහවුරු කර ගන්නා ලදී.

## වෙළෙඳපොළ අතරමැදියන්

ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගිකරුවන් ලෙස ක්‍රියාකාරී වීම සඳහා වෙළෙඳපොළ අතරමැදියන් ලෙස කාණ්ඩ 5 ක් යටතේ එනම් ආන්තික ණය සැපයුම්කරුවන්, ආයෝජන කළමනාකරුවන්, ණය ප්‍රමාණීකරණ ආයතන, ප්‍රාරක්ෂකයින් හා නිෂ්කාශන ආයතන ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බලාත්මක කොට ඇත.

2013 වසරේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හි ප්‍රධාන අරමුණ වූයේ වෙළෙඳපොළ අතරමැදියන්ගේ ක්‍රියාපටිපාටි අධීක්ෂණය තවදුරටත් විධිමත් කිරීමයි. තවදුරටත් ආයෝජකයන්ගේ නිසි රැකවරණ

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

සහතික කිරීම මෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයෙහි ප්‍රගමණය සඳහා ඉවහල් වන නීති පද්ධතීන් හා නව ක්‍රියා පටි පාටින් දියත් කරන ලදී.

තවද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අවදානම් පදනම් කරගත් නිරීක්ෂණය ක්‍රියා පටිපාටීන් වෙළෙඳපොළ අතරමැදියන් අධීක්ෂණය කිරීම සඳහා යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තවදුරටත් අවදානම් මූලික කරගත් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුකූලතා හා අවදානම් තක්සේරු කරන ප්‍රශ්න මාලාවක් නිර්මාණය කරන ලදී. ඒ ක්‍රියා පටිපාටිය. වෙළෙඳපොළ තුළ වැඩිම අනුකූලතා අවදානමක් ආයෝජකයක් කෙරෙහි ඇතිකරන ක්‍රියාවන් සහ වෙළෙඳපොළ ඍජු සහයෝගිතාවයට හානි කරන ක්‍රියාවන් හඳුනාගැනීම මූලික කර ගත්තකි.

තවද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් වෙළෙඳපොළ අතරමැදියන්ගේ ද්‍රවශීලතාවය හා මූල්‍යමය තත්ත්වයන්ගේ අවදානම් අනාවරණය හඳුනාගැනීම සඳහා විතැන් අධීක්ෂණය සවිමත් කරන ලදී; ඒ තුලින් වෙළෙඳපොළ අතරමැදියන්ගේ අවදානම් කළමනාකරණ පරිචය සවිමත් කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හි අරමුණ විය.

වෙළෙඳපොළ සවිබල ගැන්වීමේ තවත් ඉදිරි පියවරක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අතරමැදියන් නියාමනය කරන නීති පද්ධතිය තවදුරටත් සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමුකරන ලදී. මේ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව "බැංකු පනතේ 2011 හි අංක 5 හා 6 දරන යොමුව" යටතේ ලියාපදිංචි වාණිජ බැංකු හා විශේෂිත බැංකුවල කොටස් වෙළෙඳපොළ කෙරෙහි අවදානම් අනාවරණය සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කෙරෙහි ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. එම ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව ආන්තික ණය සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි වාණිජ බැංකු හා විශේෂිත බැංකුවලට ආන්තික ණය සැපයුම් කරුවන් අනුකූල වන වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කරන නීති පද්ධතියන් අනුගමනය කිරීමට ඉඩ හරින ලදී. (සංඛ්‍යා සටහන 09:)

සංඛ්‍යා සටහන 09: වෙළෙඳපොළ අතරමැදියන්ගේ මූල්‍ය කාර්ය සාධනය * (රු.)

| කාණ්ඩය | මුළු ආදායම රු. | මුළු බදුපෙර ලාභය රු. | මුළු වත්කම් රු | මුළුවගකීම් රු. |
|---|---|---|---|---|
| ආන්තික සැපයුම්කරුවන් | 384,458,673 | 76,035,571 | 1,123,456,037 | 233,560,981 |
| ආයෝජන කළමනාකරුවන් | 321,825,371 | (261,710,169) | 6,774,620,969 | 4,540,264,146 |
| ප්‍රාරක්ෂකයින් | 1,588,877,000 | 1,463,141,938 | 15,029,785,000 | 79,999,000 |
| ණය ප්‍රමාණිකරණ ආයතන | 136,390,529 | 46,673,543 | 305,233,219 | 78,644,516 |
| බහු කාර්ය ආයතන** | 1,192,374,673 | 401,614,460 | 8,110,404,395 | 2,732,279,236 |
| එකතුව | 3,623,926,246 | 1,725,755,342 | 31,343,499,620 | 7,664,747,879 |

* කර්මාන්තයෙහි සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පාලනය වන බලපත්‍රලාභී බැංකු, ලියාපදිංචි ගත මූල්‍ය ආයතන සහ විශේෂිත කල්බදු සමාගම්වලට අදාළ තොරතුරු හැර ඉහත මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත.

** බහු කාර්ය ආයතන යනු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් පාලනය වන කාර්යයන් කිහිපයක ක්‍රියාකාරීවීම සඳහා ලියාපදිංචි ප්‍රදානය කර ඇති ආයතන වේ.

## ආවේක්ෂණ කටයුතු, විමර්ශන කටයුතු සහ නීති ක්‍රියාත්මක කිරීම

### ආවේක්ෂණ කටයුතු


සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සිදුවන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් සමස්ත ආවේක්ෂණ කටයුතුවල වගකීම දරන අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත උල්ලංඝනය වන ආකාරයේ සිදුවන ගනුදෙනු අනාවරණය කරගෙන ඒවා වලකාලීමට පියවර ගනු ලැබේ. මිල ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය කෙරෙහි අනිසි බලපෑම් කරනු ලබන වෙළෙඳපොළ කටයුතු දිනපතා අධීක්ෂණය කිරීම ආවේක්ෂණ විෂය පථයෙහි මූලික කාර්යභාරය වේ. නවීන වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් යොදා ගනිමින්, සජීවීව, වෙළෙඳපොළ ගනුදෙනු අධීක්ෂණය කිරීම මෙහිදී සිදුකරනු ලබයි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, 2013 වසර තුළදී විවිධ වෙළෙඳපොළ අක්‍රමිකතා සම්බන්ධයෙන් ආවේක්ෂණ වාර්තාවන් 14ක් පිළියෙල කොට ඇත. වැඩිදුර විශ්ලේෂණය සඳහා කොළඹ කොටස් හුවමාරුවෙන් මෙම වසර තුළදී ලැබුනු ආවේක්ෂණ වාර්තාවන් ගනන 17 කි. (සංඛ්‍යා සටහන 10, රූප සටහන 11)

සංඛ්‍යා සටහන 10: ආවේක්ෂණ වාර්තාවන්

| සැක කටයුතු අක්‍රමිකතා | # |
|---|---|
| සාංගමික අභ්‍යන්තර පුද්ගලයන් විසින් සිදුකළ ගනුදෙනු | 04 |
| පෙරවිකුණුම් ගනුදෙනු | 03 |
| ව්‍යාජ වෙළෙඳපොළ තත්වයන් | 05 |
| වෙනත් | 02 |
| එකතුව | 14 |

රූප සටහන 11: ආවේක්ෂණ සොයාගැනීම්




පසුගිය වසර කීපය හා සසඳන කළ, 2013 වසරේ දී පිළියෙල කරනු ලැබූ ආවේක්ෂණ වාර්තාවන්හි අඩුවීමක් දක්නට ඇත. වඩා වැදගත් හා සැලකිය යුතු ලෙස වෙළෙඳපොළට බලපෑමක් එල්ල කරනු ලැබූ අයතා ගණුදෙනු සම්බන්ධයෙන් වූ සිද්ධීන්වලට ප්‍රමුඛතාවයක් දී ඒ හා අදාල ආවේක්ෂණ වාර්තාවන් පමණක් පිළියෙල කිරීම. මෙම අඩුවීම කෙරෙහි ප්‍රධානව බලපා ඇත. ආවේක්ෂණ වාර්තාවන්ට අමතරව සිදුකරනු ලැබූ සියලු වෙළෙඳපොළ ගනුදෙනු අධික්ෂණයෙන් අනාවරණය කරනු ලැබූ අක්‍රමිකතාවයන් බහුතරය ආවේක්ෂණ යොමුව ලෙස වර්ගීකරණය කොට ඇත. 2013 වසරේදී එලෙස හඳුනාගත් අක්‍රමිකතාවයන් 400 ක් ඉක්මවා යන අතර ඒ සියල්ල ලේඛන ගත කොට ඇත. හඳුනාගත් අක්‍රමිකතාවයන්ගේ ස්වභාවය අනුව "ආවේක්ෂණ යොමුව" හි ඇති සිද්ධීන් මත සම්පූර්ණ ආවේක්ෂන වාර්තාවන් පිළියෙල නොකරන නමුත් ඒවා වැඩිදුර විශ්ලේෂණය කොට තවදුරටත් අධීක්ෂණය කරනු ලබයි.

අවධාරණය කරගනු ලැබූ අයථා ගනුදෙනු සම්බන්ධයෙන් වූ කොටස් හා ආයෝජන උපදේශකවරුන් සම්බන්ධයෙන් දිගින් දිගටම අධීක්ෂණයට භාජනය කරන අතර එහි සැලකිය යුතු ප්‍රවනතාවයක් ඇත්නම් ඒ හා සම්බන්ධයෙන් සම්පූර්ණ ආවේක්ෂණ වාර්තාවන් පිළියෙල කොට ඇත. ආවේක්ෂණ යොමුවේ ඇති සිද්ධීන් විශාල ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට මූලිකවම උපකාරී වූයේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතුව පවතින පුළුල් ස්වයංක්‍රීය වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියේ ඇති මහා ක්‍රියාකාරීත්වයත් ඉන් සපයා ගත හැකි විශාල අමතර දත්ත ප්‍රමාණයන් හා විශ්ලේෂණ ක්‍රමවේදයන් නිසාවෙනි.

මේ වසරේ ආවේක්ෂණ වාර්තාවන් අඩුවීම කෙරෙහි බලපා ඇති තවත් සාධකයක් වන්නේ, සංසන්දනාත්මකව බලන කල අඩු වාර්ෂික පිරිවැටුමක් හා අඩු වෙළෙඳපොළ ගනුදෙනු තත්ත්වයක් යටතේ පැවති සුළු පරිමාන ආයෝජකයන්ගේ අඩු ක්‍රියාකාරීත්වයයි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආයතන ප්‍රධානි/නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සැදුම් ලත් ආවේක්ෂණ කමිටුව මේ වසරේ අවස්ථාවෙන් 7 කදී රැස්වී ආවේක්ෂණ වාර්තාවන් සාකච්ඡා කොට ඇත. සුළු පරිමානයෙන් වූ වෙළෙඳපොළ අක්‍රමිකතා සම්බන්ධයෙන් ඒ හා අදාළ පාර්ශවයන් කමිටුව වෙත කැඳවා සාකච්ඡා කොට කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ඉදිරියේදී එවැනි අක්‍රමවත් ගනුදෙනුවලින් වැළකී සිටින ලෙස උපදෙස් දෙන ලදී. කමිටුවේ නියෝගයන්ට යටත්ව, අනුමාන

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

කරගනු ලැබූ වෙළෙඳපොළ අක්‍රමිකතාවයන්ට සහභාගි වූ පාර්ශවයන් 8 ක ගෙන් කරුණු පැහැදිලි කිරීම් ලබාගෙන ඇත. පසුව ඔවුන්ගෙන් ලැබුණු පිළිතුරු විස්තර කිරීම් නැවත කමිටුව වෙත යොමුකරන ලදී. මේ වසරේ පිළියෙල කරනු ලැබූ සමස්ත ආවේක්ෂණ වාර්තාවන්ගෙන් 2 ක් පූර්ණ විමර්ශනයක් සඳහා විමර්ෂන අංශය වෙත යොමුකරනු ලැබුයේ කොමිෂන් සභාවේ අනුමැතියෙන් පසුවයි.

## විමර්ශන කටයුතු

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීමේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යභාරයේ ප්‍රධාන අංගයක් වන්නේ සුරැකුම්පත් වෙළෙඳපොළේ සිදුවන සැක කටයුතු අක්‍රමිකතා සම්බන්ධයෙන් කාර්යක්ෂම විමර්ශනයක් සිදු කිරීමයි. ඉහත කී විමර්ශන, ක්‍රමවත් හා සාධාරණ සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීමට ඉවහල් වන අතර, වෙළෙඳපොළ පිළිබඳ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ සංවර්ධනයටද දායක වේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතින් ලබාදී ඇති බලතල ප්‍රකාරව, 2013 වර්ෂයේදී ද සැක කටයුතු වෙළෙඳපොළ අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ ඒවාට අදාළව සුදුසු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම කොමිෂන් සභාව විසින් සිදුකරන ලද අතර, එකී ක්‍රියාමාර්ග වෙළෙඳපොළට අදාළ වෘත්තීන්ගේ ගුණාත්මකභාවය සහ ලැයිස්තුගත සමාගම්වල ක්‍රියා පිළිවෙත ඉහළ තලයක පවත්වාගෙන යෑමට සහ ආයෝජකයන්, ලැයිස්තුගත සමාගම් සහ වෙළෙඳපොළ අතරමැදියන් නීති විරෝධී ක්‍රියාවන්හි නියැලීමෙන් වැළැක්වීමට බෙහෙවින් ඉවහල් විය.

ව්‍යාජ වෙළෙඳපොළ/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම, අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගනුදෙනු, පෙර විකිණීම් ඇතුළු සුරැකුම්පත් වෙළෙඳපොළේ සිදුවන අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් විමර්ශන 15 ක් 2013 වර්ෂය තුළදී සිදුකරන ලදී. මීට අමතරව 2012 වසරේදී ආරම්භ කර විමර්ශන කටයුතු අවසාන කරන ලද විමර්ශනයක් සම්බන්ධයෙන් උපදෙස් ගරු නීතිපතිවරයාගෙන් එම වසරේදීම ඉල්ලා සිටින ලද අතර අදාළ උපදෙස් 2013 වර්ෂය අවසාන වන විටත් ලැබීමට නියමිතව තිබිණි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ ඒ යටතේ පනවන ලද නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගණනාවක්ද 2013 වර්ෂය තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගන්නා ලදී.

ආවේක්ෂණ වාර්තා 9 ක් අළලා ව්‍යාජ වෙළෙඳපොළ/ මිල තත්තවයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සිදුකළ විමර්ශනයත් අවසානයේදී ආයෝජන උපදේශකයන් 4 දෙනෙකුට ලිඛිතව අවවාද කරන ලද අතර එම ලිඛිත අවවාදයන් කොමිෂන් සභා වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධියට පත්කරන ලදී. අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගනුදෙනු සිදුකිරීම සම්බන්ධයෙන් සිදුකළ විමර්ශනයකින් පසුව එක් ආයෝජකයකුට ලිඛිතව අවවාද කරන ලද අතර ලැයිස්තුගත සමාගමකට ලිඛිත අනතුරු හැඟවීමක් සිදුකරන ලදී.

පෙර විකිණීම් සම්බන්ධයෙන් සිදුකරන ලද තවත් විමර්ශනයක් අවසානයේදී එක් ආයෝජන උපදේශකයකුට ලිඛිතව අනතුරු හැඟවීමක් සිදුකරන ලදී.

2013 වර්ෂය අවසානය වන විට සිදුකරන ලද/සිදු කෙරෙමින් පැවති විමර්ශනයන් සම්බන්ධව කෙටි විස්තරයක් සහ ඒවාට අදාළව ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු වගුවේ දැක්වේ. (සංඛ්‍යා සටහන 11)

සංඛ්‍යා සටහන 11: විමර්ශන පිළිබඳ තොරතුරු

| විමර්ශනයේ ස්වභාවය | විමර්ශන සංඛ්‍යාව | ගනු ලැබූ පියවර/වර්තමාන තත්වය |
|---|---|---|
| අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගනුදෙනු[1] | 4 | • 2012 වර්ෂ අවසානය වන විට අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගනුදෙනු සම්බන්ධයෙන් විමර්ශන 3 ක් සිදු කෙරෙමින් පැවතිණි.<br>- ඉහතකී එක් විමර්ශනයකින් හෙළිදරව් වූ කරුණු පදනම කොට ගෙන 2013 වර්ෂයේදී එක් පුද්ගලයකුට ලිඛිතව අවවාද කරන ලද අතර අදාළ ලැයිස්තු ගත සමාගම වෙත අනතුරු හැඟවීමේ ලිපියක් නිකුත් කරන ලදී.<br>- ඉහත කී තවත් විමර්ශනයකට අදාළ විමර්ශන වාර්තාව 2013 නොවැම්බර් මස පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමට ඉදිරිපත් කරන ලදී.<br>- අවශේෂ විමර්ශනයට අදාළ විමර්ශන වාර්තාව 2013 දෙසැම්බර් මස අවසන් වන විට සකස් කෙරෙමින් පැවතිණි.<br>• අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගනුදෙනු සම්බන්ධයෙන් එක් විමර්ශනයක් 2013 වසරේදී ආරම්භ කරන ලදී. එම විමර්ශනය 2013 වසර අවසන් වන විට සිදු කෙරෙමින් පැවතිනි. |
| ව්‍යාජ වෙළෙඳපොළ /මිල තත්ත්වයක් නිර්මාණය කිරීම[2] | 6 | • එකම ආයෝජන උපදේශකයන් කණ්ඩායමක් විසින් සිදුකරන ලදැයි සැක කරන ලද ව්‍යාජ වෙළෙඳපොළ /මිල තත්ත්වයක් නිර්මාණය කිරීම පිළිබඳ ආවේක්ෂණ වාර්තා 9 ක් සම්බන්ධයෙන් එක් පරිපූර්ණ විමර්ශනයක් 2011 සහ 2012 වර්ෂයන්හිදී සිදුකරන ලදී. එම විමර්ශනයට අදාළ වාර්තාව 2013 වර්ෂයේදී නිම කරන ලද අතර විමර්ශනයෙන් හෙළිදරව් වූ කරුණු මත අදාළ ආයෝජන උපදේශකයන් කණ්ඩායමේ සිටි ආයෝජන උපදේශකයන් 4 දෙනෙකුට ලිඛිතව අවවාද කරන ලදී. අදාළ අවවාදයන් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධියට පත් කරන ලදී.<br>• 2013 වර්ෂයට පෙර ආරම්භ කරන ලද ව්‍යාජ වෙළෙඳපොළ/මිල තත්ත්වයක් නිර්මණය කිරීම පිළිබඳ විමර්ශන 4 ක් අදාළ ආයෝජකයන්/ආයෝජන උපදේශකයන් එම වරද සිදුකළ බව සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි හෙළිදරවු නොවූ බැවින් 2013 වර්ෂයේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව අවසන් කරන ලදී.<br>• 2013 වර්ෂය තුළදී ව්‍යාජ වෙළෙඳපොළ /මිල තත්ත්වයන් නිර්මාණය කිරීම පිළිබඳ තවත් විමර්ශනයක් ආරම්භ කරන ලද අතර එම වසර අවසාන වන විට අදාළ විමර්ශනය සිදු කෙරෙමින් පැවතිණි. |
| පෙර විකිණීම්[3] | 02 | • 2012 වසර අවසාන වන විට පෙර විකිණීම් සම්බන්ධයෙන් එක් විමර්ශනයක් සිදු කෙරෙමින් පැවතිණි. ඉහත කී විමර්ශනයෙන් හෙළිදරව් වූ කරුණු පදනම් කොට ගෙන 2013 වසරේදී එක් පුද්ගලයකුට ලිඛිත අනතුරු හැඟවීමක් සිදු කරන ලදී.<br>• පෙර විකිණීම් පිළිබඳ තවත් විමර්ශනයක් 2013 වර්ෂයේදී ආරම්භ කරනලද අතර එම වසර අවසන් වන විට අදාළ විමර්ශනය සිදුකෙරෙමින් පැවතිණි. |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

| විමර්ශනයේ ස්වභාවය | විමර්ශන සංඛ්‍යාව | ගනු ලැබූ පියවර/වර්තමාන තත්වය |
| --- | --- | --- |
| කොටස් තැරැව්කාර සමාගමක් විසින් සිදු කරන ලද සැකකටයුතු අයගේ ගනුදෙනු පිළිබඳ විමර්ශනය | 01 | • අදාළ විමර්ශනය 2012 වසරේදී ආරම්භ කර එම වසර තුළදීම අවසන් කරන ලද අතර, අදාළ විමර්ශනයෙන් හෙළිදරව් වූ කරුණු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිර්දේශය මත සහ කොමිෂන් සභා සාමාජිකයන්ගේ උපදෙස් අනුව ගරු නීතිපතිවරයාගේ උපදෙස් සඳහා යොමු කරන ලදී.<br><br>• 2013 වර්ෂය අවසාන වන විටත් ඉහත කරුණ සම්බන්ධයෙන් ගරු නීතිපතවරයාගේ උපදෙස් ලැබීමට නියමිතව තිබිණි. |
| පැමිණිලි | 02 | • කොටස් තැරැව්කාර සමාගමකට එරෙහිව සිදුකරන ලද ආයෝජන පැමිණිලි පදනම් කර ගනිමින් විමර්ශනයන් 2 ක් 2013 වසරේදී ආරම්භ කරන ලද අතර, 2013 වසර අවසන වන විට එම විමර්ශන සිදු කෙරෙමින් පැවතිණි. |
| ලැයිස්තුගත සමාගමක ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනය | 01 | • ලැයිස්තුගත සමාගමක ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් 2013 වර්ෂයේදී විමර්ශනයක් ආරම්භ කරන ලද අතර, 2013 දෙසැම්බර් මස වන විට එම විමර්ශනය අවසන් කෙරෙමින් පැවතිණි. |

1. ලේඛනගත සමාගමක සුරැකුම්පත්වලට අදාළ වන්නා වූ ප්‍රසිද්ධියට පත් නොකරන ලද මිල සංවේදී තොරතුරු තමා සන්තකයේ තබා ගනිමින් එම සමාගමෙහි කොටස් ගනුදෙනු කිරීම.
2. කොටස් වෙළෙඳපොළක ලේඛනගත වී ඇති ඕනෑම සමාගමක සුරැකුම්පත් සම්බන්ධයෙන් එහි ගනුදෙනුවලට හෝ මිලට අදාළ ආකාරයේ ව්‍යාජ හෝ නොමග යවන සුළු වෙළෙඳපොළ තත්ත්වයක් නිර්මාණය කිරීම.
3. යම් සමාගමක කොටස් සම්බන්ධයෙන් ඉදිරියේ සැලකිය යුතු මිලදී ගැනීමක් හෝ විකිණීමක් පවතින අවස්ථාවකදී ඒ සමාගමේ කොටස් ඊට පසු ගනුදෙනු කොට ලාභ ඉපයීමේ අරමුණින් සේවා දායකයකු සම්බන්ධයෙන් එම සමාගමෙහි කොටස් ගනුදෙනු කිරීම.

## පැමිණිලි

වර්ෂය තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලැයිස්තුගත කරන ලද සමාගම් 20 කට එදිරිව කරන ලද පැමිණිලි විමර්ශනයට භාජනය කරන ලදුව, ඒවායින් 19 කට විසඳුම් ලබාදී ඇත.

## නඩු කටයුතු

### මෙල්ස්ටකොප් ලිමිටඩ් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් 03 දෙනෙක් (රිට්) නඩු අංක 204/2012 සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව මෙල්ස්ටකොප් ලිමිටඩ් සහ තවත් 09 දෙනෙක් නඩු අංක S/74140/2012

2011 සැප්තැම්බර් මස 13 වන දින මෙල්ස්ටකොප් සමාගම විසින් ලංකා මිලක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පී.එල්. සී. සමාග මේ ඡන්ද හිමි කොටස් වලින් 5% ක ප්‍රමාණයක් අත්පත්කර ගන්නා ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා මිලක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පී. එල්. සී.
සමාගමේ සුළුතර කොටස්කරුවන් සඳහා සමාගම් අත්පත් කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය යටතේ අනිවාර්ය අර්පනයක් කළ යුතු බවට කොමිෂන් සභාව විසින් 2012 මාර්තු මස 05 වන දින මෙල්ස්ටකොප් සමාගම වෙත නියෝග කරන ලදී.

කොමිෂන් සභාව විසින් මෙම නියෝගය පැනවීමට හේතුව වන්නේ 2011 සැප්තැම්බර් මස 13 වන දින උක්ත කී කොටස් අත්පත් කරගැනීම සිදුවන අවස්ථාවේදී, මෙල්ස්ටකොප් සමාගම, මිල්ෆර්ඩ් එක්ස්පෝට් (සිලෝන්) ලිමිටඩ් සහ ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා යන සමාගම් දෙක සමඟ එක්ව කටයුතු කරමින් ලංකා මිලක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ) පී.එල්.සී. සමාගමේ ඡන්ද හිමි කොටස් වලින් 30% කට වැඩි නමුත් 50% කට අඩු කොටස් ප්‍රමාණයක් දරනු ලබන බවට මෙල්ස්ටකොප් සමාගම විසින්ම කළ ප්‍රකාශය මත පදනම්වය.

ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පී.එල්.සී. සමාගමේ සුළුතර කොටස් කරුවන් සඳහා සමාගම් අත්පත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය යටතේ අනිවාර්ය අර්පනයක් කිරීමේ වගකීම තමන් වෙත පැවරී ඇති බවට මෙල්ස්ටකොප් සමාගම විසින් මූලික වශයෙන් පිළිගන්නා ලද නමුත් අනිවාර්ය අර්පණය කිරීමට අපොහොසත් විය.

කොමිෂන් සභාව මගින් අවස්ථා කිහිපයක්ම ලබාදුන් නමුත් මෙල්ස්ටකොප් සමාගම එකී අනිවාර්ය අර්පණය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මෙල්සටකොප් සමාගම විසින්, සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය උල්ලංඝනය කරමින් කටයුතු කිරීම මත කොමිෂන් සභාව විසින් මෙල්ස්ටකොප් සමාගම සහ එහි අධ්‍යක්ෂකවරුන්ට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පවරන ලදී.

මේ අතරතුරදී, ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ) පීඑල්සී සමාගමේ කළමනාකාරිත්වය ඒ වන විටත් මෙල්ස්ටකෝප් ලිමිටඩ් විසින් හිමිකරගෙන සිටි බවත් එබැවින් සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය යටතේ ලංකා මිලක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පීඑල්සී සමාගමේ සුළුතර කොටස් හිමිකරුවන් සඳහා අනිවාර්ය අර්පනයක් කිරීමේ වගකීම මෙල්ස්ටකෝප් සමාගම වෙත උද්ගත නොවන බවත් පවසමින්, එම සමාගම විසින්, කොමිෂන් සභාව 2012 මාර්තු මස 05 වන දින මෙල්ස්ටකොප් සමාගම වෙත නිකුත් කළ නියෝගය අවලංගු කරන මෙන් ඉල්ලා අභියාචනාධිකරණය ඉදිරියේ - (රිට්) 204/2012 දරන රිට් අයදුම් පත්‍රය ගොනු කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පී. එල්. සී., ඩිස්ටලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී. එල්. සී., මිල්ෆර්ඩ් එක්ස්පෝර්ට්ස් (සිලෝන්) ලිමිටඩ් යන ආයතන පිළිවෙළින් මෙම නඩුවේ 01 වන, 02 වන, 03 වන සහ 04 වන වගඋත්තරකරුවන් ලෙස නම් කරන ලදී.

ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ) පී.එල්.සී. විසින් ඉහත නඩුවේදී සිය විරෝධතා ගොනු කරමින් කියා සිටියේ 2011 සැප්තැම්බර් මස 13 වන දින මෙල්ස්ටකොප් සමාගම විසින් කොටස් මිලදී ගැනීම සිදුකරන අවස්ථාව වන විට, මිල්ස් එන්ටප්‍රයිසස් ලිමිටඩ් නමැති තවත් සමාගමක් මෙම නඩුවේ 03 වන සහ 04 වන වගඋත්තරකරුවන් වන ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්. සී සහ මිල්ෆර්ඩ් එක්ස්පෝර්ට්ස් (සිලෝන්) ලිමිටඩ් සමාගම් සමග එක්ව කටයුතු කරනු ලැබූ බවයි.

ලංක මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පී.එල්.සී. විසින් හෙළිදරව් කරන ලද කරුණු පිළිගනිමින් මෙල්ස්ටකොප් සමගම විසින් 2013 ජුනි මස 13 වන දින අභියාචනාධිකරණය ඉදිරියේ දිවුරුම් පෙත්සමක් ගොනු කරමින්, ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී. එල්. සී., මිල්ෆර්ඩ් එක්ස්පෝර්ට්ස් (සිලෝන්) ලිමිටඩ් සහ මිල්ස් එන්ටප්‍රයිසස් ලිමිටඩ් යන සමාගම් එක්ව කටයුතු කරන බවත් ඒ අනුව 2011 සැප්තැම්බර් මස 13 වන දින මෙල්ස්ටකොප් ලිමිටඩ් විසින් ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පී එල් සී කොටස් මිලදී ගන්නා මොහොතේ,

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

උක්ත කී සියලුම පාර්ශවයන් විසින් ලංකා මිල්ක් ෆුඩ්ස් හි කොටස් හිමිකාරත්වයෙන් 50% කට වැඩ වැඩි ප්‍රමාණයක් දරන ලද බවත් ඒ අනුව සමාගම් අත්පත් කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ අනිවාර්ය අර්පනයක් කිරීමේ වගකීමට මෙල්ස්ටකොප් සමාගම වෙත උද්ගත නොවන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පීඑල්සී විසින් කළ හෙළිදරව් කිරීම පදනම් කර ගනිමින් මෙල්ස්ටකොප් සමාගම විසින් 2013 ජූලි මස 19 වන දින කොමිෂන් සභාව වෙත අයදුම් පතක් ඉදිරිපත් කරමින්, මෙලස්ටකොප් සමාගම විසින් කොමිෂන් සභාවට එරෙහිව අභියාචනාධිකරණයේ පවරන ලද රිට් අයදුම්පත සහ කොමිෂන් සභාව විසින් මෙල්ස්ටකෝප් සමාගමට සහ එහි අධ්‍යක්ෂක මණ්ඩලයට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පවරා ඇති අංක 74140/2012 දරන නඩුව ඉවත්කර ගැනීම සඳහා සමථයකට එළඹීමට ඉල්ලීමක් කරන ලදී.

උක්ත කරුණ ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්.ඊ.) පීඑල්සී විසින් හෙළිකරන තුරු, මෙල්ස්ටකෝප් සමාගම විසින් කොමිෂන් සභාව වෙත හෝ අධිකරණය වෙත මෙම කරුණ හෙළිදරව් කර නොතිබිණි.

කොමිෂන් සභාව විසින් 2012 මාර්තු මස 05 වන දින සිය නියෝගය නිකුත් කල මොහොතේ හෝ කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පවරන මොහොතේ මෙල්ස්ටකොප් සමාගම විසින් මෙම කරුණ හෙළිදරව් කර නොතිබූ නමුත්, 2013 ජූලි මස 19 වන දින එම සමාගම විසින්ම ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයේ ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගනිමින්, එකී ඉල්ලීම පිළිගැනීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

ඒ අනුව මෙල්ස්ටකෝප් සමාගම විසින් කොමිෂන් සභාවට එරෙහිව අභියාචනාධිකරණයේ පවරා තිබූ නඩුව ඉවත් කර ගන්නා ලද අතර සමත කොන්දේසිවලට අනුකූලව කොමිෂන් සභාව ද, 2012 මාර්තු මස 05 වන දින මෙල්ස්ටකෝප් සමාගම වෙත සමාගම් අත්පත් කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ අනිවාර්ය අර්පනයක් සිදුකළ යුතු බවට දක්වමින් මෙල්ස්ටකෝප් සමාගම වෙත නිකුත් කළ නියෝගයත්, කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ කොමිෂන් සභාව විසින් මෙල්ස්ටකොප් සමාගම සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව පවරන ලද නඩු කටයුත්තත් ඉවත් කර ගන්නා ලදී.

### මැග්පෙක් එක්ස්පෝර්ට (ප්‍රයිවට්) ලිමිටඩ් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නඩු අංක HCMCA 217/2007

මෙම නඩුවේ චූදිතයන් හතර දෙනෙකුට එරෙහිව මැග්පෙක් එක්ස්පෝර්ට්ස් සමාගමේ යම් යම් වැදගත් ව්‍යාපාරික තීරණයන් වෙළෙඳපොළ වෙත වහා හෙළිදරව් නොකිරීම නිසා කොමිෂන් සභාව විසින් පනවා ඇති රීති උල්ලංඝනය කරමින් කටයුතු කිරීමේ වරද මත වරදකරුවන් කරමින් කොළඹ කොටුව උගත් මහෙස්ත්‍රාත්තුමා විසින් ලබාදුන් තීන්දුව සහ ඔවුන් වෙත නියම කරන ලද දණ්ඩනය කොළඹ පළාත්බද මහාධිකරණය වෙත අභියාචනා කොට ඇත.

චූදිතයන් තුන් දෙනකු වරදකරුකිරීම සම්බන්ධයෙන් උගත් මහේස්ත්‍රාත්තුමාගේ තීන්දුව, ගරු මහාධිකරණ විනිසුරුතුමා විසින් ස්ථිර කරන ලද අතර එක් එක් චූදිතයා රුපියල් මිලියන 3.3 ක මුදල් දඩයකට යටත් කරමින් එකී චූදිතයන් වෙත පනවන ලද බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩනය අවලංගු කරන ලදී.

6 වන චූදිත - අභියාචනාකරු සම්බන්ධයෙන් ඉහත කී අභියාචනය කොළඹ මහාධිකරණය ඉදිරියේ පැවැත් වේ.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව බී. ඩී. ජයසේකර සහ තවත් 08 දෙනෙක් නඩු අංක S/64721/2006

නවලෝක රෝහල් සමාගමේ කොටස් සඳහා ව්‍යාජ වෙළෙඳපොළ තත්ත්වයක් නිර්මාණය කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් චූදිතයන් නවදෙනෙකුට එරෙහිව මෙම නඩුව පවරා ඇත.

කොමිෂන් සභාව ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත එක් චූදිතයෙකුට එරෙහිව චෝදනා ඉල්ලා අස්කර ගන්නා ලද අතර චූදිතයන් හත්දෙනෙකුට එරෙහිව පැවති චෝදනා සම්බන්ධයෙන් නඩු කටයුතු සමථයකට පත්කරන ලදී.

මෙම නඩුවේ 09 වන චූදිත සම්බන්ධයෙන් වන නඩු කටයුතු තවදුරටත් අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව මිරමාර් බීච් හෙටෙල්ස් පී.එල්.සී. සහ තවත් අය නඩු අංක S/72082/2010 සහ S/72083/2010

වර්ෂ 2008 මාර්තු මස 31 සහ 2009 මාර්තු මස 31 වන දිනයන්ගෙන් අවසන් වන මුදල් වර්ෂ සඳහා අදාළ වන සමාගමේ වාර්ෂික වාර්තා කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් කොටස් වෙළඳපොල සැයිස්තුගත කිරීමේ නීති උපලෙගනය කිරීම සහ ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතීන්ගේ රීති අංක 3 (1) සහ 17 උල්ලංඝනයවීම සම්බන්ධව මිරාමාර් බීච් හොටෙල්ස් පී.එල්.සී. සමාගමට සහ එහි අධ්‍යක්ෂක මණ්ඩලයට එරෙහිව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට වර්ෂ 2010 නොවැම්බර් මස 04 වන දින කොමිෂන් සභාව විසින් නඩුවක් ගොනුකරන ලදී. මෙම නඩුව ඉහත කී අධිකරණය තුළ තවදුරටත් විභාග වෙමන් පවතී.

## ටව්වුඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී. ඈවර කිරීමේ නඩු අංක CHC/31/2013/CO හි කොමිෂන් සභාව විසින් මෝසමක් ගොනු කිරීම

ටව්වුඩ් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී. සමාගම වෙතින් ණය හිමියකු ලෙස හිමිකම් කියාපාන තැනැත්තෙකු කොළඹ වාණිජ මහාධිකරණය වෙත ඉල්ලුම් පත්‍රයක් ගොනු කරමින් අදාළ සමාගමේ තැන්පතු ලෙස පවතින තමා වෙත අයිතිව තිබූ මුදල් සම්බන්ධයෙන් හිමිකම් ඉදිරිපත් කරමින් අදාළ සමාගම ඈවර කිරීමට ඉල්ලීමක් කර ඇත.

ඉහත කී සමාගමේ සභාපති සහ එහි අධ්‍යක්ෂිකාවක් වූ ඔහුගේ බිරිඳට එරෙහිව කොමිෂන් සභාව වෙත පැමිණිලි රැසක් ලැබී ඇත. අනතුරුව කොමිෂන් සභාව විසින් අදාළ සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත. මීට අමතරව කොමිෂන් සභාව විසින් අදාළ සමාගමට සිය ජංගම නොවූ වත්කම් අන්සතු කිරීම වළක්වාලීමේ විධානයක් කර ඇත. මීට අමතරව මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගෙන ඇති පියවර පිළිබඳව අධිකරණය වෙත මෝසමක් මගින් දැනුම් දී ඇත.

කොමිෂන් සභාව විසින් අදාළ සමාගම සම්බන්ධයෙන් විමර්ශන සිදු කෙරෙමින් පවතී.

## පී. බී. සංජීව මිහිර කුමාර සහ පී. බී. සුජිත් සමීර කුමාරට එරෙහිව කොමිෂන් සභාව සහ තවත් අය (CA (රිට්) 265/2013)

තම කොටස් තැරැව්කරු සහ ආන්තික සැපයුම්කරු විසින් සිය අභිවෘද්ධිය ගැන සැලකිලිමත් අයුරින් ක්‍රියා නොකිරීම නිසා තමන්ගේ රුපියල් මිලියන 20 ක් වටිනා කොටස් එකතුවේ වටිනාකම ශූන්‍ය බවට පත්කර ඇති බවට චෝදනා කරමින් මෙම නඩුවේ පෙත්සම්කරුවන් විසින් අභියාචනාධිකරණය ඉදිරියේ අදාළ පෙත්සම ගොනුකර ඇත.

මෙම පෙත්සම්කරුවන් විසින් කොටස් තැරැව්කරුට සහ ආන්තික සැපයුම්කරුට අමතරව කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ වගඋත්තරකරුවන් කරමින් එකී තැරැව්කරුට සහ ආන්තික සැපයුම්කරුට එරෙහිව විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා මැන්ඩාමුස් රිට් සහනයක් සහ එකී තැරැව්කරුගේ බලපත්‍රය අලුත්කිරීම සහ ආන්තික සැපයුම්කරුගේ ලියාපදිංචිය තහනම් කිරීම සඳහා වූ තහනම් කිරීමේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙස අභියාචනාධිකරණයේ අදාළ පෙත්සම ගොනුකර ඇත.

කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුවන් විසින් සිදුකරන ලද මෙකී චෝදනා සම්බන්ධයෙන් විමර්ශන කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. අභියාචනාධිකරණය මෙම විමර්ශන කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර මෙම නඩුකරය දැනට අභියාචනාධිකරණය ඉදිරියේ පැවැත්වේ.

## නිදහස් වෙළෙඳකලාප සහ පොදු සේවා සේවක සංගමය සහ තවත් අය එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය සහ තවත් අය SC FR 587/12

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනුකරන ලද මෙම මූලික අයිතිවාසිකම් ඉල්ලීමේ 8 වන වගඋත්තරකරු වශයෙන් කොමිෂන් සභාව නම් කර ඇත. සේවක අර්ථසාධක අරමුදල විසින් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සිදුකරන ලද යම්කිසි ගණුදෙනු නිසා ප්‍රාග්ධන වෙළෙඳපොළ නීති උල්ලංඝනය වී ඇති බව පෙත්සම්කරුවන් කියා සිටින ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලද අතර සේවක අර්ථසාධක අරමුදල් යොදාගනිමින් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කරනු ලබන ආයෝජනයන්ට පදනම් වන මූලධර්ම ශ්‍රී ලංකා මහ බැංකුවෙ මුල්‍ය මණ්ඩලය විසින් මහජනතාව වෙත හෙළිදරව් කිරීමට කටයුතු කිරීම සුදුසු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිරීක්ෂණය කරන ලදී.

## බලාත්මක කිරීමේ කටයුතු

කොමිෂන් සභාව විසින් පහත පරිදි බලාත්මක කිරීමේ කටයුතු සිදුකොට ඇත.

### අවවාද

* පසුගිය වසරේ සමාලෝචනයන්ට යටත්ව ආයෝජන

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

උපදේශකවරු 9 දෙනකුට 2012 වර්ෂය සඳහා වූ අඛණ්ඩ වෘත්තිය ප්‍රවර්ධන වැඩසටහන් නියමිත සංඛ්‍යාවක් සඳහා සහභාගි නොවීමේ හේතුව මත අවවාද නිකුත් කරන ලදී.

* ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල
  15 වන රීතියට යටත්ව සමාගමක් වෙත සිය නීතිමය රාජකාරි පිළිබඳව තරයේ අනුගතව කටයුතු කළ යුතු බවට තහවුරු කිරීම සඳහා ලැයිස්තුගත සමාගමක් වෙත අවවාද හා උපදෙස් නිකුත් කරන ලදී. එසේ සිදුකරන ලද්දේ අදාළ සමාගමේ සිදුවිය හැකි ඒකාබද්ධ කිරීමක් සම්බන්ධයෙන් නොමග යවන සුළු ප්‍රකාශ පිළිබඳ කාලීනව පැහැදිලි කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙනි.

* ආයෝජන උපදේශකවරයෙකු ගණුදෙනු සිදුකිරීමට පෙරාතුව, නම් කළ තැනැත්තන්/ පවුලේ සාමාජිකයන් වෙනුවෙන් අවශ්‍ය පරිදි බලය ලබාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් අවවාද නිකුත් කරන ලදී.

* ආයෝජන උපදේශකවරුන් දෙදෙනකු වෙත කිසියම් ගණුදෙනුකරුවන්ගේ ගිණුම් සම්බන්ධයෙන් නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම පිළිබඳව තරයේ අවවාද සිදුකරන ලදී.

* ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂකවරයෙකු වෙත, වෙළෙඳපොළ මිල සංවේදී තොරතුරක් විය හැකිව තිබූ තොරතුරක් වෙළෙඳපොළ වෙත නිකුත් කිරීමට පෙරාතුව ඔහුගේ සමාගමෙහි කොටස් ගණුදෙනු කිරීම සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කරන ලදී.

  මෙහිදී ඉහත කී අධ්‍යක්ෂකවරයා විසින් කොටස් මිලදී ගෙන තිබුණේ සමාගමේ යම්කිසි තොරතුරක් වෙළෙඳපොළ වෙත නිකුත් කිරීමට පෙරාතුවය. කොමිෂන් සභාව විසින් අදාළ විධායක අධ්‍යක්ෂකවරයා විසින් සිදුකරන ලද මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ පරිවේෂකයන් සලකා බලන ලද අතර අදාළ තොරතුර වෙළෙඳපොළ වෙත බලපෑමක් නොමැති වූ හෙයින් එකී අධ්‍යක්ෂකවරයා වගකීම්වලින් නිදහස් කරන ලදී.

### ඉතා තදින් තරවටු කිරීම

ආයෝජන උපදේශකයන් 04 දෙනෙකු සිය ගණුදෙනුකරුවන් වෙනුවෙන් ගණුදෙනු කටයුතු කිරීමේදී අක්‍රමවත් ක්‍රියා අනුග මනය කිරීම හේතුවෙන් ඉතා තදින් තරවටු කරන ලදී.

### අනතුරු ඇඟවීම්

ලැයිස්තුගත නොකළ සමාගමක ප්‍රධාන විධායක නිලධාරියා වෙත එකී ලැයිස්තුගත නොකළ සමාගම සහ ලැයිස්තුගත සමාගමක් අතර යම්කිසි සාකච්ඡාවක් පවතින අතරතුරදී, එකී ලැයිස්තුගත සමාගමේ කොටස් ගණුදෙනු කිරීම සම්බන්ධයෙන් අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී. ඉහත කී සාකච්ඡාව මිල සංවේදී තොරතුරක් ලෙස සැලකිය නොහැකි බැවින් එකී ප්‍රධාන විධායක නිලධාරියා අනතුරු ඇඟවීමක් සහිතව නිදහස් කරන ලදී.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

ප්‍රාග්ධන වෙළෙඳපොළ රටේ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පත් රැස්කර ඒවා අදාළ අංශවලට යොමුකරයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කරන අතරතුර එය සංවර්ධනය කරා රැගෙන යයි. සකලවිධ යෝග්‍යතා ඇති විවිධාංගිකරණ වත්කම් පන්ති සහිත භාණ්ඩ සහ ව්‍යුත්පන්න වෙළෙඳපොළක් ස්ථාපනය කිරීම, සමාගම් ලැයිස්තුගත කිරීම් ව්‍යාප්ත කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොළ යටිතල පහසුකම් වර්ධනය කිරීම හා බැඳුම්කර හා ඒකකභාර වෙළෙඳපොළ ව්‍යාප්ත කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු කිහිපයකි. ඊට අමතරව ප්‍රාග්ධන වෙළෙඳපොළට බලපෑම්කරන රජයේ ප්‍රතිපත්ති අධ්‍යයනයද එහි කාර්යභාරයේ කොටසකි. එහිලා පහත සඳහන් කාර්යයන් 2013 වර්ෂයේදී සම්පූර්ණ කෙරිණි.

### ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම

විදේශීය ආයෝජනය ප්‍රාග්ධන වෙළෙඳපොළේ හා සමස්ත ආර්ථිකයේම වර්ධනය ඉහළ දැමීමට මූලික වන සාධකයකි. එම නිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් වෙළෙඳපොළ හා ඒකාබද්ධව තෝරාගත් විදේශීය වෙළෙඳපොළ කිහිපයක ආයෝජන සම්මන්ත්‍රණ පවත්වන ලදී.

* මුම්බායි ආයෝජන සම්මන්ත්‍රණය

  2013 පෙබරවාරි 21 දින මුම්බායිහි "Four Seasons" හෝටලයේදී මෙම ආයෝජන සම්මන්ත්‍රණය පැවැත්විණි. ඉන්දියාවෙන් පිටත අක්වෙරළ අරමුදල කළමනාකරණ සමාගම් හා ඉන්දියාවේ පිහිටුවා ඇති ආයතනික අරමුදල් නියෝජනය කරමින් නියෝජිතයන් 128 දෙනෙකු මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය.

* මුම්බායි ආයෝජන සම්මන්ත්‍රණයේ ප්‍රගතිය අධ්‍යයනය කිරීමේ පියවර

  මුම්බායි ආයෝජන සම්මන්ත්‍රණයට පසු එහි ප්‍රගතිය සහ සහභාගී වූවන්ගේ ප්‍රතිචාර අධ්‍යයනය කිරීම සඳහා එම සම්මන්ත්‍රණයට සහභාගි වූ නියෝජිතයන් 11 දෙනෙකුට ශ්‍රී ලංකාවට ආරාධනා කරන ලදී. මෙම ආරාධිත පිරිස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළ හා ලංකා මහ බැංකුව සමග තම අත්දැකීම හා සමුළුව පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිචාර සාකච්ඡා කරන ලදී.

* ඩුබායි ආයෝජන සම්මන්ත්‍රණ

* ඩුබායිහි වෙසෙන ශ්‍රී ලාංකික ඩයස්පෝරාව සඳහා වූ සම්මන්ත්‍රණය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වෙසෙන හා එහි සේවාවන්හි නියුතු ශ්‍රී ලාංකිකයින් 78 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2013 ජුනි 01 වන දින ඩුබායිහි "Le Meridian" හෝටලයේ හි මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී.

* ඩුබායිහි අරමුදල් කළමනාකරුවන් සඳහා වූ සම්මන්ත්‍රණය

  ආයතනික අරමුදල් කළමනාකරුවන් හා මහා පරිමාණයේ ආයෝජකයන් 68 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2013 ජුනි 03 වන දින ඩුබායිහි "Ritz Carlton" හෝටලයේ මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී.

* හොංකොං ආයෝජන සම්මන්ත්‍රණය

  ආයතනික අරමුදල් කළමනාකරුවන් හා මහා පරිමාණ ආයෝජකයින් 75 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2013 සැප්තැම්බර් 09 වන දින හොංකොංහි "Shangri-La" හෝටලයේ මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී.

  ඊට අමරතව ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව විදේශීය ආයෝජකයන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් කොළඹ කොටස් වෙළෙඳපොළ හා ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා අවශ්‍යය සියලු තොරතුරු ඇතුළත් අත් පොතක්ද පිළියෙල කරන ලදී.

## සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ඇතුළත් ප්‍රතිපත්ති පත්‍රිකාවක් පිළියෙළකර අනුමත කරන ලදී. එහි ඇතුළත් මූලික පියවර කිහිපයක් පහත දැක්වේ.

* ප්‍රාථමික වෙළෙන්ඳන් සහ වෙළෙඳපොළ අතරමැදියන් හට සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ තුළ වෙළෙඳාමේ නියැලීමට අනුමැතිය ලබාදීම.
* ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ඉල්ලා සිටින සුදුසුකම් ද ඇතුළත්ව සාංගමික බැඳුම්කර වෙළෙඳාමට ප්‍රවිශ්ඨවීමට අවශ්‍ය සුදුසුකම් ආකෘතියක් පිළියෙළ කිරීම.
* වෙළෙඳාම් හා වාර්තාගත කිරීම්වල ගුණාත්මකභාවය හා යටිතල පහසුකම් වර්ධනය කිරීම.
* මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ස්ථාපිත කිරීම. (Central Counterparty Framework)
* සාංගමික බැඳුම්කර පිළිබඳව දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.
* සුළු පරිමාන ආයෝජකයින් දිරිමත් කිරීම සඳහා සාංගමික බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවශ්‍ය අවම දායක මුදල රු. 10,0000 කට සීමා කිරීම.
* සම්මත තැරැව්කාර ගාස්තුවක් හඳුන්වාදීම.
* උපරිම නාමික අගයක් ස්ථාපිත කිරීම.
* ලැයිස්තුගත කිරීමට අවශ්‍ය සුදුසුකම් ලිහිල් කිරීම හා නිකුත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීම.
* ලැයිස්තුගත කිරීමේ නියමයන් සංශෝධනය කිරීම.
* මහජන බැඳුම්කර නිකුත් කිරීම දිරිගැන්වීම.
* විදේශ ආයෝජකයින් ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට ආකර්ෂණය කර ගැනීම.
* සාංගමික බැඳුම්කර පිළිබඳව දැනුම බෙදාදීම.
* සාංගමික බැඳුම්කර සඳහා ප්‍රතිමිලදී ගැනීමේ අවස්ථා සැලසීම.
* ණය ප්‍රමාණීකරණ නියෝජිත ආයතන සඳහා පොදු හෙළිදරව් කිරීමේ ක්‍රමවේදයක් නිකුත් කිරීමේ විස්තර ප්‍රකාශ පත්‍රයේ අන්තර්ගත කිරීම සඳහා එම ආයතන සමග සාකච්ඡා පැවැත්වීම.

## ඒකකභාර කර්මාන්තය දියුණු කිරීම

බැංකු සහ මූල්‍ය සමාගම්වල ව්‍යාවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් ගණනය කිරීමේදී රාජ්‍ය සුරැකුම්පත්වල පමණක් ආයෝජනය කරන ඒකක භාර එහි අර්ථකථනයට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීම් කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

* මුළු ප්‍රාග්ධන වෙළෙඳපොළම ආවරණය වන පරිදි අලෙවිකරණ ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සැලසුම් කිරීම.

ඒකකභාර කර්මාන්තය දියුණු කිරීම මූලික කරගත් අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියක් දියත් කිරීමට ආරම්භයේදී තීරණය කළත් පසුව කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව එම ව්‍යාපෘතිය මුළු ප්‍රාග්ධන වෙළෙඳපොළම ආවරණය වන පරිදි ව්‍යාප්ත කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් වෙළෙඳපොළ හා ඒකාබද්ධව මෙම ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජනා සඳහා කැඳවීම් පත්‍රයක් පිළියෙළ කරන ලදී. ඒ අනුව කොළඹ කොටස් වෙළෙඳපොළ ප්‍රචාරක සමාගම් 8 කින් යෝජනා කැඳවන ලදී. මෙම යෝජනාව විශ්ලේෂණය කිරීම සඳහා 2013 දෙසැම්බර් මාසයේදී කමිටුවක් පත් කෙරිණි.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ ව්‍යුහයේ පදනම වඩාත් යහපත් කිරීම සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් පිහිටුවීම

* ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළ හා ලංකා ක්ලියර් ආයතනයක් හා ඒකාබද්ධව මූල්‍ය ගනුදෙනු සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයත් පිහිටුවීම පිළිබඳ සාකච්ඡා කරන ලදී. තවද ඒ සඳහා උපදේශන සේවා ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශයන් කැඳවීමද අනුමත කෙරිණි.

* ඒ අනුව කැමැත්ත ප්‍රකාශයන් කැඳවීම සඳහා දැන්වීමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාධ්‍යයට පළ කරන ලදී. ඒකාබද්ධව මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක් හෝ තනි මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් පිහිටුවීම එහි සංකීර්ණතාවය හා එම කාර්යය සම්පූර්ණ කිරීමට යන කාලය මත තීරණය කිරීමට එකඟවන ලදී.

### නව ලැයිස්තුගත කිරීම් ව්‍යාප්ත කිරීමේ වැඩපිළිවෙල (පෞද්ගලික හා රජයේ)

උතුරු ප්‍රදේශයේ වාණිජ ආයතන සඳහා නව (new) ලැයිස්තුගත කිරීම් දිරිගැන්වීමේ හා ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා ලැබෙන ප්‍රයෝජන ගැන දැනුවත් කිරීමේ වැඩසටහනක් යාපනය නගරයේ පවත්වන ලදී. මෙම වැඩසටහන නුවර නගරයේද පැවැත්වීමට තීරණය කරන ලදී.

තවද මීට සමගාමීව තම සමාගම් ලැයිස්තුගත කිරීමට බලාපොරොත්තුවන සමාගම් සඳහා සම්මන්ත්‍රණයක්ද කොළඹ නගරයේ පවත්වන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ කොටස් වෙළෙඳපොළ ඒකාබද්ධව කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමෙන් ලැබෙන වාසි පිළිබඳව වෙළෙඳ සමාගම් 79 ක කළමනාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ඊට අමතරව පරිගණක මෘදුකාංග හා සේවා සැපයුම්කරුවන්ගේ සංගමය (SLAASCOM) සමග විශේෂ දැනුම (KPO), සපයන ආයතන ව්‍යාපාරික මෙහෙයුම් පිළිබඳව විශේෂ දැනුම (BPO) සපයන ආයතන හා පරිගණක සමාගම් සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ හරහා ප්‍රාග්ධනය රැස්කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත්කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම් පිළිබඳව ස්වාධීන පර්යේෂණ මාලාවක් පවත්වන ලදී. ඒ අනුව 2014 ජනවාරි මාසය වන විට S&P ශ්‍රී ලංකා (S&P SL20) දර්ශකයේ ලැයිස්තු ගත කර ඇති සමාගම් 10 ක් පිළිබඳව වාර්තා කොළඹ කොටස් වෙළෙඳපොළ වෙබ් අඩවියේ පළකර ඇත. තවද කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව "කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීම ගැන මාර්ගෝපදේශකයක්" යන මැයෙන් එහි ලැයිස්තුගත කිරීම පිළිබඳ තොරතුරු ඇතුළත් පොතක් පළකරන ලදී. මෙය 2013 අගෝස්තු මාසයේදී එළිදක්වන ලදී. මෙහි සිංහල හා දෙමළ මාධ්‍ය පරිවර්තනයේ ද සිදුකිරීමට තීරණය කර ඇත.

### නව භාණ්ඩ හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

* සකලවිධ යෝග්‍යතා ඇති විවිධාංගීකරණ වත්කම් පන්ති සහිත භාණ්ඩ හා ව්‍යුත්පන්න වෙළෙඳපොළක් ස්ථාපනය කිරීම.

මේ වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යෑම සඳහා වෙළෙඳපොළ ක්‍රියාකිරීමට සුදුසු ආයතනයක් තෝරාගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කැඳවූ අතර ඒ අනුව මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවට අනුකූලව කැමැත්ත ප්‍රකාශ කැඳවීමට ප්‍රතිචාර දැක්වූ පාර්ශවකරුවන් අතරින් දෙදෙනකු වැඩිදුර විශ්ලේෂණයට තෝරා ගැණිනි. ඊට අමතරව යෝජනා සඳහා කැඳවීම් පත්‍රයක් පිළියෙළ කිරීම ද අවසන් කර ඇත.

තවද මෙම ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට සහයෝගය දීමට උපදේශන සේවා ආයතනයක් තෝරා ගැනීමටද තීරණය කරන ලදී.

ඊට අමතරව මෙම ව්‍යාපෘතියට තාක්ෂණික සහය සහ අනෙකුත් පුළුල් ප්‍රාග්ධන වෙළෙඳපොළ කාර්යන්ට සහය ලබාදීමට රුචිකත්වයක් සහ ප්‍රවනතාවක් දක්වන අරමුදල් සපයන ආයතන සමග සාකච්ඡා පවත්වන ලදී. මෙම කාර්යය සඳහා මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ සහයද අපේක්ෂා කරනු ලබයි.

* ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වාදීමට හැකියාවක් ඇති නව ආයෝජන උපකරණ

  - ශ්‍රී ලංකාවේ දැනට ආයෝජනය සඳහා ලබාගත හැකි ආයෝජන උපකරණ වනුයේ හිමිකම් හා ණය සුරැකුම්පත් පමණක් නිසා වෙළෙඳපොළ උච්චාවචනයන්ට මුහුණදිය හැකි විකල්ප උපකරණවල ආයෝජනය කිරීමට හැකියාවක් නැත.

  - මෙයට විසඳුමක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළට හඳුන්වාදිය හැකි නව උපකරණ 3 ක් හඳුනාගෙන ඇත. ඩොලර් බැඳුම්කර අරමුදල් (Dollar Bond Funds) දේපළ ආයෝජන භාර (Real Estate Investment Trusts) හා විනිමය හුවමාරු අරමුදල් (Exchange Traded Funds) එම උපකරණ වේ. මේ අතර හඳුන්වාදීමට ආසන්නතම උපකරණ ඩොලර් බැඳුම්කර වන අතර එය මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමුකර ඇත.

  - දේපොළ ආයෝජන උපකරණ පිළිබඳව ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළේ දැඩි උනන්දුවක් පවතී. මෙම නිසා මෙම උපකරණ සඳහා ලැබී ඇති යෝජනා 4 ක් ගැන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අවධානය යොමුවී ඇත.

  - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විනිමය හුවමාරු අරමුදල්වල ආකෘතිය දැනට අධ්‍යයනය කරමින් සිටියි.

  - ඒ අනුව මැලේසියාවේ හා සිංගප්පූරුවේ විනිමය හුවමාරු අරමුදල්වල වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයද අධ්‍යයනය කිරීමටද තීරණය කර ඇත.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන, පුහුණු සහ පර්යේෂණ කටයුතු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ක්ෂේත්‍රයේ නියැලි වෘත්තිකයන් සඳහා බලපත්‍ර ලබාදීමේ විභාග විවිධ කණ්ඩායම් සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් මෙන්ම අඛණ්ඩ අධ්‍යාපනික අවස්ථාවන් සැලසීම තුළින් දැනුමෙන් සහ නිපුණතාවයන් යුතු වෙළෙඳපොළ වෘත්තිකයින් පිරිසක් බිහිකිරීම සඳහා වැදගත් භූමිකාවක් ඉටු කරයි.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CCM)

සලකා බලන වසර තුළ අප විසින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හරහා වෘත්තිකයන්ගේ වෘත්තීය නිපුණතාවයන් උසස් තත්ත්වයකට වර්ධනය කිරීමට සහය වන අතරතුර තැරැව්කාර ආයතනයන්හි පුහුණු ආයෝජන උපදේශකවරුන් සඳහා අවම සුදුසුකමක් පවත්වාගෙන යෑමේ අරමුණින් සුදුසුකම් ආකෘතිය ක්‍රියාවට නැංවීම තවදුරටත් සිදුකරන ලදී. 2013 වසර තුළ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි පෙන්නුම් කළ ධනාත්මක වර්ධනය සැලකිල්ලට ගෙන ප්‍රාග්ධන වෙළෙඳපොළ ආශ්‍රිතව සිය ඉදිරි වෘත්තීය කටයුතුවල නියැලීමේ අපේක්ෂාවෙන් මෙම ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා වැඩි සිසුන් පිරිසක් ලියාපදිංචි වීමට උනන්දු විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ සියයකට අධික සිසුන් පිරිසක් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කළ අතර ඒ හා සමාන පුහුණු ආයෝජක උපදේශකවරුන් පිරිසක් බලපත්‍රලත් තැරැව්කාර ආයතනයන්හි සේවය කිරීම සඳහා ලියාපදිංචි ආයෝජක උපදේශක තත්වය (Registered Investment Advisor) හිමිකර ගන්නා ලදී.
(සංඛ්‍යා සටහන් 12, 13)

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

සංඛ්‍යා සටහන 12: ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර (CCM) විභාගයේ සංඛ්‍යානමය සාරාංශය (2013 වසර තුළ)

| මාධ්‍ය | ලියාපදිංචි වූ සමස්ත සිසුන් සංඛ්‍යාව | හිමිකම් සුරැකුම්පත් අදියර සම්පූර්ණ කරන ලද | ණය සුරැකුම්පත් අදියර සම්පූර්ණ කරන ලද | මූල්‍ය රෙගුලාසි හා ආචාරධර්ම අදියර සම්පූර්ණ කරන ලද | CCM සම්පූර්ණ කරන ලද | ලියාපදිංචි ආයෝජන උපදේශක තත්වය සම්පූර්ණ කරන ලද |
|---|---|---|---|---|---|---|
| සිංහල මාධ්‍ය | 37 | 15 | 42 | 26 | 34 | 61 |
| ඉංග්‍රීසි මාධ්‍ය | 72 | 40 | 59 | 41 | 77 | 50 |
| එකතුව | 109 | 55 | 101 | 67 | 111 | 111 |


සංඛ්‍යා සටහන 13: ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර හා ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය සඳහා පවත්වන ලද වැඩසටහන් සාරාංශය (2013 වසර තුළ)

| වැඩසටහන | අදියර | වසර තුළ පවත්වන ලද විභාගයන් ගණන | සමත් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය) | හිමිකම් සුරැකුම්පත් | 3 | 66% |
| | ණය සුරැකුම්පත් | 3 | 79% |
| | මූල්‍ය රෙගුලාසි හා ආචාරධර්ම | 3 | 56% |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සිංහල මාධ්‍ය) | හිමිකම් සුරැකුම්පත් | 1 | 56% |
| | ණය සුරැකුම්පත් | 2 | 57% |
| | මූල්‍ය රෙගුලාසි හා ආචාරධර්ම | 2 | 48% |
| ලියාපදිංචි ආයෝජන උපදේශක තත්වය (සිංහල මාධ්‍ය) | අදාල නැත | 15 | 79% |
| ලියාපදිංචි ආයෝජන උපදේශක තත්වය (ඉංග්‍රීසි මාධ්‍ය) | අදාල නැත | 13 | 87% |

## ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DCM)

සලකා බලන කාලපරිච්ඡේදය තුළ එක්සත් රාජධානියේ, සුරැකුම්පත් සහ ආයෝජනය සඳහා වන වරලත් ආයතනය (Chartered Institute for Securities and Investments UK) සමග එක්ව ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ දේශන කටයුතු තවදුරටත් සිදුකරන ලදී. සලකා බලන කාලය තුළ සිසුන් පස් දෙනෙකු විසින් මෙම ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කළ අතර සහතිකපත් ප්‍රදානෝත්සවයේදී සිය ඩිප්ලෝමා සහතිකපත් ලබා ගන්නා ලදී. (රූප සටහන 12)


රූප සටහන 12: සුදුසුකම් ආකෘතිය සම්පූර්ණකළ සිසුන් සංඛ්‍යාව



## අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන

දේශීය හා අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ මෑත කාලීන ප්‍රවණතාවයන් පිළිබඳව ආයෝජන උපදේශකවරුන් දැනුවත් කිරීම සඳහා සලකා බලන කාලය තුළ අවශ්‍යතාවයන්ට අනුව සැකසූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් 9 ක් පවත්වන ලදී. තැරැව්කාර ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකවරුන්, විශ්ලේෂකවරුන් හා ක්ෂේත්‍රයේ වෘත්තිකයන් ඇතුළත්ව 1000 කට  අධික පිරිසක් මෙම වැඩසටහන් සඳහා සහභාගි විය. කොටස් වෙළෙඳපොළ ගනුදෙනු කිරීම සඳහා ආයෝජක උපදේශකවරුන් සතු බලපත්‍රය යාවත් කාලීන සඳහා අවම වශයෙන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් දෙකකට සහභාගි වීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනිවාර්යය කර ඇත. (රූප සටහන 13)

### රූප සටහන 13:  2013 වසර තුළ පවත්වන ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල විස්තරය




- ගනුදෙනුකරුවන් සමග කටයුතු කිරීමේදී කොටස් වෙළෙඳපොළ වෘත්තිකයන් සතු විය යුතු ආචාරශීලි හැසිරීම.
- ආයෝජක උපදේශකවරයකු විසින් දැනුවත්ව සිටිය යුතු මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ පැවතිය හැකි අඩුපාඩු සහ මඟහැරීම - 1
- ආයෝජක උපදේශකවරයකු විසින් දැනුවත්ව සිටිය යුතු මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ පැවතිය හැකි අඩුපාඩු සහ මඟහැරීම - 11
- කොටස් වෙළෙඳපොළ අක්‍රමිකතා
- ව්‍යුත්පන්න හැඳින්වීම
- ශ්‍රී ලංකාවේ ආයෝජන කර්මාන්තය තවදුරටත් ආකර්ෂණීය සහ ස්ථාවර කරන්නේ කෙසේද?
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි යෝජිත සංශෝධන පිළිබඳ පැහැදිලි කිරීමක්-1
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි යෝජිත සංශෝධන පිළිබඳ පැහැදිලි කිරීමක්-11
- ආයෝජන කළඹ කළමනාකරණයේ ප්‍රායෝගික අංශය

## කොටස් තැරැව්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන

ක්ෂේත්‍රයේ නියැලී වෘත්තිකයන්ගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධ මෑත කාලීන කරුණු සම්බන්ධ දැනුම පුළුල් කිරීමට  සහ අඛණ්ඩ පුහුණු සහ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් "ඉහළ හා පහළ යන වෙළෙඳපොළක නිසියාකාරව රැඳී සිටින්නේ කෙසේද?" යන මැයෙන් සම්මන්ත්‍රණයක් තැරැව්කාර ආයතනයන්හි නිලධාරීන් වෙනුවෙන් 2013 ඔක්තෝබර් මස 7 වැනි දින පවත්වන ලදී.

## ලැයිස්තුගත සමාගම්හි අධ්‍යක්ෂකවරුන් සඳහා වැඩසටහන

සමාගම් පනතේ විධි විධාන සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ භූමිකාව පිළිබඳව දැනුවත් කිරීමේ වැදගත්කම සලකා "ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂකවරුන්ට අදාළ සමාගම් පනතේ විධිවිධාන" මැයෙන් සම්මන්ත්‍රණයක් 2013 අප්‍රේල් 04 වැනි දින ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් පවත්වන ලදී.

## ආයෝජක වැඩසටහන

වර්තමාන හා අනාගත ආයෝජකයන් උදෙසා සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධ මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික අවබෝධයක් ලබාදීමේ අරමුණින් වැඩසටහන් තුනක් අප විසින් පවත්වන ලදී. සති අටක කාලයක් ආවරණය වන මෙම වැඩසටහන සඳහා සිසුන් 72 දෙනෙකු සහභාගි විය.

## උසස් ආයෝජක වැඩසටහන

සති හතක වැඩසටහනක් වන මෙම "උසස් ආයෝජක වැඩසටහන" දැනටමත් කොටස් වෙළෙඳපොළේ ආයෝජනයේ නිරතවන හෝ ප්‍රාග්ධන වෙළෙඳපොළ

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ආයෝජනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් පවතින පිරිස වෙනුවෙන් පවත්වන ලදී. එකී වැඩසටහන සඳහා සිසුන් 33 දෙනෙකු සහභාගි විය.

### මූල්‍ය ජනමාධ්‍ය සහතික පත්‍ර පාඨමාලාව

සලකා බලන කාලය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බැංකු අධ්‍යයන කේන්ද්‍රය සමගින් එක්ව "ජනමාධ්‍යවේදීන් සඳහා වන ආර්ථික විද්‍යා, බැංකුකරණය හා මූල්‍ය ඩිප්ලෝමාව" සිංහල මාධ්‍යයෙන් පවත්වන ලදී. විවිධ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය නියෝජනය කරමින් ජනමාධ්‍යවේදීන් 55 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගි වන ලදී. අදාළ වසර තුළ ඒ හා සමාන වැඩසටහනක් ඉංග්‍රීසි මාධ්‍යයෙන්ද ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ නියුතු මාධ්‍යවේදීන්ට මූල්‍ය අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමට මෙන්ම, තුළට තරුණ මාධ්‍යවේදීන් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම වැඩසටහන සකස් කරන ලදී.

### ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් උපාධි සඳහා විශ්වවිද්‍යාල තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධ විෂයන් හැදෑරීම සඳහා උපාධි අපේක්ෂකයින් දිරිගැන්වීම සඳහා ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයන්හි ප්‍රාග්ධන වෙළෙඳපොළ අංශයෙහි ඉහළ දක්ෂතා දක්වා උපාධි අපේක්ෂකයන්ට ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග පිරිනමයි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික විශ්වවිද්‍යාල 11 ක් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.

සලකා බලන වසර තුළ පහත සඳහන් විශ්වවිද්‍යාල අතුරින් උපාධි අපේක්ෂකයින් 7 දෙනෙකු සඳහා ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග පිරිනමන ලදී.

- කැලණිය විශ්වවිද්‍යාලය
- වයඹ විශ්වවිද්‍යාලය
- අග්නිදිග විශ්වවිද්‍යාලය
- රජරට විශ්වවිද්‍යාලය
- රුහුණු විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය

### පර්යේෂණ

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාර්ව ආර්ථිකය, සුරැකුම්පත් ක්ෂේත්‍රය, සමස්ත වෙළෙඳපොළ කාර්යය ඵල සම්බන්ධයෙන් පර්යේෂණ සහ කලාපීය වෙළෙඳපොළවල් සමග සංසන්දනය කිරීම් සිදුකරන ලදී. එම පර්යේෂණයන්හිදී අනාවරණය කරගත් කරුණු කෙටි වාර්තා, ඉදිරිපත් කිරීම් සහ වෙනත් විශේෂිත වාර්තා වශයෙන් අදාළ අංශයන්ට ලබාදෙන ලදී.

එසේම විශේෂිත ආයෝජන ක්‍රමෝපායන් සමඟ ප්‍රාග්ධන වෙළෙඳපොළේ ආයෝජනය කිරීම සඳහා දිරිගැන්වීමට සහ අඛණ්ඩව සබඳතාවයක් පවත්වා ගැනීමේ අරමුණින් ඇතැම් රාජ්‍ය අරමුදල් කළමනාකරුවන් වෙත ඉදිරිපත් කිරීම් සිදුකරන ලදී. විවිධ කලාපීය වෙළෙඳපොළවල් සම්බන්ධයෙන් අධ්‍යයනයන් පැවැත්වූ අතර ඒවායෙන් ඉස්මතු වූ කාරණාවන් රාජ්‍ය අරමුදල් කළමනාකරුවන් වෙත විධිමත් ආකාරයෙන් ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දෛනික වෙළෙඳපොළ සටහනක්, වෙළෙඳපොළ ප්‍රතිඵල විමසුමක් සහ වෙළෙඳපොළ හා සාර්ව ආර්ථිකය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයන් සිදුකර අදාළ පාර්ශවයන් වෙනුවෙන් ලබාදෙන ලදී.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුවත් කිරීම්

නිවැරදි ආයෝජන තීරණ ගැනීමට අවස්ථා පුළුල් කිරීමත්, ආයෝජනයන් සමග බැඳී පවතින අවදානම් තත්ත්වයන් පිළිබඳ නිසි තක්සේරුවක් ලබා ගැනීමටත් හැකිවන අයුරින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි පවතින ආයෝජන අවස්ථා පිළිබඳව මනා අවබෝධයක් ලබාදීමේ අරමුණ ඇතිව ආයෝජනය කරමින් සිටින ආයෝජකයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් දැනුවත් කිරීම් අඛණ්ඩව සිදුකරන ලදී. දැනටමත් ආයෝජනය කරමින් සිටින ආයෝජකයන්, නවක ආයෝජකයන් ඇතුළු විවිධ තරාතිරමේ ආයෝජකයන්ගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැඩමුළු ගණනාවක් ඊට ඇතුළත් විය. මෙම වැඩමුළු වල ඵලදායී බව ඉහළ නැංවීම සහ ඒ සඳහා
ඉහළ සහභාගීත්වයක් අපේක්ෂාවෙන් වෙළෙඳපොළ සහභාගිකරුවන් සහ කර්මාන්තයේ නියුතු ආයතන සමග එක්ව කටයුතු කරන ලදී.

## විද්‍යුත් මාධ්‍ය තුළින් සිදුකෙරුණු අධ්‍යාපනික වැඩසටහන්

### ''වරණ'' සජීවී රූපවාහිනී වැඩසටහන් මාලාව:

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ සිරස රූපවාහිනී නාලිකාව සමග එක්ව පැයක සජීවී රූපවාහිනී වැඩසටහන් මාලාවක් විකාශනය කරන ලදී. සජීවී රූපවාහිනී සාකච්ඡා වැඩසටහන් 23 කින් එය සමන්විත වූ අතර ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳව දැනට සිටින ආයෝජකයන්ට මෙන්ම ඒ පිළිබඳව උනන්දුවක් දක්වන නවක ආයෝජකයන්ට දැනුම ලබාදීම එහි මූලික අරමුණ විය.

කොටස් වෙළෙඳපොළ හා ඒකක භාර ආයෝජනය පිළිබඳව තුළනාත්මක තොරතුරු ඉදිරිපත් කෙරුණු විවිධ කාලීන වැදගත් කමකින් යුත් ගැටලු මෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය සම්බන්ධ මාතෘකා පාදක කරගත් සාකච්ඡාවලින් වැඩසටහන් මාලාව සමන්විත විය. මෙම සියලු සාකච්ඡා සඳහා සුරැකුම්පත් වෙළෙඳපොළ පිළිබඳ මනාවූ අත්දැකීම් වලින් යුත් කීර්තිමත් වෘත්තිකයන්ගේ දායකත්වය ලබා ගන්නා ලදී. වැඩසටහන අතරතුරදී නරඹන්නන්ට ප්‍රශ්න ඇසීමටද අවස්ථාව සලසමින් ඒ සඳහාම වෙන්කළ දුරකථන අංකයක්ද ලබාදුන් අතර ඒ සඳහා විශාල වශයෙන් ප්‍රතිචාර ලැබුණි. සෑම වැඩසටහනක් අවසානයේම දිනයේ සාකච්ඡාවට ගත් කරුණු ආශ්‍රයෙන් පැනයක් ප්‍රේක්ෂකයන්ට යොමු කරන ලද අතර නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කරන ලද අයට ත්‍යාග සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලද්දේ කොටස් තැරැව්කාර සමාගම් හා ඒකක භාර කළමනාකරණ සමාගම් විසිනි. ජයග්‍රාහකයන්ට කොටස් වෙළෙඳපොළෙහි සහ ඒකක භාරවල ආයෝජනයට අවස්ථාව උදාවිය.

මීට අමතරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම පිණිස විද්‍යුත් මාධ්‍ය සම්බන්ධ කර ගනිමින් අඛණ්ඩ සාකච්ඡා වැඩසටහන් සිදුකරන ලදී.

''වරණ රූපවාහිනී වැඩසටහන් මාලාව හරහා අසනු ලැබූ සතියේ පැනයට කෙටි පණිවුඩ, දුරකථන ඇමතුම් ආදිය මගින් පිළිතුරු එවූ ප්‍රේක්ෂකයන් සංඛ්‍යාව 31,137 ඉක්ම විය. මෙම රූපවාහිනී වැඩසටහන නරඹා ඒ මගින් ලබාදුන් දැනුම භාවිතා කරමින් නව ගිණුම් ආරම්භ කර රුපියල් මිලියන 128 ක් වටිනා කොටස්වල නව ආයෝජකයන් විසින් කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කර තිබූ අතර දැනට කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කරමින් සිටින ආයෝජකයන් විසින් රුපියල් මිලියන 780 ක දායකත්වයක් ලබා දී තිබුණි. (සංඛ්‍යා සටහන 14)

### සංඛ්‍යා සටහන 14: රූපවාහිනී වැඩසටහන්

| වැඩසටහන | විකාශන නාලිකාව | ආරම්භක දිනය | අවසන් වූ දිනය |
|---|---|---|---|
| ''වරණ'' රූපවාහිනී මාලාව | සිරස | 2013 ජනවාරි 23 | 2013 ජූලි 14 |
| ''කොටස් වෙළෙඳපොළයි ඔබයි'' දැනුම මිනුම තරගය | ස්වාධීන රූපවාහිනී සේවය | 2012 දෙසැම්බර් 22 | 2013 පෙබරවාරි 16 |

ප්‍රාග්ධන වෙළෙඳපොළ මහජනතාව අතරට ගෙනයෑම හා වෙළෙඳපොළ සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පවත්වන ලද වැඩසටහන් පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කිරීම හා ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ දැනුම පුළුල් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් සිදුකළ මෙහෙය අතිවිශාලය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පසුගිය වසර තුළ මාධ්‍ය සාකච්ඡා කිහිපයක් සංවිධානය කළ අතර දසවැදෑරුම් ව්‍යාපෘති 10 යේ ප්‍රගතිය ඇගයීම, 2013 වසරේ ගනු ලැබූ නියාමන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනාගත සැලසුම් පිළිබඳව දැනුවත් කිරීම් ආදිය ඉන් ප්‍රධානවේ.

## මුද්‍රිත මාධ්‍ය මගින් සිදු කෙරුණු කටයුතු

දිවයිනේ සියලු ප්‍රදේශයන් ආවරණය වන පරිදි සුරැකුම්පත් වෙළෙඳපොළ කෙරෙහි ඉහළ මහජන සහභාගීත්වයක් ලබාගැනීමට පහසුකම් සැලසීමත් මූල්‍ය සාක්ෂරතා මට්ටම ඉහළ නැංවීමත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මෙහෙය වූ දැනුවත් කිරීම් අතර ප්‍රමුඛස්ථානය ගන්නා ලදී. සෑම වසරකම පූර්ණ පිටු හා අර්ධ පූර්ණ පිටු වශයෙන් සතිපතා ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුවත් කිරීම් ලිපි මාලාවක් භාෂා ත්‍රිත්වයෙන්ම පළ කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු වන්නේ මෙම සියලු ලිපි පළකරන ලද්දේ කිසිදු ගාස්තුවක් අයකිරීමකින් තොරව වීමයි. තවද නිරන්තර පුවත්පත් දැන්වීම් මෙන්ම සම්මුඛ සාකච්ඡා සම්බන්ධ ලිපි පළ කිරීමට හැකියාව ලැබුණු අතර එය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීමටත් ආයෝජක විශ්වාසය ගොඩ නැංවීමටත් බෙහෙවින් ඉවහල් විය. (සංඛ්‍යා සටහන 15)

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

සංඛ්‍යා සටහන 15: පුවත් පත් මගින් සතිපතා පළකල ලිපි මාලාව

| පුවත්පත | පළ කරන ලද ලිපි මාලාව |
|---|---|
| ඩේලිමිරර් | 120 |
| දිනපතා ලංකාදීප | 80 |
| අද | 82 |
| වීරකේසරි | 25 |
| තිනකුරල් | 12 |

## සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් සිදුකළ දැනුවත් කිරීම්

### වෙළෙඳපොළ අතරමැදියන් සුපරීක්ෂණය හා අවේක්ෂණය පිළිබඳ ආසියා පැසිෆික් ආර්ථික සහයෝගිතා මූල්‍ය නියාමකයින් පුහුණු කිරීමේ කලාපීය වැඩමුළුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ අතරමැදියන් සුපරීක්ෂණය හා ආවේක්ෂණය පිළිබඳ ආසියා පැසිෆික් ආර්ථික සහයෝගිතා මූල්‍ය නියාමකයින් පුහුණු කිරීමේ කලාපීය වැඩමුළුව 2013 සැප්තැම්බර් මසදී සාර්ථක අයුරින් පවත්වන ලදී. වෙළෙඳපොළ ව්‍යුහය තුළ මෑතකදී සිදුවූ සංවර්ධනයන්, නියාමනයන් හා ඒවායේ බලපෑම පිළිබඳ තක්සේරුවක් ලබාගැනීම, අවදානම් පදනම් කරගත් සුපරීක්ෂණ ආකෘතියක් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් රාමුවක් නිර්මාණය කිරීම, ණයකර වෙළෙඳාම ශක්තිමත් කිරීම සඳහා වූ ආවේක්ෂණ ක්‍රමවේදයක් ඇති කිරීම හා සාමූහික ආයෝජන ක්‍රමයක් සඳහා වූ සුපරීක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම යනාදිය පිළිබඳව කලාපීය හා මධ්‍යස්ථ මට්ටමේ සුරැකුම්පත් නියාමකයින්ට අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණ විය.

හොංකොං, තායිලන්තය, මැලේසියාව, ඉන්දියාව, නේපාලය, කොරියාව, ෆීජී, නයිජීරියා, මොරිෂස්, චීනය ඇතුළු කලාපීය රටවල සහභාගිකරුවන් හා දේශීය සහභාගිකරුවන් විශාල ප්‍රමාණයක් මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගි විය.

### IOSCO සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ පිළිබඳ වැඩමුළුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ අන්තර්ජාතික සංවිධානය (IOSCO) සමග එක්ව සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. IOSCO හා ලෝක බැංකුව එක්ව "නැගී එන වෙළෙඳපොළක් සහිත රටවල් අතර සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය" මැයෙන් ඒකාබද්ධ වාර්තාවක්ද නිකුත් කරන ලදී. මෙම වැඩසටහන තුළින් විද්‍යාමාන වනුයේ එම වාර්තාවෙන් සොයා ගන්නා ලද බලාත්මක කිරීම් සම්බන්ධයෙන් ආයතන දෙක විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ය.

නියාමන රාමුවක් සංවර්ධනය කිරීම, ආයතනික ආයෝජකයන්ට වෙළෙඳපොළක් නිර්මාණය කිරීම, බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය හා මූල්‍ය ස්ථායිතාවය, ප්‍රාථමික වෙළෙඳපොළ රාමුවක් සංවර්ධනය කිරීම, පෞද්ගලික කොටස් නිකුතුන් හා අනෙකුත් නව හඳුන්වාදීම් ඇතුළු පුළුල් පරාසයක් සහිත මාතෘකා සම්මන්ත්‍රණයට අන්තර්ගත විය. මේ සඳහා දකුණු ආසියාව, නැගෙනහිර ආසියාව, යුරෝපය හා මැදපෙරදිග නියෝජනය කරන විදේශීය හා දේශීය සහභාගි කරුවන් විශාල ප්‍රමාණයක් සහභාගි විය.

### ආයෝජන දිනය


ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ අත්දැකීම් ඇති ආයෝකයන් මෙන්ම ඒ පිළිබඳ දැනුම අඩු ආයෝජකයන් යන දෙපිරිසටම නිවැරදි ආයෝජන තීරණ ගැනීම සඳහා අවශ්‍ය දැනුම හා මගපෙන්වීම් ලබාදීමේ අරමුණින් 2013 ආයෝජන දිනය සංවිධානය කරන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළ කොටස් තැරැව්කාර සමාගම්, ආයෝජන කළමනාකරුවන්, ආන්තික සැපයුම්කරුවන්, ලැයිස්තුගත සමාගම් හා ඒකක භාර කළමනාකාරණ සමාගම් ඇතුළු ප්‍රාග්ධන වෙළෙඳපොළ නියෝජනය කරන සියලු ආයතන එක් වහලක් යටතට ඒකරාශි වූ මෙම ආයෝජක දිනය වැඩසටහන තුළින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව ආයෝජකයන්ට මනා වූ දැනුමක් ලබා ගැනීමට වටිනා අවස්ථාවක් උදාවිය. දිනය පුරා පැවති මෙම සම්මන්ත්‍රණය භාෂා ත්‍රිත්වයෙන්ම සැකසුණු විවිධ මාතෘකා පදනම් කරගත් දේශන වලින් යුක්ත වූ අතර එම දේශන මෙහෙයවීම සඳහා දැනට කර්මාන්තයේ නියැලී සිටින ප්‍රමුඛ පෙළේ වෘත්තිකයන්ගේ දායකත්වය ලබා ගන්නා ලදී. තවද සම්මන්ත්‍රණය සඳහා සහභාගි වූ ආයෝජකයන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ භාෂා ත්‍රිත්වයෙන් සැකසුනු වීඩියෝ පට නැරඹීමටත්, කොටස් වෙළෙඳපොළ හා ඒකක භාරවල ආයෝජනය සඳහා දිනුම් අවස්ථා උදාකර ගැනීමටත් හැකිවිය.

### අනෙකුත් දැනුවත් කිරීමේ වැඩසටහන්

ගුරුභවතුන්, පාසල් සිසුන්, උපාධි අපේක්ෂකයින්, දැනට සිටින හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන ආයෝජකයන් හා

වෙළෙඳ හා කර්මාන්ත හිමියන්ගේ සංගම්වල සාමාජිකයින් ඇතුළු විවිධ මට්ටමේ ඉලක්ක ගත කණ්ඩායම් දැනුවත් කිරීමට එකම ක්‍රමවේදයක් නොගැළපෙන අතර ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා මූල්‍ය සාක්ෂරතා මට්ටම් තේරුම් ගෙන ඊට සරිලන සේ වඩාත් සක්‍රීය දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සකස් කිරීමට පසුගිය වසර තුළ පියවර ගන්නා ලදී. ඒ අනුව 2013 වසර තුළ පවත් වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳව විස්තරයක් පහත වගුවෙහි දැක්වේ. (රූප සටහන 14)

### රූප සටහන 14: දැනුවත් කිරීමේ වැඩසටහන්




### අනෙකුත් ක්‍රියාකාරකම්

### “ආයෝජනයට මුල පුරමු” කෘතිය එළි දැක්වීම

“ආයෝජනයට මුල පුරමු” මැයෙන් වූ කෘතිය එළි දැක්වීමේ මූලික අරමුණ වූයේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳව දේශීය ආයෝජකයින්ගේ දැනුම ඉහළ නැංවීමත්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීත්වය ඉහළ නැංවීමත්ය. මෙම කෘතිය ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ ප්‍රායෝගික මෙන්ම වඩා ප්‍රයෝජනවත් මාතෘකා රැසකින් යුක්ත වන අතර උදාහරණ ලෙස ආයෝජකයකු ආයෝජනය ආරම්භ කිරීමට ප්‍රථමව සලකා බැලිය යුතු කරුණු කොටස් වෙළෙඳපොළ ආයෝජනය පියවරෙන් පියවර, ඒකක භාර ආයෝජනය, ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනයේදී ආයෝජකයන් සිදු කරන පොදු වැරදි හා කොටස් තෝරා ගන්නේ කෙසේද යන මාතෘකා පෙන්වා දිය හැකිය. ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව සිංහල බසින් ලියවුනු පොත්පත් ඉතා අල්ප වන අතර ඊට පිළියමක් ලෙසත් මෙම කෘතිය පළ කළ අතර එහි අන්තර්ගතයන් සඳහා පාදක කර ගනු ලැබුවේ මීට ඉහතදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලංකාදීප පුවත්පත සමග පළ කළ ලිපි පෙළකි.

### ශ්‍රී ලංකා  සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිල ලාංඡනය නැවත දියත් කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිල ලාංඡනය ස්ථාපිත කර දශක දෙකකට වඩා වැඩි කාලයක් ඉක්මවා යාමත්, වර්තමාන නියාමන හා සංවර්ධන ක්‍රියාදාමයන් වඩාත් කැපී පෙනෙන අයුරින් පිළිඹිබු කිරීමත් නව නිල ලාංඡනය දියත් කිරීමට හේතු විය. මෙම නව නිල ලාංඡනය තුළින් ආයතනයේ යම් යම් අත්‍යවශ්‍ය අංග ලක්ෂණයන් හෙළිදරව් කිරීමත්, ක්‍රියාවලිය හා අරමුණු පැහැදිලි කිරීමත්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පොදු පිළිගැනීම විදහා පෙන්වීමත් සිදුකරනු ලබයි.

## මානව සම්පත්

ආයතනයක සාර්ථකත්වය උදෙසා මානව සම්පත ඉතාමත්ම වැදගත් සාධකයකි. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රමවත්ව නියාමනය කිරීම හා දියුණු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් මුලපුරන ලද දස වැදෑරුම් මූලික අරමුණු අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමේදී කාර්ය මණ්ඩලයේ හැකියාවන් දක්ෂතාවයන් කැපවීම. වගකීමට බැඳීම සහ වෘත්තිය නිපුනත්වය විශාල වශයෙන් මෙම  වසර තුළ කැපී පෙනුනි.

### කාර්යමණ්ඩලයේ සංයුතිය

පෙර වසරවල පරිදිම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන ධාරිතාවය ශක්තිමත් කිරීම අරමුණින් දක්ෂතාවයෙන් පිරිපුන් පිරිසක් අලුතින් බඳවා ගන්නා ලදී. වර්ෂය තුළ ස්ථිර තනතුරු සඳහා අධ්‍යක්ෂවරුන් තුන්දෙනෙකු විධායක නිලධාරීන් තුන් දෙනෙකු සහ නිලධාරීන් තුන්දෙනෙකු ඇතුළත්ව නව බඳවා ගැනීම් නවයක් සිදුකර ඇති අතර 2012 වසර සංසන්දනය කිරීමේදී මෙය විධායක නිලධාරීන් පස් දෙනෙකු සහ කාර්යාල සහායකයකු ඇතුළත්ව නව බඳවා ගැනීම් හයකි.

එයට අමතරව දසවැදෑරුම් මූලික අරමුණු අධීක්ෂණය කර කඩිනම් කිරීමේ අරමුණින් කොන්ත්‍රාත් පදනම මත උපදේශක දෙදෙනකු බඳවා ගන්නා ලදී.

මෙම වසර තුළ අධ්‍යක්ෂ ජනරාල්, එක් අධ්‍යකෂවරයකු, එක් ජ්‍යේෂ්ඨ විධායක නිලධාරියකු, විධායක නිලධාරීන් තුන්දෙනකු සහ නිලධාරියකු  ඇතුළත්ව සේවයෙන් ඉවත්වී යාම් හතක් වාර්තා වන අතර 2012 වර්ෂය සැසඳීමේදී එක් විධායක නිලධාරියකුගේ සේවයෙන් ඉවත්වීමක් වාර්තා විය. අනුමත ක්‍රියා පිළිවෙලට අනුව,

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


විධායක නිලධාරීන් හයදෙනෙකු ජ්‍යෙෂ්ඨ විධායක තනතුරටත් එක් නිලධාරියකු විධායක නිලධාරි තනතුරටත් පුස්තකාල නිලධාරී විධායක ශ්‍රේණියට සහ එක් රහස්‍ය ලේකම්වරියක් විධායක ලේකම් තනතුරටත් වශයෙන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් නව දෙනෙකු ඔවුන්ගේ හොඳ කාර්යක්ෂමතාවය, හැසිරීම සහ ආයතනය වෙත කරනලද සේවය සලකා බලා ඉහල තනතුරු සඳහා උසස් කරනු ලැබීය. උසස් කරන ලදී. බඳවා ගැනීම් පටිපාටියට ගැලපෙන අයුරින් අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද සම්පූර්ණ කරන ලද අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා ඉහළ තනතුරුවලට ඉල්ලුම් කිරීමේ හැකියාව නිරන්තරයෙන්ම ලබාදී ඇත. ඒ අනුව තරගකාරී තෝරාගැනීම් පටිපාටියකින් පසුව සහකාර අධ්‍යක්ෂ තනතුරක් සඳහා අභ්‍යන්තරව බඳවා ගැනුණි. (සංඛ්‍යා සටහන 16)

සංඛ්‍යා සටහන 16: කාර්ය මණ්ඩල සංයුතිය 2013 දෙසැම්බර් 31 වන දිනට


| තනතුර | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වර්තමානයේ සේවයේ නියුතු සංඛ්‍යා | | පුරප්පාඩු තනතුරු |
|---|---|---|---|---|
| | | ස්ථිර තනතුරු | කොන්ත්‍රාත්තු පදනමට | |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | - | | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | | - |
| අධ්‍යක්ෂ | 11 | 8 | 2 | 1 |
| සහකාර අධ්‍යක්ෂ | 5 | 3 | | 2 |
| කළමනාකරු | 8 | 4 | | 4 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | 43 | 14 | | - |
| විධායක නිලධාරීන් | | 24 | 1 | 4 |
| විධායක නොවන නිලධාරීන් | 17 | 16 | | 1 |
| ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර | 10 | 6 | | - |
| කාර්යාල සහකාර | | 1 | | - |
| කාර්යාල සහායක | | 1 | 2 | |
| එකතුව | 96 | 78 | 5 | 13 |

2013 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලය 83 ක් වන අතර එහි සංයුතිය පුරුෂ 31 ක් සහ ස්ත්‍රී 52 කින් සමන් විත වේ. කාර්ය මණ්ඩල සංයුතිය සේවා කාල විමර්ශනය, ස්ත්‍රී පුරුෂ විමර්ශනය සහ  වයස් විමර්ශනය පහත සඳහන් රූප සටහන් මගින් පෙන්වා ඇත. (රූප සටහන් 15, 16, 17, 18)


රූප සටහන 15: සේවක තනතුරු අනුව කාර්ය මණ්ඩල සංයුතිය




රූප සටහන 16: ස්ත්‍රී පුරුෂ භාවය




රූප සටහන 17: වයස් සංයුතිය




25-35 අතර | 36-45 අතර | 46-57 අතර

රූප සටහන 18: සේවා කාලය පිළිබඳ තොරතුරු ප්‍රතිශතයක් වශයෙන්




වසර 2 දක්වා | 3-6 වසර දක්වා | 7-10 දක්වා | 11-14 වසර දක්වා | 15 වසර දක්වා

## පුහුණුව හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනය පුහුණුව හා සංවර්ධනය පිළිබඳ ඇති වගකීම මොනවට පෙන්නුම් කරමින් සුරැකුම්පත් සහ විනිමය කොමිසම එහි කාර්යමණ්ඩලයේ නියාමන ශිෂ්‍යත්ව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වැදගත් සංදිස්ථානයක් පිළිබිඹු කරමින් වරලත් මූල්‍ය විමර්ශකයින්ගේ ආයතනය (CFA) සමග ගිණුමකට එළඹීය.

මෙමගින් දිරිගැන්වූ අපගේ කාර්යමණ්ඩලය ඔවුනගේ ඉතාමත් කාර්යබහුල න්‍යාය පත්‍රය යටතේ වුවද මෙම අධ්‍යාපන වැඩසටහන ගැන සැලකිලිමත්වී කැමැත්තෙන්ම වැළඳ ගත්හ.

මෙම වැඩසටහන සාර්ථක කිරීමට සහය දැක්වූ වරලත් මූල්‍ය විමර්ශකයින්ගේ ආයතනයේ කාර්යමණ්ඩලවලට අපගේ ස්තුතිය පිරිනමමු.

අප තදින්ම විශ්වාස කරන කරුණක් වනුයේ කාර්යමණ්ඩලයේ අධ්‍යාපනය පුහුණුව හා සංවර්ධනය ඔවුන්ගේ ශක්තීන් සහ බලතල එළිදැක්වීමට ඉඩ ලබා දෙන අතර ඒ තුළින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන කටයුතු කාර්යක්ෂමව ඉෂ්ඨ කිරීමට මගපෙන්වන බවයි. එම නිසා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි සේවක මණ්ඩලය සඳහා වෙනත් බල අධිකාරීන් මගින් ගැළපෙන පුහුණු හා සංවර්ධන අවස්ථා ලබාදී ඇත. මෙම පාඨමාලා මගින් විශේෂයෙන් පෙන්වා දෙනු ලබන සිද්ධි අධ්‍යායනයන් තුළින් වෙනත් සමගාමී නියාමන ආයතන විධිමත් ආකාරයෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළ හැසිරවීමේදී පැන නගින නියාමන ගැටළු සහ අභියෝගවලට මුහුණ දෙන ආකාරය සහ යහ පුරුදු පිළිබඳ නව දැක්මක් ලබාගැනීමට අවස්ථාව උදාවී ඇත.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOSCO) සහ අනෙකුත් ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආයතන ආසියා ශාන්තිකර කලාපීය ආර්ථික සංවිධානය වැනි ආයතන මගින් කාර්යමණ්ඩලය වෙත අති විශාල වශයෙන් ඉතා යෝග්‍ය සහ ප්‍රයෝජනවත් පුහුණු වැඩසටහන් සංවිධානය කරමින් ලබාදුන් අසීමිත සහයෝගය වෙනුවෙන් අපගේ අවංක අගය කිරීම පිරිනැමිය යුතුය.

කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ඔවුන්ගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම වර්ධනය කිරීමෙහිලා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසමෙහි පුහුණු අංශය මගින් මෙහෙයවනු ලබන අධ්‍යාපන පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබාදී ඇත. එයට අමතරව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යාල සාමාජිකයන් සඳහා සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වසර දෙකක් සේවය කිරීමේ (වසර දෙකක ඇපයකට) බැඳීමට යටත්ව පශ්චාත් උපාධි පාඨමාලා ඇතුළත්ව උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රාහක දීමනා ලබාදීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු අධ්‍යපන කේන්ද්‍රය මගින් සංවිධානය කරන ලද වැඩසටහන්ද ඇතුළත්ව ගැළපෙන දේශීය පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සඳහා ද කාර්ය මණ්ඩලය සහභාගි විය.

2012 වර්ෂය සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා වැයකළ රුපියල් 18,961,953/= හා සංසන්දනය කර බලන කළ 2013 වර්ෂය සඳහා එය රුපියල් 22,142,023/= වී ඇත.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසම 2012 වර්ෂය සඳහා කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය නියෝජනය කරන විවිධ වෘත්තීය පුහුණු ආයතන සඳහා ගෙවිය යුතු සාමාජික ගාස්තු වශයෙන් ගෙවන ලද රුපියල් 392,145/= හා සංසන්දනය කර බලන කළ 2013 වර්ෂය සඳහා එය රුපියල් 512,265/= විය.

## කාර්යමණ්ඩල සහභාගිත්වයන්

කාර්යමණ්ඩලය දස වැදෑරුම් මූලික අරමුණු සඳහා ඉමහත් කැපවීමෙන් ඔවුන්ගේ නිර්මාණාත්මක අදහස් ලබාදෙමින් සහ විවිධ කාර්යයන්ගේ නියුතු කණ්ඩායම්වල සහ අනෙකුත් ආයතන සමග සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසමෙහි උපායමාර්ගික අරමුණු ඉෂ්ඨ කර ගැනීමට දායකත්වය සපයන ලදී.

## කාර්ය මණ්ඩල ඇගැයීම

පාරිතෝෂික හා පිළිගැනීම මත පදනම් වූ විධිමත් ක්‍රියාකාරකම් ඇගයීමේ ක්‍රමයක් තුළින් ක්‍රියාකාරකම් මූලික සංස්කෘතියක් වෙත නැඹුරුවීමේ වැදගත්කම අප වටහාගෙන ඇත. මේ සඳහා පිරිස් කළමනාකරණය සම්බන්ධව විධිමත් අධ්‍යාපනයක් සිදුකර ක්‍රමවත් ප්‍රතිලාභ කළමනාකරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට හා නිසි ක්‍රියාපිළිවෙළක් ක්‍රියාමත්මක කිරීමට මානව සම්පත් උපදේශකයකු පත් කරන ලදී.

කාර්යමණ්ඩලයේ යහපත් සෞඛ්‍ය සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ වත්කමයි. එම නිසා කාර්යමණ්ඩලයට කාර්යක්ෂම හා සමතුලිතව වැඩ කිරීමේ ජීවිතය පවත්වාගෙන යාමට උනන්දු කරවීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී තමන්ගේ නිවාඩු ලබාගැනීමට අවස්ථාව ලබාදීම සහ කාර්යාල දිනයන්හි නගරයට ළඟාවීමේදී කාර්ය මණ්ඩලය මුහුණ දෙන දුෂ්කරතාවයන් නිසා ඇතිවන ආතතිය මැඩපැවැත්වීමට නිදහස පැමිණවීමේ ක්‍රමයක් අවශ්‍ය අවස්ථාවලදී භාවිතා කිරීමට අවස්ථාව උදාකර ඇත.

එයට අමතරව ආයතනයේ සේවක මණ්ඩලය වෙත විවිධාකාර වූ සුබසාධන පහසුකම් සලසා දෙන අතරතුර බාහිර සහ අභ්‍යන්තර වෛද්‍ය පහසුකම්, ණය පහසුකම්, පොලී සහනාධාර ලබාදීම වැනි පහසුකම් සලසා දී ඇත. කොමිෂන් සභා සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කිරීමටත් ඔවුනගෙ සැඟවුණ දක්ෂතා හඳුනා ගැනීමටත් එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පවුල්වල සාමාජිකයන් අතර බැඳීම වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රීඩා දිනය සහ නත්තල් ප්‍රිය සම්භාෂණය වැනි වාර්ෂික කාලසටහනට අයත් වැඩසටහන් පවත්වන ලදී.

## තොරතුරු තාක්ෂණ අංශය

විශේෂයෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන මාර්ග සටහන (Capital Market Development Road Map) සහ මූලික ව්‍යාපෘතීන් දහයේ (10 Key projects) ප්‍රගතින් නිරූපණය වන ආකාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් භාවිතයනට පහසුවන ආකාරයට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවිය නොකඩවා යාවත්කාලීන වන ප්‍රස්ථාර සහ ගනුදෙනු දත්ත සහිතව වැඩි දියුණු කරන ලදී. 2012 වසරේදී යථාර්ථයක් බවට පත්වූ පද්ධති තාත්වීකරණය (IT Disaster Recovery Site) යෙදවීමට පියවර ගන්නා ලදී. ආපදා අවස්ථාවකදී තොරතුරු තාක්ෂණික සේවාවන් අවම අක්‍රීය කාලයකින් සහ අවම බාධාවන්ගෙන් පැවතීම සනාථ කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ආපදා ප්‍රතිසාධන අඩවියක් අවශ්‍ය වේ.

## අනෙකුත් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම.

කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂකවරුන්ට සිය සමාගම්වල කටයුතු වඩාත් කාර්යක්ෂමව කලමනාකරණය කිරීමේ හැකියාවන් ඔප්නැංවීම හා සාංගමික යහපාලය, මූල්‍යමය වාර්තාකරණය සහ නියාමන කටයුතු සම්බන්ධව ඔවුන්ගේ ඇති දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම අරමුණු කරගෙන ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂකවරුන් වෙනුවෙන් පාඨමාලාවන් සංවිධානය කිරීමේ කටයුක්ත සඳහා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී සංගමය මෙම වසර තුළදී අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. එකී අවබෝධතා ගිවිසුම ඉදිරියට වසර දෙකක් පුරාවට බලපැවැත්වේ.

# ව්‍යවස්ථාපිත අරමුදල්

## සෙල් අරමුදල

2009 අංක 47. 2003 අංක 18 හා 1991 අංක 26 දරන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14 ඒ සහ 14 බී යන වගන්තිවල මෙසේ සඳහන් වේ.

14ඒ

(1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනු ප්‍රමාණයකට අනුව වූ සෙස් බද්දක් බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු හුවමාරු ස්ථානයක වාර්තා ගත සෑම සුරැකුම්පත් මිලදී ගැනීමක් හා විකිණීමක් වෙනුවෙන්ම එහි රීති යටතේ සඳහන් කර ඇති ආකාරයටකට ගැණුම්කරු හා විකුණුම්කරු යන දෙදෙනාම විසින් නියම කිරීම්, අයකිරීම් හා ගෙවීම් කිරීම් සිදු කළ යුතුය. විවිධ වත්කම් සංචිත වෙනුවෙන් විවිධ අයකිරීමේ අනුපාතයන් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ධ වෙනත් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්ධකට හෝ සෙස් බද්ධකට අමතරව විය යුතුයි.

14බී

(1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටු වනු ලැබිය යුතු වන අතර 14 ඒ වගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කළ යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නාවූ මුදල් ප්‍රමාණයන් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදලින් පහත සඳහන් කාර්යයන් සිදු කිරීමට හැකියාව ඇත.
   (ඒ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම
   (බී) 18 වන වගන්තිය යටතේ ස්ථාපිත කොට ඇති වන්දි අරමුදලේ බරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා සහ
   (සී) කොමිෂන් සභාවේ අරමුණු කරා ළඟාවීවේදී ඊට අවශ්‍ය බලතල, කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට.

(3) සෙස් අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව තීරණය කරන ආකාරයකට ආයෝජනය කළ හැකිය.

2010 අගෝස්තු මස 01 වන දින සිට දෙවන වතාවටත් කොමිෂන් සභාව මගින් එක් ගණුදෙනුවක් සඳහා වන සෙස් බදු අනුපාතය 0.09% සිට 0.072% දක්වා පහත හෙළන ලදි. මීට කලින් එය වෙනස් කරන ලද්දේ 2003 දෙසැම්බර්ම් 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි 0.1% සිට 0.09% දක්වා අඩු කිරීමෙනි.

2011 ජනවාරි 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් මිලියන 50 ක් හා මිලියන 50 වඩා වැඩි වටිනාකමකින් යුත් ගණුදෙනු සඳහා අය කරනු ලැබූ සෙස් බද්ධ පිළිවෙලින් 0.072% ක් හා 0.045% ක් විය.

2006 පෙබරවාරි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි යම් ආයෝජකයකු එකම සුරැකුම්පත් විශේෂයක් එකම දිනකදී එකම තැරැව්කාර සමාගමක් හරහා මිලදී ගෙන විකුණුවේ නම් හෝ විකුණා නැවත මිලදී ගත්තේ නම් එවැනි එක්දින ගණුදෙනු සඳහා වන තැරැව්කාර ගාස්තුව, කොටස් වෙළෙඳපොළ සෙස් බදු, මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගාස්තුව හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බදු යනාදී ගණුදෙනු පිරිවැය ගණුදෙනුවේ එක් පාර්ශවයකට අය කරනු නොලැබේ. එවැනි අවස්ථාවක ගණුදෙනුවේ දෙපාර්ශවය වෙනුවෙන්ම අයකරන කොටස් ගණුදෙනු ගාස්තුව වනුයේ 0.300% කි.

- මිලදී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණුනු ලැබූ කොටස් ප්‍රමාණය හා සමාන නොවන අවස්ථාවක දී මිලදී ගත් හෝ විකුණනු ලැබූ දෙකින් කවර හෝ එකක අඩු ප්‍රමාණය සඳහා සෙස් බද්ධ අය නොකෙරේ.

- මිලදී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණනු ලැබූ කොටස් ප්‍රමානය සමඟ සමාන වන අවස්ථාවකදී මිලදී ගත් හෝ විකුණනු ලැබූ දෙකින් කවර හෝ ගණුදෙනුවන දෙවන ගණුදෙනුව සඳහා සෙස් බද්ධක් අය නොකෙරේ.


එකම සුරැකුම්පත් වීශේෂයක් එකම දිනකදී එකම තැරැව්කාර සමාගමක් හරහා මිලදී ගෙන විකුණුවේ නම් හෝ විකුණා නැවත මිලට ගත්තේ නම් එවැනි ගණුදෙනු එක් දින ගණුදෙනු ලෙස හැඳින් වේ.

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් මාරු කර බැර කරන ලදි. එමෙන්ම 2009 සහ 2010 යන වසර වලදී සමානව රුපියල් මිලියන 100 බැගින් සෙස් අරමුදලින් පියවීම් සහතික කිරීමේ අරමුදලට මාරු කර බැර කරන ලදි. තවද මිලියන 276 ක්, මිලියන 380 සහ මිලියන 94 ක් වශයෙන් අවස්ථා තුනකදී පිළිවෙලින් 2010.09.30, 2012.12.31 යන දිනයන්හිදී ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

2013 දෙසැම්බර් 31 වන දිනට මෙම අරමුදලේ ශේෂය රුපියල් 2,193,243,136/- ක් විය. 2004 වසරේ සිට 2013 වසර දක්වා මෙම අරමුදලෙහි ශේෂයෙහි වර්ධනය පහත ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කරයි. (රූප සටහන 19)

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

රූප සටහන් 19: සෙස් අරමුදලේ වර්ධනය




## වන්දි අරමුදල

වර්ෂ 1987 දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටු වීමත් සමගම වන්දි අරමුදලද ආරම්භ කරන ලදි. 1987 අංක 36 දරන සංශෝධිත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 38 වන වගන්තියෙහි මෙසේ සඳහන් වේ.

- බලපත්‍ර ලාභී කොටස් තැරැව්කරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම් ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීම හේතු කොට ගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයෙකුට වන්දි ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා මෙම වන්දි අරමුදලක් පිහිටු වන ලදී.

- එම වන්දි අරමුදලෙහි පහත සඳහන් කරුණු අන්තර්ගත වේ.

    - වන්දි අරමුදලෙහි කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල්

    - පනතේ 51අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලැබූ මුදල් (51අ වගන්තිය යනු වරද සමථයකට පත් කිරීම සම්බන්ධයෙන් වූවකි)

    - සෙස් අරමුදල මගින් පනතේ 14අ වගන්තිය යටතේ බැර කරනු ලබන මුදල්


- වන්දි අරමුදලෙහි බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට ආයෝජනය කළ හැකිය.

අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජකයන් අතුරෙන් තිදෙනෙකු වන්දි කමිටුවේ සමාජකයන් ලෙස පත් කළ යුතුය.

පත් කරන ලද කමිටුව 49 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රධානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතුය. තවද එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රධානයක් සම්බන්ධයෙන් කමිටුව ගන්නා තීරණය අවසානාත්මක තීරණය වන්නේය.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සළසා ඇත. පනත අනුව ඉල්ලම් කරුගේ හිමිකම් සනාථ කිරීම පිණිස ඉදිරිපත් කරන ලද ලේඛන හෝ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව හෝ යම් විභාග යක් පැවැත්වූ විටෙක එකී විභාගය අවසාන වූ විට කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසරදීම හෝ නොදීම කළ හැක. වන්දි අරමුදල වඩාත් ශක්තිමත් කිරීම සඳහා සෙස් අරමුදලෙන් රුපියල් මිලියන 50ක් මාරු කරන ලදි. 2013 දෙසැම්බර් 31 වන දිනට මෙම අරමුදලේ ශේෂය රුපියල් 267,950,575/- ක් විය. 2004 වසරේ සිට 2013 වසර දක්වා මෙම අරමුදලෙහි ශේෂයෙහි වර්ධනය පහත ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කරයි. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා වාර්තා වී නොමැත. (රූප සටහන 20)

රූප සටහන් 20: වන්දි අරමුදලේ වර්ධනය




## පියවීම් සහතික කිරීමේ අරමුදල

මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටු වන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොලහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගී කරුවන් අතර වෙළෙඳ ගණුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම අරමුදලෙහි ක්‍රියාකාරිත්වය පහත සඳහන් පරිද්දෙන් විස්තර කළ හැකිය.

- කොටස් ගණුදෙනුවක් වූ සැනින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි


කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් බේරුම් කිරීමේ කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී. එනම් ගැණුම්කරු විසින් T+3 පදනම මත, එනම් ගණුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළැඹෙන සිව්වන දිනයේ දී අදාළ ගෙවීම් සිදු කළ යුතු වන අතර විකුණුම්කරුට T+3 පදනම මත එනම් ගණුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළැඹෙන සිව්වන දිනයේ දී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් හිමිකම් පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතර මැදි කාලයක් පැවතීම හේතුවෙන්, සුරක්ෂිත නොවන පියවීමේ අවදානමක් ඇති වන නිසා මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාවය ඇති විය.

- මෙම අරමුදලේ භාර කරුවන් නිල බලයෙන් ඊට පත් වනු ලබන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති, කොළඹ කොටස් හුවමාරුවේ හි සභාපති, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන් ඊට අයත් වේ.
- ශ්‍රී ලංකා රජය මෙම අරමුදලට රුපියල් මිලියන 50ක මුදලක් ප්‍රධාන කොට තිබේ. මෙම අරමුදලට භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර ඇත. මෙ අරමුදලට ප්‍රති පූර්ණක වශයෙන් පරිත්‍යාග තෑගී සහ ප්‍රධානයන් ලබා ගැනීමට හැකි වේ. කොටස්
තැරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායක වීමෙහි අවශ්‍යතාවයක් නොමැත.
- මෙම අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වන වසර වලදී සෙස් අරමදලින් රුපියල් මිලියන 100 බැගින් මෙයට බැර කරනලදී. පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරක ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මසදී කොළඹ කොටස් හුවමාරුව විසින් ද රුපියල් මිලියන 100ක් මෙම අරමුදලට බැර කරන ලදී.

කෙසේ වෙතත් පියවීම් සහතික කිරීමේ අරමුදල පියවීමේ අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස මධ්‍යම නිෂ්කාශන ආයතනයක් ස්ථාපනය කිරීමේ හැකියාව පිළිබඳව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශක්‍යතා අධ්‍යයනයක නිරත වී සිටියි. එම මධ්‍යම නිෂ්කාශන ආයතනයේ ප්‍රාග්ධනයෙන් කොටසක් නියෝජනය කරනුයේ ද මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලයි.

මේ දක්වා පියවීම් සහතික කිරීමේ අරමුලින් හිමිකම් ඉල්ලීමක් ඉදිරිපත් වී නොමැත. 2013 දෙසැම්බර් 31 වන දින වන විට මෙම අරමුදලේ බැර ශේෂය රුපියල් 582,380,106/-ක් විය. ඒ අනුව 2004 සිට 2013 වසර දක්වා මෙම අරමුදලෙහි වර්ධනය පහත ප්‍රස්ථාරය මගින් පෙන්නුම් කරයි. (රූප සටහන 21)

රූප සටහන් 21: පියවීම් සහතික කිරීමේ අරමුදලේ වර්ධනය



# අතිරේක තොරතුරු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදී ඇති ඒකක භාර කළමනාකරණ සමාගම්

1. සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්
   - සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ්
   - සිලෝන් ඉන්කම් ෆන්ඩ්
   - සිලෝන් ටුවරිසම් ෆන්ඩ්
   - සිලෝන් ෆයිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ්
   - සිලෝන් අයි ජී ඕ ෆන්ඩ්
   - සිලෝන් එම් ටී අයි ෂරියා ෆන්ඩ්
   - සිලෝන් ග්ලෝබල් සස්ටේනබිලිටි ෆන්ඩ්
   - සිලෝන් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - සිලෝන් ට්‍රෙෂරි බිල් ෆන්ඩ්

2. කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - ක්‍රොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ්
   - ක්‍රෙසන්ට් අයි ෆන්ඩ්
   - ක්‍රොම්ට්‍රස්ට් මනිමාකට් ෆන්ඩ්
   - ක්‍රොම්ට්‍රස්ට් ඒඩීඑල් මුදරබා ෆන්ඩ්
   - ක්‍රොම්ට්‍රස්ට් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්

3. එන්ඩීබී වෙල්ත් මැනේජ්මන්ට් ෆන්ඩ්
   - ඊගල් ග්‍රොත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ්
   - ඊගල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - ඊගල් ෆික්ස්ඩ් ඉන්කම් ෆන්ඩ්
   - ඊගල් ග්‍රොත් ෆන්ඩ්
   - ඊගල් මනි ෆන්ඩ්
   - ඊගල් මනි ප්ලස් ෆන්ඩ්
   - ෂෝට් ටර්ම් එල් කේ ආර් ට්‍රෙෂරි ෆන්ඩ්

4. සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - සීබෑන්ක් යුනිට් ට්‍රස්ට්
   - සීබෑන්ක් සෙන්චරි ග්‍රොත් ෆන්ඩ්
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ආවෘත අරමුදල්)
   - සීබෑන්ක් සේවිංග්ස් ප්ලස් මනි මාකට් ෆන්ඩ්
   - සීබෑන්ක් සුරැකුම්
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (බී සීරීස්)

5. නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - නාමල් ඉන්කම් ෆන්ඩ්
   - නාමල් මනි මාකට් ෆන්ඩ්
   - නාමල් ඉක්විටි ෆන්ඩ්
   - නාමල් ග්‍රොත් ෆන්ඩ්
   - නාමල් ඇක්විටි වැලුයු ෆන්ඩ් (ආවෘත අරමුදල්)
   - නාමල් අයිජීඕ ෆන්ඩ්
   - නාමල් හයි යීල්ඩ් ෆන්ඩ්
   - නාමල් ෂරියා ෆන්ඩ්

6. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - ෆස්ට කැපිටල් වෙල්ත් ෆන්ඩ්

7. ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - ජේ බී වන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ්
   - ජේ බී වන්ටේජ් වැලුයු ඉක්විටි ෆන්ඩ්

8 ගාර්ඩියන් ඇක්විටි ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - ගාර්ඩියන් ඇක්විටි ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
   - ගාර්ඩියන් ඇක්විටි ඉක්විටි ෆන්ඩ්

9. කැන්ඩර ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - කැන්ඩර් කැපිටල් ග්‍රෝත් ෆන්ඩ්
   - අමානා කැන්ඩර් ෂරියා ෆන්ඩ්

10. ඇසට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්)  ලිමිටඩ්
    - ඇස්ටෲ ගිල්ට් එජ් ෆන්ඩ්
    - ඇස්ටෲ මනි මාකට් ෆන්ඩ්

11. කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
    - කැපිටල් එලයන්ස් හයි යීල්ඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කෝපරේට් ට්‍රෙෂරි ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කොන්ටිටේටිව් ඉක්විටි ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස්  ඉන්වෙස්ට්මන්ට් ග්‍රේඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස්  ඉන්කම් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස්  ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස්  මීඩියම් රිස්ක් ඩෙට් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස්  කෝපරේට් ඩෙට් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්

12. ආර්පිකෝ ඇටරාසියා ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ්
    - ආර්පිකෝ ඇටරාසියා රෙපෝ ෆන්ඩ්
    - ආර්පිකෝ ඇටරාසියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ් (ගිල්ට් එජ් ෆන්ඩ්)
    - ආර්පිකෝ ඇටරාසියා S & P SL20 ඉන්ඩෙක්ස් ෆන්ඩ්

13. ඔරියන්ට් වෙල්ත් ලිමිටඩ්
    - ඔරියන්ට් කෝපරේට් ඩෙට් ෆන්ඩ්
    - ඔරියන්ට් ඉක්විටි ෆන්ඩ්
    - ඔරියන්ට් ගිල්ට් එජ් ෆන්ඩ්

## තැරැව්කාර සමාගම් සහ කොටස් වෙළෙන්දන්

2013 දෙසැම්බර් 31 වන දින වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා ඇති කොටස් තැරැව්කාර සමාගම්

| සමාගම් |
|---|
| ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ආශා ෆිලිප්ස් සෙකියුරිටීස් ලිමිටඩ් |
| ඒෂියා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ඇසෙට්ලයින් සෙකියරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| බාට්ලීට් රෙලිගයා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| කැන්ඩෝර් ඉක්විටීස් ලිමිටඩ් |
| කැපිටල් ඒලයන්ස් ලිමිටඩ් - (ණය සුරැකුම්පත්) |
| කැපිටල් ඒලයන්ස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| කැපිටල් ට්‍රස්ට් සෙකියඅරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ක්ලැරිජ් ස්ටෝ බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සී ටී ස්මිත් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ෆස්ට් කැපිටල් ඉක්වීටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් - (ණය සුරැකුම්පත්) |
| ෆස්ට් ගාර්ඩියන් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| අයි අයි එෆ් එල් සෙකියඅරිටීස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ජේ බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ජෝන්කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලංකා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිබිටඩ් |
| එල් ඕ එල් සී සෙකියුරිටීස් ලිමිටඩ් |
| නේෂන් ලංකා ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එන් ඩී බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| නිව් වර්ල්ඩ් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| රිචර්ඩ් පීරිස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එස් සී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සෙරන්ඩිබ් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එස් එම් බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සොෆ්ට් ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමර්විල් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| තැප්‍රොබේන් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ටී කේ එස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සොෆ්ට් ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| බාට්ලීට් රෙලිගයා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ණය පුරැකුම්පත් ගණුදෙනු |
| ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් - (ණය සුරැකුම්පත් ගණුදෙනු) |
| කැපිටල් ඒලයන්ස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එස් එම් බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ණය සුරැකුම්පත් ගණුදෙනු |
| ජේ බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සෙරන්ඩිබ් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| කැපිටල් ඒලයන්ස් ලිමිටඩ් - (ණය සුරැකුම්පත් ගණුදෙනු) |

# අතිරේක තොරතුරු

## වෙළෙඳපොළ අතරමැදි ආයතන

### 2013 දෙසැම්බර් 31 වන දිනට ලියාපදිංචි

ආන්තික සැපයුම්කරුවන්, ආයෝජන කළමනාකරුවන් හා කොටස් ප්‍රාරක්ෂකයන් යන වර්ගීකරණයන් යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සමාගම | ආන්තික සැපයුම්කරුවන් | ආයෝජන කළමනාකරුවන | කොටස් ප්‍රාරක්ෂකයන් |
|---|---|---|---|
| ඇක්විටි පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | X | X |
| ඒ ඩී එල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| ඒ ඩී එල් ඉක්විටීස් ලිමිටඩ් | X | | |
| අමානා කැපිටල් ලිමිටඩ් | | X | |
| ආර්පිකෝ ඇටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ආශා ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | X | | |
| ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | X | |
| ලංකා බැංකුව | | X | X |
| බාට්ලීට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| බාට්ලීට් ෆයිනෑන්ස් පීඑල්සී | X | | |
| බාට්ලීට් ට්‍රාන්ස් කැපිටල් ලිමිටඩ් | | X | X |
| කැන්ඩෝර් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| කැන්ඩෝර් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| කැපිටල් එලයන්ස් ෆයිනෑන්ස් පීඑල්සී | X | | |
| කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | | X | |
| කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| කැපිටල් ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| සිලෝන් ගාර්ඩියන් ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පීඑල්සී | | | X |
| සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පීඑල්සී | | | X |
| සිලෝන් ජැපෑන් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| සිටිසන් ඩිවලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පීඑල්සී | X | | |
| කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | X | | X |
| කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ඩී එෆ් සී සී වර්ධන බෑන්ක් පීඑල්සී | X | | |
| ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් | X | | |
| ජෝර්ජ් ස්ටුවර්ට් ෆයිනෑන්ස් පීඑල්සී | X | | |
| ගාර්ඩියන් ඇක්ටිව් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී | X | | X |
| හොරයිසන් ඇසෙට් ලිමිටඩ් | | X | |
| අයි අයි එෆ් එල් කැපිටල් සිලෝන් ලිමිටඩ් | | X | |
| ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් කෝපරේෂන් ලිමිටඩ් | | X | |

| සමාගම | ආන්තික සැපයුම්කරුවන් | ආයෝජන කළමනාකරුවන | කොටස් ප්‍රාරක්ෂකයන් |
|---|---|---|---|
| ජේ බී ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| ජේ බී ෆයිනෑන්සල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| කෙනන්ගා ඉන්වෙස්ට්මන්ට් කෝපරේෂන් ලිමිටඩ් | | X | |
| එල් බී ෆයිනෑන්ස් පීඑල්සී | X | | |
| ලංකා ඔරික්ස් ෆයිනෑන්ස් පීඑල්සී | X | | |
| ලෙක්සින්ටන් ෆයිනෑන්සල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| ලයිනියර් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී | X | X | X |
| නේෂන් ලංකා කැපිටල් ලිමිටඩ් | X | | |
| නේෂන් ලංකා ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී | X | | |
| නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් | | X | |
| එන් ඩී බී කැපිටල් හෝල්ඩිංග්ස් පීඑල්සී | | | X |
| එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| එන් ඩබ් එස් ෆයිනෑන්සල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| එන් ඩබ් එස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ඔරියන්ට් වෙල්ත් ලිමිටඩ් | | X | |
| ඔරියන් ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී එල් සී | X | | |
| පීපල්ස් බෑන්ක් | | X | |
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| රිචර්ඩ් පීරිස් ෆයිනෑන්ෂල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| සම්පත් බෑන්ක් පී එල් සී | X | | X |
| සණස ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| සෙරන්ඩිබ් ස්ටොක් බ්‍රොකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| සෙලාන් බෑන්ක් පී එල් සී | X | | |
| සින්ගර් ෆයිනෑන්ස් (ලංකා පී එල් සී) | X | | |
| සොෆ්ට් ලොජික් කැපිටල් පී එල් සී | | X | |
| සොෆ්ට් ලොජික් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| ටී කේ එස් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී එල් සී | X | | |
| වර්ල්ඩොක් මැකෙන්සි ලිමිටඩ් | X | X | |

## සුරැකුම්පත් නිෂ්කාශන ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්

මධ්‍යම තැන්පතු ක්‍රම පෞද්ගලික සමාගම

## ණය ප්‍රමාණීකරණ ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතර මැදියන්

ෆිච් රේටිංස් ලංකා ලිමිටඩ්
රැම් රේටිංස් ලංකා ලිමිටඩ්
ඉක්රා ලංකා ලිමිටඩ්

# දත්ත ගොනුව

කොටස් වෙළෙඳපොළ

| වසර | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| කොටස් වෙළෙඳපොල | | | | | | |
| වාර්ෂික කොටස් පිරිවැටුම (රුපියල් මිලියන) | 110,453.90 | 142,462.65 | 570,326.82 | 546,255.80 | 213,827.2 | 200,467.8 |
| දේශීය (රුපියල් මිලියන) | 50,796.90 | 99,010.83 | 464,733.62 | 486,959.40 | 160,543.3 | 128,227.6 |
| විදේශීය (රුපියලි මිලියන) | 59,656.90 | 43,451.82 | 105,593.20 | 59,296.40 | 53,283.9 | 72,240.2 |
| වෙළෙඳපොළ දින | 238 | 240 | 238 | 239 | 242 | 242 |
| දෛනික සාමාන්‍ය කොටස් පිරිවැටුම | 464.1 | 593.6 | 2,396.33 | 2,285.60 | 883.6 | 828.4 |
| ගණුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන) | 3,154.90 | 4,762.70 | 18,489.19 | 24,543.70 | 9,691.2 | 9,054.2 |
| දේශීය (මිලියන) | 1,934.90 | 3,784.20 | 16,684.45 | 23,151.60 | 8,289.6 | 7,861.6 |
| විදේශීය (මිලියට) | 1,220.00 | 978.42 | 1,804.74 | 1,392.10 | 1,401.7 | 1,192.6 |
| ගනුදෙනු සංඛ්‍යාව | 776,244 | 1,266,299 | 3,355,126 | 4,579,352 | 1,857,384 | 1,421,303 |
| දේශිය | 730,415 | 1,190,822 | 3,225,041 | 4,463,404 | 1,796,868 | 1,355,380 |
| විදෙශීය | 45,829 | 75477 | 130,085 | 115,948 | 60,516 | 65,923 |
| නව ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 3 | 3 | 10 | 32 | 17 | 2 |
| ලේඛනයෙන් බැහැරවීම් සංඛ්‍යාව | 2 | 6 | 1 | 0 | 2 | 1 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 235 | 231 | 241 | 272 | 287 | 289 |
| ගණුදෙනු වූ සමාගම් සංඛ්‍යාව | 232 | 231 | 238 | 265 | 280 | 278 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපියල් බිලියන) | 488.8 | 1,092.10 | 2,210.45 | 2,213.90 | 2,167.6 | 2,459.9 |
| වසර අවසානයේ වෙළෙඳපොළ මිල ඉපැයුම් අනුපාතය (වාර ගනන) | 5.4 | 16.6 | 25.16 | 15.8 | 15.9 | 15.9 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ ප්‍රතිශතයක් ලෙස මුළු පිරිවැටුම (%) | 16.9 | 18 | 34.5 | 24.7 | 9.8 | 8.7 |
| වර්ෂ අවසානයේ ලාභාංශ ඵලදාව (%) | 5.6 | 3 | 1.16 | 1.8 | 2.4 | 2.9 |
| වර්ෂ අවසානයේ මිල පොත් අගය (වාර ගණන) | 0.8 | 1.7 | 2.98 | 2 | 2.1 | 2 |
| දළ දේශීය නිශ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රග්ධනීකරණය (%) | 11.1 | 22.6 | 39.4 | 33.8 | 28.6 | 32.4 |

වෙළෙඳපොළ මිල දර්ශකය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සියළු කොටස් මිල දර්ශකය | 1,503.00 | 3,385.55 | 6,635.87 | 6,074.40 | 5,643.0 | 5,912.80 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (40.9) | 125.25 | 96.01 | (8.5) | (7.1) | 4.8 |
| මිලංක මිල දර්හකය | 1,631.30 | 3,849.38 | 7,061.46 | 5,229.20 | 5,119.1 | - |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (50.4) | 135.97 | 83.44 | (25.9) | (2.1) | - |
| S&P ශ්‍රී ලංකා 20 | | | | | 3085.3 | 3,263.90 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | | | | | | 5.8 |

මුළු ප්‍රතිලාභ දර්ශකය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සමස්ත මුළු ප්‍රතිලාභ දර්ශකය | 1,783.60 | 3,944.90 | 7,899.11 | 7,362.83 | 7037.3 | 7,584.40 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිලාභ දර්ශකය (%) | (38.1) | 121.18 | 100.24 | (6.79) | (4.4) | 7.8 |
| මිලංක මුළු ප්‍රතිලාභ දර්ශකය | 1,962.50 | 4,506.24 | 8,481.73 | 6,393.00 | 6399.4 | - |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (47.3) | 129.6 | 88.22 | (24.63) | 0.1 | |
| S&P මුළු ප්‍රතිලාභ දර්ශකය | | | | | 3,780.4 | 4,132.4 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | | | | | | 9.3 |

| වසර | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය ක්‍රියාකාරකම්** | | | | | | |
| වාර්ෂික පිරිවැටුම (රුපියල් මිලියන) | 59,656.90 | 43,451.82 | 105,593.20 | 59,296.40 | 53,283.9 | 72,240.20 |
| මිලදී ගැනීම් (රුපියල් මිලියන) | 66,632.20 | 43,057.32 | 92,425.53 | 49,776.80 | 72,614.2 | 83,607.00 |
| විකුණුම් (රුපයල් මිලියන) | 52,681.70 | 43,846.32 | 118,760.87 | 68,816.00 | 33,953.6 | 60,873.30 |
| ශුද්ධ විදේශීය ගලාඒම් (රුපියල් මිලියන) | 13,950.50 | (789) | (26,335.34) | (19,039.20) | 38,660.7 | 22,733.70 |
| ගනුදෙනු වූ කොටස් සංඛයාව (රුපියල් මිලියන) | 1,220.00 | 978.41 | 1,804.74 | 1,392.11 | 1,401.7 | 1,192.60 |
| මිලදී ගැනීම් (මිලියන) | 1,286.20 | 908.97 | 1,541.49 | 1,186.80 | 1,520.6 | 1,282.50 |
| විකුණුම් (මිලියන) | 1,153.90 | 1,047.87 | 2,067.99 | 1,597.42 | 1,282.7 | 1,102.6 |
| ගණුදෙනු සංඛ්‍යාව | 45,829 | 75,477 | 130,085 | 115,948 | 60,516 | 65,923.0 |
| මිලදී ගැනීම් | 50,052 | 69,431 | 115,071 | 112,246 | 71,944 | 77,511.0 |
| විකුණුම් | 41,606 | 81,523 | 145,100 | 119,651 | 49,088 | 54,335.0 |
| **ණයකර වෙළෙඳපොළ** | | | | | | |
| සාංගමික ණයකර | | | | | | |
| මූළු පිරිවැටුම (රුපියල් 000) | 102,639.30 | 136,765 | 72,288 | 2,690,664.40 | 75,717.1 | 2,229,221.3 |
| ගණුදෙනු සංඛ්‍යාව | 27 | 42 | 92 | 62 | 39 | 173 |
| ගණුදෙනු වූ ණයකර ප්‍රමාණය | 953.5 | 1,020 | 693 | 25,861 | 740.4 | 19,998.8 |
| වෙළෙදපොළ ප්‍රාග්ධනීකරණය | | N/A | N/A | N/A | 46,311.0 | N/A |
| **රාජ්‍ය ණයකර** | | | | | | |
| මුළු පිරිවැටුම (රුපියල් 000) | 195,157.40 | 98,977 | 45,673 | 28,356.80 | 6,128.0 | |
| ගණුදෙනු සංඛ්‍යාව | 69 | 42 | 18 | 7 | 2 | |
| ගණුදෙනු වූ ණයකර ප්‍රමාණය | 208,182.60 | 102,778 | 46,794 | 28,912 | 6,743.6 | |
| **ඒකක භාර** | | | | | | |
| ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල් බිලියන) | 6,780 | 9,952 | 22,228 | 24,059 | 31,062 | 54,304 |
| ඒකක හිමියන් සංඛ්‍යාව | 22,685 | 23,117 | 24,649 | 26,636 | 27,952 | 29,648 |
| නිකුත් කර ඇති ඒකක සංඛ්‍යාව | 638,112 | 564,500 | 1,159 | 1,506 | 2,251 | 4,134 |
| සමාගම් කොටස් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් බිලියන) | 2,589 | 6,036 | 11,349 | 9,555 | 8,944 | 9,453 |
| භාන්ඩාගර බිල්පත් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් බිලියන) | 2,903 | 3,363 | 9,289 | 10,326 | 5,449 | 17,825 |
| අනෙකුත් ආයෝජන උපකරණවල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපයල් බිලියන) | 1,293 | 1,106 | 1,223 | 4,186 | 16,596 | 27,000 |

තොරතුරු:

කොළඹ කොටස් වෙළෙඳපොළ, ඒකක භාර ළෙමනාකරවිණ සමාගම්, වාණිජ පත්‍ර, තැන්පතු සහතික, බැඳුම්කර හා බැංකු තැන්පතු

# මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව


විගණකාධිපති වාර්තාව 76

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 78

මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය 79

සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 80

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 81

සෙස් අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශය 82

වන්දි අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශය 83

ගිණුම්කරණ ප්‍රතිපත්ති 84

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් 87




# මූල්‍ය ප්‍රකාශන

## මූල්‍ය ප්‍රකාශන - පියවීම සහතික කිරීමේ අරමුදල


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 98 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 100 |
| මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය | 101 |
| ශුද්ධ වත්කම් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 102 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 103 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 104 |




# විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date |
| එෆ්බී/කේ/එස්ඊසී/එෆ් ඒ/2013 | | 2013 මැයි 27 දින |

RECEIVED
04 JUN 2014
Director General's Office
SEC

සභාපති,
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

AGDSL

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General`s Department

**මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කරනු ඇත.

**අ/කෘ:එච්. ඒ. එස්. සමරවීර**
**විගණකාධිපති**

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 1 | 47,739,360 | 56,412,469 |
| සෙස් අරමුදල | 2 | 48,664,796 | 37,905,567 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 4 | 934,534 | 628,884 |
| ලැබිය යුතු දෑ | 5 | 2,663,416 | 1,784,380 |
| සෙස් අරමුදල | 2 | 2,144,578,340 | 2,059,189,357 |
| වන්දි අරමුදල | 3 | 267,950,575 | 237,461,686 |
| තැන්පතු, අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 6 | 8,000,888 | 4,915,002 |
| මුදල් සහ මුදල් සමාන දේ | 7 | 24,811,873 | 28,105,784 |
| **මුළු වත්කම්** | | 2,545,343,782 | 2,426,403,129 |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **යෙදවූ අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | 8 | 6,352,068 | 9,508,528 |
| සෙස් අරමුදල | 9 | 2,193,243,136 | 2,097,094,924 |
| වන්දි අරමුදල | 10 | 267,950,575 | 237,461,686 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| කල්බදු ණයහිමියෝ | 11 | - | 619,317 |
| ප්‍රදාන - ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් ලැබීම් | 12 | 42,207,192 | 50,050,720 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන බැඳීම | 13 | 21,606,766 | 20,012,197 |
| **ජංගම වගකීම්** | | | |
| ණය හිමියෝ සහ උපචිත වියදම් | 14 | 8,807,432 | 6,458,770 |
| පූර්ව ලැබීම් | | 4,418,064 | 4,238,142 |
| කල්බදු ණය හිමියෝ | 11 | 758,549 | 958,848 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | 2,545,343,782 | 2,426,403,129 |

84 සිට 97 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතුවේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්

ධම්මික පෙරේරා
ආයතන ප්‍රධාන/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

ආචාර්ය නාලක ගොඩහේවා
සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

කොළඹ
2014 මැයි 12

# මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| තැරුව්කාර බලපත්‍ර ගාස්තු | | 4,163,816 | 4,999,634 |
| පරිපාලන අයබදු | | 3,225,066 | 1,487,168 |
| CMET - අධ්‍යාපන වැඩසටහන් | | 7,009,985 | 14,312,304 |
| ප්‍රකාශන විකුණුම් | | 144,350 | 18,750 |
| විවිධ ආදායම් | | 16,506 | 1,894,972 |
| ස්ථාවර වත්කම් විකිණීමේන් ලද ලාභ/(අලාභ) | | (11,032) | 321,865 |
| ප්‍රදාන පිළිගැනීම | 12 | 15,276,487 | 13,981,944 |
| | | 29,825,178 | 37,016,637 |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | (159,203,688) | (140,311,036) |
| පරිපාලන සහ ආයතනික වියදම් | 16 | (110,011,824) | (78,622,641) |
| ප්‍රාග්ධන වෙළඳපළ සංවර්ධන වියදම් | 17 | (66,228,055) | (24,478,437) |
| මූල්‍ය ගාස්තු | 18 | (85,112) | (102,328) |
| | | (335,528,679) | (243,514,442) |
| ආදායමට වැඩි අතිරික්ත වියදම් | | (305,703,501) | (206,497,805) |
| මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | | 318,547,041 | 218,522,637 |
| අතිරික්තය/(හිඟය) | | 12,843,540 | 12,024,832 |

84 සිට 97 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමුච්චිත රු. | අරමුදල රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | | - | 12,556,660 | 12,556,660 |
| CMET ආදායම හඳුනා ගැනීමේදී පූර්ව වර්ෂයේ ගැලපීම් වෙනස | | - | (5,072,967) | (5,072,967) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරු කළ අරමුදල් | | - | (10,000,000) | (10,000,000) |
| | | - | (2,516,307) | (2,516,307) |
| වසර තුල ආදායමට වැඩි අතිරික්ත වියදම් | | - | (206,497,805) | (206,497,805) |
| සෙස් අරමුදලින් මාරුකිරීම් | | - | 218,522,637 | 218,522,637 |
| වසර අවසානයේ අතිරික්තය/(හිඟය) | | - | 12,024,832 | 12,024,832 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | | | 9,508,528 | 9,508,528 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | | - | 9,508,528 | 9,508,528 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරුකල අරමුදල් | | - | (16,000,000) | (16,000,000) |
| | | - | (6,491,472) | (6,491,472) |
| වසර තුල ආදායමට වැඩි අතිරික්ත වියදම් | | - | (305,703,501) | (305,703,501) |
| සෙස් අරමුදලින් මාරුකිරීම් | | - | 318,547,041 | 318,547,041 |
| වසර අවසානයේ අතිරික්තය/(හිඟය) | | - | 12,843,540 | 12,843,540 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | | - | 6,352,068 | 6,352,068 |

84 සිට 97 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| සෙස් අරමුදලෙන් මාරු කිරීමෙන් පසු ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | | 12,843,540 | 12,024,832 |
| ගැලපීම් | | | |
| ක්ෂය වීම් | 1 | 16,026,487 | 15,333,194 |
| දේපල පිරියත සහ උපකරණ අපහරණයෙන් ලැබූ (ලාභ)/පාඩු | | 11,032 | (321,865) |
| ප්‍රදානයන් පිළිගැනීම | 12 | (15,276,487) | (13,981,944) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 13 | 2,997,885 | 5,584,640 |
| පෙර වර්ෂය සඳහා ගැළපීම් | 8 | - | (5,072,967) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම් වලට පෙර ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | | 16,602,457 | 13,565,890 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම | | | |
| තොග වැඩි වීම/(අඩු වීම) | | (305,650) | (98,428) |
| ලැබීම වැඩි වීම/(අඩු වීම) | | (879,036) | (929,350) |
| තැන්පතු, අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් වැඩි වීම/(අඩු වීම) | | (3,085,886) | (2,402,103) |
| කලින් ලැබූ මුදල් වැඩි වීම/(අඩු වීම) | | 179,922 | 1,099,753 |
| ණය හිමියන් සහ උපචිත වියදම් වැඩි වීම/(අඩු වීම) | | 2,348,662 | 551,320 |
| | | (1,741,988) | (1,778,808) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල් | | 14,460,469 | 11,787,082 |
| වර්ෂය තුල ගෙවූ පාරිතෝෂික | | (1,403,316) | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා වීම/(ගලා යාම) | | 13,457,153 | 11,787,082 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල් | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | 1 | (7,432,959) | (11,106,862) |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරු කිරීම | | (16,000,000) | (10,000,000) |
| දේපල, පිරියත සහ උපකරණ අලෙවි කිරීමෙන් ලැබූ මුදල | | 68,552 | 1,005,384 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා වීම/(ගලා යාම) | | (23,364,407) | (20,101,478) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | 12 | 7,432,959 | 11,106,862 |
| මූල්‍ය කල්බදු වැඩි වීම/(අඩු වීම) | | (819,616) | (2,377,952) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා වීම/(ගලා යාම) | | 6,613,343 | 8,728,910 |
| මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩි වීම/ (අඩු වීම) | | (3,293,911) | 414,513 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන අ) | | 28,105,784 | 27,691,271 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ආ) | | 24,811,873 | 28,105,784 |
| සටහන (අ) | | | |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ | | | |
| බැංකුවේ ඇති මුදල් | | 28,065,784 | 27,651,271 |
| අතැති මුදල් | | 40,000 | 40,000 |
| | | 28,105,784 | 27,691,271 |
| සටහන (ආ) | | | |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ | | | |
| බැංකුවේ ඇති මුදල් | 7 | 24,771,873 | 28,065,784 |
| අතැති මුදල් | 7 | 40,000 | 40,000 |
| | | 24,811,873 | 28,105,784 |

84 සිට 97 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# සෙස් අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| සෙස් අරමුදලේ ශුද්ධ වැඩි වීම /(අඩුවීම) | 96,148,212 | (142,784,474) |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීම් වලට පෙර ශුද්ධ වැඩි වීම /(අඩුවීම) | 96,148,212 | (142,784,474) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම** | | |
| කාර්ය මණ්ඩල ණය (වැඩි වීම)/ අඩු වීම | 484,191 | (2,957,373) |
| සෙස් ලැබීම (වැඩි වීම)/අඩු වීම | (1,168,813) | |
| ලැබීම් - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කෙමිෂම (වැඩි වීම)/ අඩුවීම | (216,659) | |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය (වැඩි වීම)/අඩු වීම | (84,209,335) | 807,815 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය (වැඩි වීම)/අඩු වීම | 86,464,170 | (6,817,772) |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ලාභ (වැඩි වීම)/ අඩුවීම | 107,627 | 2,803,527 |
| කුලී තැන්පතු (වැඩි වීම)/ අඩු වීම | (11,408,568) | (1,614,420) |
| ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | 11,771 | |
| | (9,935,616) | (7,778,223) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා වීම/(ගලා යාම) | 86,212,596 | (150,562,697) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි ආයෝජනය | (25,096,023) | 295,229,862 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 956,679,446 | (140,967,272) |
| ස්ථාවර තැන්පත් මත ආයෝජනය | (1,021,000,241) | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා වීම/(ගලා යාම) | (89,416,818) | 154,262,590 |
| මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | (3,204,222) | 3,699,893 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඇ) | 8,703,239 | 5,003,346 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඈ) | 5,499,017 | 8,703,239 |
| **සටහන (ඇ)** | | |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ | | |
| බැංකුවේ ඇති මුදල් | 2,193,239 | 5,003,346 |
| දෛනික ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනය | 6,510,000 | - |
| | 8,703,239 | 5,003,346 |
| **සටහන (ඈ)** | | |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ | | |
| බැංකුවේ ඇති මුදල් | 1,759,017 | 2,193,239 |
| දෛනික ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනය | 3,740,000 | 6,510,000 |
| | 5,499,017 | 8,703,239 |

84 සිට 97 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# වන්දි අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වන්දි අරමුදලේ ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | 30,488,889 | 21,149,059 |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම වලට පෙර ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | 30,488,889 | 21,149,059 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම** | | |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු (වැඩි වීම)/අඩු වීම | - | 72,445 |
| අනිකුත් ගෙවීම වල වැඩි වීම/(අඩු වීම) | 15,863 | |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය (වැඩි වීම)/අඩු වීම | 15,294,372 | (6,311,998) |
| ස්ථාවර තැන්පත් මත ලැබිය යුතු පොළිය (වැඩි වීම)/අඩු වීම | (14,177,989) | - |
| | 1,132,246 | (6,239,553) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා වීම/(ගලා යාම) | 31,621,135 | 14,909,506 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 111,573,749 | (14,910,633) |
| ස්ථාවර තැන්පත් වල ආයෝජනය | (143,182,471) | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා වීම/(ගලා යාම) | (31,608,722) | (14,910,633) |
| මුදල් සහ මුදල් සමාන දේ ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | 12,413 | (1,127) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඉ) | 87,587 | 88,715 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඊ) | 100,000 | 87,588 |
| **සටහන (ඉ)** | | |
| කාලපරිච්ඡේදය අරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ | | |
| බැංකුවේ ඇති මුදල් | 62,218 | 63,346 |
| ඒක්ෂණ තැන්පතු | 25,369 | 25,369 |
| | 87,587 | 88,715 |
| **සටහන (ඊ)** | | |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ | | |
| බැංකුවේ ඇති මුදල් | 100,000 | 62,218 |
| ඒක්ෂණ තැන්පතු | - | 25,369 |
| | 100,000 | 87,587 |

84 සිට 97 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනු ලාභ උපයනු නොලබන ආයතනයක් වන අතර ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශනයන් සකසා තිබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වූ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකිව යුතු වේ.

### 1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්මක් ඇති ආයතනයක් ලෙස පැවතීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතු හැකියාව කොමිසමේ සාමාජිකයින් විසින් තක්සේරුකර තිබේ. අවිනිශ්චිත අනාගතයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩවම සිදුකිරීම පිණිස ශ්‍රී ලංකා
සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිසමේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියළුම තොරතුරු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙහෙයුම් ඇවරකිරීමේ හෝ අවසන්කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වලදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම අඛණ්ඩවම යොදාගැනීම සිදු කරයි.

### 1.4 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මතය. යෝග්‍ය අවස්ථාවන්හිදී ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන් වල දක්වා ඇත.

### 1.5 විදේශ මුදල් ගණුදෙනු

විදේශ හුවමාරු ගණුදෙනු වලදී ගණුදෙනුව සිදුවන අවස්ථාවේ දී පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

### 1.6 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

යෝග්‍ය පරිදි ශේෂ පත්‍ර දිනට පසු ප්‍රමාණාත්මක සිදුවීම්වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් සහ හෙළිදරව් කිරීම් අවශ්‍ය තන්හිදි සිදු කරනු ඇත.

### 1.7 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ සංගත වේ.

### 1.8 සංදන්දනාත්මක අගයන්

සංදන්දනාත්මක අගයන් ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ඉදිරිපත්වන ආකාරයෙන් වෙනස්කම්වලට යෝග්‍ය පරිදි ගැළපීම් සිදුකර තිබේ.

## 2. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

### 2.1 දේපළ, පිරියත සහ උපකරණ

#### 2.1.1 හිමිකම් සහිත දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ ඒවායෙහි අනෙකුත් ආනුශංගික වියදම් ද සමඟ පිරිවැයට සටහන් කර ඇති අතර, ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය සලකා බලා ක්ෂය කිරීම සිදුකරයි. ප්‍රදානයන් වශයෙන් ලද ස්ථාවර වත්කම් පිරිවැයට ගිණුම්ගත කර අදාළ ක්ෂය කිරීම සංචිත ගිණුම්වලට අයකර ඇත. සෘජුරේඛීය පදනම මත ක්ෂය කිරීම සිදුකර ඇති වත්කම් වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් අනුපාතයන් අදාල කරගනිමින් මෝටර් රථ, (කල් බදු වාහන හැර) කාර්යාලීය උපකරණ, විද්‍යුත් දත්ත උපකරණ සහ පුහුණු උපකරණ ක්ෂය කරන ලදී.

| | |
|---|---|
| මෝටර් රථ | 10.00% |
| කල් බදු සඳහා ලබාදී ඇති මෝටර් රථ | 25.00% |
| ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ අනුසීහුම් | 12.50% |
| කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත උපකරණ | 20.00% |
| පුහුණු කිරීමේ උපකරණ | 20.00% |

සියළුම මිලට ගත් වත්කම් භාවිතයට යොදාගන්නා දිනයේ සිට ක්ෂය කිරීම සිදුකෙරේ. අපහරණ වර්ෂයේදී අදාල වත්කම පොත්වලින් ඉවත්කරන දිනය දක්වා ක්ෂය කිරීම සිදුකෙරේ.

## 2.2 මෝටර්වාහන - කල්බදු

සියලුම අවදානම් සහ ප්‍රතිලාභයන් හිමිකාරිත්වය සමඟ ආනුෂංගික වූ මූල්‍ය කල්බදු පදනම මත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත පවරන ලද වත්කම් ඒවායේ මුදල් පිරිවැයට ප්‍රාග්ධන ගත කරනු ලැබේ. එසේ කල්බදු අයිතිය යටතේ වන වත්කම් තුළින් උත්ගතවන ක්ෂය සහ මූල්‍ය ගාස්තු ආදායම් වියදම් ප්‍රකාශයට හරවන අතර කල්බදු කුලී ගෙවීම්, කල්බදු වගකීම් අඩුකිරීම සඳහා හඳුනාගෙන ඇත.

සභාය අධ්‍යක්ෂක මණ්ඩලය සහ ඊට ඉහල කාර්ය මණ්ඩලය තම පාරිශ්‍රමිකයෙහි කොටසක් ලෙස කල්බදු දායකත්ව යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි. එහිදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කල්බදු වාරිකය ගෙවන අතර, අදාළ කාර්යමණ්ඩලය කල්බදු වාරිකයට දායකත්වය සැපයිය යුතුය. මෙයට අමතරව බලපත්‍ර ගාස්තු සහ වාහන නඩත්තුවට අදාල සියළුම වියදම් කාර්යමණ්ඩලය විසින් දැරිය යුතුවේ. කල්බදු හිමිකමෙහි ප්‍රමාණයට වූ රක්ෂණ පිරිවැය ද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෙවනු ඇත. වාහනයේ අයිතිය පැවරීම කල්බදු දායකත්ව යෝජනා ක්‍රමය සඳහා දායක වූ කාර්යමණ්ඩල සාමාජිකයා වෙත කල්බදු වාරික සියල්ල අවසන් වන මාස 48ක කාලය අවසානයේදී හෝ සාමාජිකයා විසින් කල්බදු වගකීම් සම්පූර්ණ වශයෙන් ගෙවා නිම කිරීමෙන් පසු පමණක් සිදුකෙරේ. කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ගනු ලැබූ තීරණයකට පසුව 2012 වසර තුලදී මෙම යෝජනා ක්‍රමය නව බඳවා ගැනීම් වලට අදාල නොවේ. සංගතතාවය පවත්වා ගැනීම සඳහා කල්බදු වාහන මුලින් තීරණය කළ 25% ක ක්ෂය කිරීම දිගටම පවත්වාගෙන යයි.

## 2.3 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු සහ රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන සිදුකරනු ලබන අතර පිරිවැය යටතේ දක්වනු ලැබේ.

## 2.4 තොග

තොගවල අගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකින් අඩු අගය යටතේය. තොග පිරිවැය ගණනය කිරීම පෙර පිවිසුම් පෙර නිකුත් කිරීම් (FIFO) පදනම යටතේ සිදුකෙරේ.

ලෝකයේ වේගයෙන් වෙනස් වෙමින් පවතින වෙළඳපල තත්වයන් හේතුකොටගෙන ප්‍රාග්ධන වෙළඳපලට අදාල නීති රීති ද වේගයෙන් වෙනස්වීමට භාජනය වන බැවින් ප්‍රතිපත්තියක් ලෙස පුස්තකාල පොත් වලට අදාල අගයන් කපා හැර තිබේ.

## 2.5 ලැබිය යුතු මුදල්

ඇස්තමේන්තුගත උපලබ්ධිවන අගයට ලැබිය යුතු මුදල් සටහන් කර ඇත.

## 3. වගකීම් සහ ප්‍රතිපාදන

### 3.1.1. විශ්‍රාමික ප්‍රතිලාභ

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම පිළිබඳ වගකීම පැන නගින්නේ ඔහු අදාළ ආයතනයේ අඛණ්ඩව වසර පහක් සේවයේ නියුක්තිව සිටියහොත් පමණි. මේ වගකීම ඉටුකිරීමෙහිලා වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියළුම සේවකයන් සඳහා මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ ඔහුගේ වේතනයෙන් හරි අඩක් සැලකිල්ලට ගෙන අදාල ප්‍රතිපාදනය ගණනය කරනු ලැබේ.

### 3.1.2 නිශ්චිත දායක මුදල් සැලසුම

ආයතනයේ සියළුම සේවකයින් සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයේ සාමාජිකත්වය ලබන අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිළිවෙලින් සේවකයාගේ මූලික වැටුපෙන් 12%ක් සහ 3%ක් මේ සඳහා දායක කරනු ලැබේ.

## 3.2 ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතු ගිණුම් පිරිවැය යටතේ ගණනය කෙරේ.

## 3.3 ප්‍රදාන

සෙස් අරමුදල මගින් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදානයන් වශයෙන් සලකා ක්‍රමවත් පදනමක් මත අදාල වත්කමෙහි ප්‍රයෝජනවත් ආයුකාලය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 4. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

### 4.1 ආදායම් හඳුනාගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි ආදායම තුළ තැරැව්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු පරිපාලන අයබදු, ප්‍රකාශන අළෙවි කිරීම්, සම්මන්ත්‍රණ ආදායම් සහ අධ්‍යාපන වැඩ සටහන් ආදායම් යනාදියෙන් සමන්විත වේ. ඉහත සඳහන් සේවාවන්/ගාස්තු වලින් වන ආදායම අදාළ සේවාවන් ඉටුකරනු ලබන කාල පරිච්ඡේදය තුළ හඳුනා ගැනේ. ඒ අනුව වසර 2011 සිට අදාළ සේවාවන් හි කාල පරිච්ඡේදය සමඟ ගැලපීම් සඳහා අධ්‍යාපන වැඩසටහන් වලින් වන ආදායම හඳුනාගැනීම පිණිස ගැලපීම් සිදුකරන ලදී.

### 4.2 ආයෝජන මත පොළිය

ආයෝජන මත පොළිය උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.3 අනිකුත් ආදායම

අනිකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

## 5.0 වියදම හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමෙහි ලා දරනු ලබන සියළු වියදම් උපචිත පදනම මත හඳුනාගන්නා අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6.0 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කොට ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිතා කරමිනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල් සහ බැංකු ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

1. දේපල, පිරියත සහ උපකරණ

| | මෝටර් වාහන | කාර්යාල ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ | කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් (EDP) උපකරණ | පුහුණු කිරීමේ උපකරණ | මූල්‍ය කල්බදු වත්කම් (මෝටර් වාහන) | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 31,725,186 | 25,314,167 | 78,001,740 | 3,723,800 | 6,800,000 | 145,564,894 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 103,000 | 110,880 | 7,219,079 | - | - | 7,432,959 |
| වර්ෂය තුළ අපහරණයන් | (75,000) | (109,312) | (1,342,867) | - | (3,800,000) | (5,327,179) |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 31,753,186 | 25,315,735 | 83,877,952 | 3,723,800 | 3,000,000 | 147,670,674 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 18,258,690 | 16,233,343 | 46,630,523 | 2,604,868 | 5,425,000 | 89,152,424 |
| වර්ෂය සඳහා ක්‍ෂය අයකිරීම | 1,659,270 | 2,990,806 | 10,318,848 | 307,563 | 750,000 | 16,026,487 |
| වත්කම් අපහරණය මත සමුච්චිත ක්ෂය | (17,500) | (92,173) | (1,337,924) | - | (3,800,000) | (5,247,597) |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 19,900,460 | 19,131,975 | 55,611,447 | 2,912,432 | 2,375,000 | 99,931,314 |
| 2013 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි වටිනාකම | 11,852,726 | 6,183,760 | 28,266,505 | 811,368 | 625,000 | 47,739,360 |
| 2012 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි වටිනාකම | 13,466,496 | 9,080,824 | 31,371,217 | 1,118,932 | 1,375,000 | 56,412,469 |
| ප්‍රයෝජනවත් ආයුකාලය (වසර ගණන) | 10 | 8 | 5 | 5 | 4 | |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **2. සෙස් අරමුදල** | | |
| ජංගම නොවන වත්කම් | | |
| කාර්ය මණ්ඩල ණය | 20,035,748 | 20,685,087 |
| කුලී තැන්පතු | 28,629,048 | 17,220,480 |
| | 48,664,796 | 37,905,567 |
| ජංගම වත්කම් | | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලේ ආයෝජනය | 206,587,319 | 181,491,296 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 785,320,005 | 1,741,999,451 |
| ස්ථාවර තැන්පතු වල ආයෝජනය | 1,021,000,241 | - |
| | 2,012,907,565 | 1,923,490,747 |
| මාස 12 කාලය තුල ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | 5,262,101 | 5,096,953 |
| ස්ථාවර තැන්පත් මත ලැබිය යුතු පොළිය | 84,209,335 | - |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය | 33,756,494 | 120,220,664 |
| ලැබිය යුතු සෙස් අරමුදල් | 2,738,940 | 1,570,127 |
| ලැබිය යුතු දෑ - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | 216,659 | - |
| - රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමදල | - | 107,627 |
| බැංකුවේ ඇති ශේෂය | 5,499,017 | 8,703,239 |
| | 131,682,546 | 135,698,610 |
| | 2,144,590,111 | 2,059,189,357 |
| මුළු වත්කම් | 2,193,254,907 | 2,097,094,924 |
| වගකීම් | | |
| ශ්‍රී ලංකා සු.හා.වි.කො.ස. වෙත කළ යුතු ගෙවීම් | 11,771 | - |
| ශුද්ධ වත්කම් | 2,193,243,136 | 2,097,094,924 |
| **3. වන්දි අරමුදල** | | |
| ජංගම වත්කම් | | |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 107,975,488 | 219,549,237 |
| ස්ථාවර තැන්පතු වල ආයෝජනය | 143,182,471 | - |
| | 251,157,959 | 219,549,237 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය | 2,530,490 | 17,824,862 |
| ස්ථාවර තැන්පත් මත ලැබිය යුතු පොළිය | 14,177,989 | - |
| ඊක්ෂණ තැන්පතු වල ආයෝජනය | - | 25,369 |
| බැංකුවේ ඇති ශේෂය | 100,000 | 62,218 |
| | 16,808,479 | 17,912,449 |
| මුළු වත්කම් | 267,966,438 | 237,461,686 |
| වගකීම් | | |
| ශ්‍රී ලංකා සු.හා.වි.කො.ස වෙත කල යුතු ගෙවීම් | 15,863 | - |
| ශුද්ධ වත්කම් | 267,950,575 | 237,461,686 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 4. | තොග | | |
| | ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ සහ විදුලි පාරිභෝගික උපකරණ තොගය | 934,534 | 621,990 |
| | ප්‍රකාශන තොගය | - | 6,894 |
| | | 934,534 | 628,884 |
| 5. | ලැබිය යුතු දෑ | | |
| | විවිධ ණයගැතියෝ ඇතුළු හර පත්‍රිකා | 115,338 | 34,380 |
| | දුරකතන අත්තිකාරම් | 680,890 | - |
| | උත්සව අත්තිකාරම් | 1,790,000 | 1,750,000 |
| | ලැබිය යුතු එකතු කළ අගය මත බදු | 61,781 | |
| | ලැබිය යුතු රක්ෂණ හිමිකම් | 15,407 | |
| | | 2,663,416 | 1,784,380 |
| 6. | තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවීම් | | |
| | සුරක්ෂිතාගාර කටයුතු - ලංකා බැංකුව | 40,726 | 36,525 |
| | ඉන්ධන තැන්පතු | 60,000 | 60,000 |
| | වාහන නඩත්තු සඳහා තැන්පතු | 500 | 500 |
| | ටෙලිකොම් සමාගම වෙත ඇති තැන්පතු | 42,125 | 42,125 |
| | ඩයලොග් සමාගම වෙත ඇති තැන්පතු | 9,000 | 4,500 |
| | උණු සහ ශීත ජලය ලබා දෙන ස්වයංක්‍රීය යන්ත්‍රය | 28,000 | 28,000 |
| | ලංකා සේවා සම්මේලනය | - | 19,993 |
| | උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රහකත්වය - කොළඹ විශ්ව විද්‍යාලය | 10,000 | - |
| | සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | 7,810,537 | 4,723,359 |
| | | 8,000,888 | 4,915,002 |
| 7. | මුදල් | | |
| | බැංකුවේ ඇති මුදල් | 24,771,873 | 28,065,784 |
| | අතැති මුදල් | 40,000 | 40,000 |
| | | 24,811,873 | 28,105,784 |
| 8. | සමුච්චිත අරමුදල | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 9,508,528 | 12,556,660 |
| | පූර්ව වර්ෂයේ ගැළපුම් | - | (5,072,967) |
| | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරුකරන ලද අරමුදල | (16,000,000) | (10,000,000) |
| | වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | 12,843,540 | 12,024,832 |
| | අවසාන ශේෂය | 6,352,068 | 9,508,528 |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **9. සෙස් අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 2,097,094,924 | 2,239,879,398 |
| එකතු කළා: | | |
| වර්ෂය තුල ලැබූ සෙස් මුදල් | 233,725,415 | 246,562,437 |
| ආයෝජන සහ අනෙකුත් දේ මත පොළිය | 266,747,989 | 210,657,028 |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදලින් වන ප්‍රාග්ධන ලාභ | - | 107,627 |
| විනිමය බිල්පත්වල ආයෝජනය සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් ලද අරමුදල | 16,000,000 | 10,000,000 |
| | 2,613,568,328 | 2,707,206,490 |
| අඩු කළා: | | |
| සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් මාරුකිරීම් | 325,980,000 | 229,629,499 |
| ඒකාබද්ධ අරමුදලට මාරුකළ මුදල් | 94,250,000 | 380,000,000 |
| කපා හරින ලද රඳවා ගැනීමේ බදු | - | 400,341 |
| බැංකු ගාස්තු | 95,192 | 81,726 |
| | 420,325,192 | 610,111,566 |
| අවසාන ශේෂය | 2,193,243,136 | 2,097,094,924 |
| **10. වන්දි අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 237,461,686 | 216,312,627 |
| වර්ෂය තුලදී වැරදි සමථයකට පත් කිරීම මඟින් ලැබූ මුදල | - | - |
| එකතු කළා: ආයෝජන මත පොළිය - භාණ්ඩාගාර බිල්පත් | 16,314,351 | 21,222,754 |
| ආයෝජන මත පොළිය - ස්ථාවර තැන්පත් | 14,177,988 | - |
| | 267,954,025 | 237,535,381 |
| අඩුකළා: කපාහරින ලද දළ රඳවා ගැනීමේ බදු | - | 72,445 |
| බැංකු ගාස්තු | 3,450 | 1,250 |
| අවසාන ශේෂය | 267,950,575 | 237,461,686 |
| **11. මූල්‍ය කල්බදු ණය හිමියෝ** | | |
| දළ කල්බදු වගකීම් | 799,040 | 1,757,888 |
| අවිනිශ්චිත පොළී | (40,491) | (179,723) |
| | 758,549 | 1,578,165 |
| ඉදිරි වසර තුල ගෙවිය යුතු - කල්බදු ණය හිමියන්ගේ ජංගම වගකීම් කොටස | 758,549 | 958,848 |
| ඉදිරි වසරට පසු ගෙවිය යුතු - කල්බදු ණය හිමියන්ගේ ජංගම නොවන වගකීම් කොටස | - | 619,317 |
| | 758,549 | 1,578,165 |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **12. ප්‍රදානයන් - සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම්** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 50,050,720 | 52,925,802 |
| ප්‍රාග්ධන වියදම් සඳහා වර්ෂය තුල සෙස් අරමුදලින් මාරු කිරීම් | 7,432,959 | 11,106,862 |
| ප්‍රදාන පිලිගැනීම් වත්කම් ක්ෂය සඳහා ආදායමට මාරු කිරීම | (15,276,487) | (13,981,944) |
| අවසාන ශේෂය | 42,207,192 | 50,050,720 |
| පහත සඳහන් අනුප්‍රමාණ යටතේ ප්‍රදානයන් හඳුනා ගැනේ | | |
| මෝටර් වාහන | 10.00% | 10.00% |
| කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් (EDP) උපකරණ | 20.00% | 20.00% |
| පුහුණු කිරීමේ උපකරණ | 20.00% | 20.00% |
| ගෘහ භාණ්ඩ, උපකරණ සහ සවිකිරීම් | 12.50% | 12.50% |
| **13. විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා වන බැඳීම** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 20,012,197 | 14,427,557 |
| වර්ෂය සඳහා අයකිරීම් | 2,997,885 | 5,584,640 |
| වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික | (1,403,316) | - |
| අවසාන ශේෂය | 21,606,766 | 20,012,197 |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| 14. | ණයහිමියන් සහ උපචිත වියදම් | | |
| | දුරකථන, අන්තර්ජාල වියදම් | 413,580 | 321,223 |
| | විදුලිය | 347,589 | 330,617 |
| | කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය | 388,044 | 500,538 |
| | ඉන්ධන ප්‍රතිපූරණය | 70,633 | 72,357 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | - | 80,983 |
| | නිවාඩු වෙනුවට ගෙවන මුදල් | 1,767,627 | 1,747,453 |
| | අතිකාල ගෙවීම් | 156,779 | 205,574 |
| | බාහිර විගණන ගාස්තු | 825,000 | 600,000 |
| | අභ්‍යන්තර විගණන ගාස්තු | 205,600 | 102,800 |
| | මහජන දැනුවත් කිරීම් | 2,302,447 | 1,750,000 |
| | කුරියර් ගාස්තු | 7,528 | 8,678 |
| | ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධනය | 480,000 | - |
| | ගෙවිය යුතු වැට් බදු | 105,395 | 262,035 |
| | ගෙවිය යුතු මුද්දර බදු | - | 8,325 |
| | ඉන්ධන වියදම් | - | 21,536 |
| | පුවත්පත් සහ වාර ප්‍රකාශන | - | 18,170 |
| | විධායක යැපුම් දීමනාව | 5,000 | - |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 44,090 | 66,048 |
| | ත්‍යාග සහ විනෝදාස්වාද | - | 125,125 |
| | ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | - | 15,766 |
| | කාර්යය මණ්ඩල පුහුණු - දේශීය | 1,190,500 | 3,000 |
| | සම්මන්ත්‍රණ වියදම් - CMET | 110,250 | 218,542 |
| | වෙළඳ බද්ද | 10,000 | - |
| | විදේශ සංචාර සඳහා වන රක්ෂණය | 156,349 | - |
| | බිඳදමන යන්ත්‍ර නඩත්තුව | 686 | - |
| | ගෙවිය යුතු දෑ - සෙස් අරමුදල | 216,659 | - |
| | අනෙකුත් ගෙවිය යුතු දෑ | 3,676 | - |
| | | 8,807,432 | 6,458,770 |

| | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **15. කාර්ය මණ්ඩල පිරිවැය** | | | |
| කාර්ය මණ්ඩල වැටුප් | | 82,065,746 | 70,847,618 |
| සභාපතිවරයාගේ දීමනා | | 900,000 | 851,405 |
| අතිකාල ගෙවීම් | | 1,495,885 | 1,107,382 |
| සේ.අ.අ සහ සේ.භා.අ. | | 12,679,165 | 10,819,987 |
| සේවක මණ්ඩල පාරිතෝෂික | 13 | 2,997,885 | 5,584,640 |
| ප්‍රසාද දීමනා | | 10,638,789 | 9,893,659 |
| නිවාඩු වෙනුවට ගෙවන මුදල් | | 2,032,563 | 1,747,453 |
| කාර්ය මණ්ඩලයේ වෛද්‍ය වියදම් සහ රක්ෂණය | | 4,849,756 | 4,774,004 |
| කාර්ය මණ්ඩල හදිසි රක්ෂණ ආවරණය | | 640,286 | 588,460 |
| කාර්ය මණ්ඩල නිවාස ණය පොළී සහනාධාර | | 1,178,822 | 1,221,314 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | | 4,083,877 | 2,740,156 |
| විධායක යැපුම් | | 98,500 | 21,000 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා ඉන්ධන වියදම් ප්‍රතිපූරණය | | 3,393,178 | 2,954,542 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා වාහන දීමනා | | 7,070,613 | 5,667,096 |
| කල්බදු සඳහා මූල්‍ය ගාස්තු | | 10,652 | 136,482 |
| විදෙස් ගමන් වියදම් සහ පුහුණු වියදම් | | 20,098,681 | 17,017,101 |
| කාර්ය මණ්ඩල පුහුණු වියදම් - දේශීය | | 2,043,342 | 1,944,852 |
| සාමාජික දායක මුදල් | | 512,265 | 392,145 |
| අධ්‍යයනය සඳහා අනුග්‍රාහකත්වය * | | 354,664 | 586,777 |
| බඳවාගැනීම් සඳහා දැන්වීම් ගාස්තු | | 1,715,581 | 1,023,345 |
| ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | | 343,438 | 391,618 |
| | | 159,203,688 | 140,311,036 |

* ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු. 250,000ක උපරිමයකට යටත් වූ මුදලක් වසර තුනකට වරක් ආයතනයේ විධිවිධාන වලට යටත්ව ලබා දෙන අතර අදාල පාඨමාලාව සහ විභාග සාර්ථකව සම්පූර්ණ කළ පසු අවුරුදු 2ක කාලයක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට ද සේවකයා බැඳී සිටී. වෙනයම් හේතුවක් හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමට නොහැකි වූ සේවකයන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතු වේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කලද, එකඟ වූ සම්පූර්ණ කාලය ආයතනයට සේවය කිරීමට අසමත් වූ සේවකයන් සම්පූර්ණ කල යුතු ඉතිරි සේවා කාලය සඳහා ගෙවිය යුතු මුදල සමානුපාතිකව ගණනය කර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආපසු ගෙවිය යුතු වේ.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **16. පරිපාලන හා ආයතනික වියදම්** | | | |
| කුලී සහ රථවාහන ගාල් කුලී | | 53,972,215 | 35,469,340 |
| විදුලි ගාස්තු | | 4,126,215 | 3,927,226 |
| කාර්යාල නඩත්තු | | 176,275 | 249,327 |
| කාර්යාල උපකරණ නඩත්තුව සහ රක්ෂණය | | 8,125,058 | 3,197,316 |
| දුරකථන, අන්තර්ජාල, ඊ මේල් සහ වෙබ් | | 3,870,234 | 4,009,795 |
| මෝටර් වාහන ඉන්ධන, නඩත්තුව, බලපත්‍ර සහ රක්ෂණය | | 2,146,928 | 2,196,072 |
| වෘත්තීය ගාස්තු | | 500,426 | 49,900 |
| සාමාජික ගාස්තු | | 985,895 | 829,856 |
| රැස්වීම් වියදම් | | 693,217 | 870,597 |
| ත්‍යාග සහ විනෝදාස්වාද | | 207,327 | 181,378 |
| පුස්තකාල පොත් | | 25,490 | 96,903 |
| පුවත්පත් සහ වාර ප්‍රකාශන | | 233,111 | 175,496 |
| මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය | | 2,204,796 | 1,910,306 |
| දේශීය ගමන් වියදම් | | 385,226 | 211,973 |
| රක්ෂණය-සියළුම අවදානම්, මහජන පුස්තකාලය, සංක්‍රමණ සහ ගිනි රක්ෂණ සඳහා මුදල් 380,679 | | | 408,051 |
| තැපැල් සහ මුද්දර ගාස්තු | | 1,886,924 | 84,777 |
| කුරියර් ගාස්තු | | 141,475 | 141,177 |
| නීති වියදම් | | 1,357,000 | 995,990 |
| විගණන ගාස්තු - අභ්‍යන්තර | | 205,600 | 206,210 |
| විගණන ගාස්තු - බාහිර | | 480,000 | 200,000 |
| පොදු වියදම් | | 138,689 | 604,420 |
| කපා හරින ලද රඳවා ගැනීමේ බදු | | - | 5,399 |
| වෙළඳ බදු | | 10,000 | 10,000 |
| එකතු කළ අගය මත බදු වියදම් (වැට් බද්ද) | | 11,400,571 | 6,749,801 |
| ජාතිය ගොඩ නැඟීමේ බද්ද | | 304,614 | 535,509 |
| ක්ෂය වීම | 1 | 16,026,487 | 15,333,194 |
| | | 110,011,824 | 78,622,641 |
| **17. ප්‍රාග්ධන වෙළඳපළ සංවර්ධන වියදම්** | | | |
| ප්‍රාග්ධන වෙළඳපළ සහ නිෂ්පාදිත සංවර්ධනය | | 15,938,352 | 1,632,809 |
| මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | | 38,755,180 | 10,922,512 |
| සම්මන්ත්‍රණ වියදම්-CMET | | 4,121,525 | 5,691,009 |
| අන්තර්ජාතික සාමාජිකත්ව ගාස්තු - IOSCO | | 2,595,600 | 2,269,792 |
| ප්‍රචාරණය සහ දැන්වීම් ගාස්තු | | 1,824,170 | 913,366 |
| වෙළඳපොළ ආවේක්ෂණ පිරිවැය | | 2,885,430 | 3,048,949 |
| විමර්ශන වියදම් | | 107,798 | - |
| | | 66,228,055 | 24,478,437 |
| **18. මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු | | 85,112 | 102,328 |
| | | 85,112 | 102,328 |

## 19. බදුකරණය

1979 අංක 28 දරන සංශෝධිත දේශීය ආදායම් පනත ප්‍රකාරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ආදායම් බදු අයකිරීමට යටත් නොවේ.

## 20. ප්‍රාග්ධන බැඳීම්

සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් වෙතින් රුපියල් 2,912,733.92ක් වටිනා ආපදා ප්‍රතිසාධන නිවාරණයක්, ෆයර්ටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් රුපියල් 1,405,152ක් වටිනා Nowark 1230 ගිනි නිවීම් පද්ධතිය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් ද්වාරය වැඩි දියුණු කිරීම පිණිස සයිබර් කන්සෙප්ට් ලිමිටඩ් වෙත රුපියල් 250,000ක මුදල 2013.12.31 දිනට පැවති ප්‍රාග්ධන බැඳීම් විය.

## 21. අසම්භාව්‍ය බැරකම්

2013.12.31 දින වන විට අසම්භාව්‍ය බැරකම් කිසිවක් නොමැත.

## 22. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල ගැළපීම් අවශ්‍ය කරනු ලබන ආකාරයේ සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව සිදුව නොමැත.

## 23. සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය කිරීම

කොමිෂමේ පහත සඳහන් සාමාජිකයින් 2013 පූර්ණ වර්ෂය තුළ, අද දිනය දක්වා කොමිෂමේහි ධුරයන් දරමින් සිටිති.

- ආචාර්ය නාලක ගොඩහේවා මහතා - සභාපති සහ පත්කළ සාමාජික
- ලෝලිත අබේසිංහ මහතා - පත්කළ සාමාජික, ඔහුගේ වසර 3ක ධුර කාලය 2013 මැයි 16 වන දින අවසන් වූ අතර, 2013 ජූනි මස 18 වන දින නැවත පත්කර ගන්නා ලදී.
- මොහමඩ් සුරේෂ් හිෆාස් හෂීම් මහතා - පත්කළ සාමාජික, ස්වකීය ධුර කාලය 2013 අගෝස්තු මස 01 දිනෙන් අවසන් වීමට පෙර 2013 ජූනි මස 18 වන දින නැවත පත්කර ගන්නා ලදී.
- ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා - පත්කළ සාමාජික.
- ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා - පත්කළ සාමාජික.
- ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික.

කොමිසමේ පහත සඳහන් සාමාජිකයින් වර්ෂය තුළ පහත පරිදි පත් කරන ලදී:

- ඩී එන් ආර් සිරිවර්ධන මහතා - වැඩබලන සමාගම් රෙජිස්ට්‍රාර්, 2013 අප්‍රේල් 1 දිනෙන් ආරම්භව වසරක කාල සීමාවක් සඳහා නිල බලයෙන් පත්වූ සාමාජික.

- අර්ජුන හේරත් මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ධූරය දැරීමෙන් හිමිවන බලතල ප්‍රකාරව 2013 දෙසැම්බර් මස 20 වන දින නිල බලයෙන් සාමාජිකත්වයට පත්විය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ලෙස වසර දෙකක ස්වකීය ධූරය සම්පූර්ණ විමෙන් පසු නිල බලයෙන් පත්වූ සාමාජිකයෙක් ලෙස සුජීව රාජපක්ෂ මහතාගේ ධූරය 2013 දෙසැම්බර් මස 20 වන දින අවසන් විය.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුල දී දරන ලද සම්බන්ධතාවයන් සහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනෙයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ආචාර්ය නාලක ගොඩහේවා මහතා | ශ්‍රී ලංකා කේටරින් සර්විසස්<br>ශ්‍රී ලංකා අත්කම් මණ්ඩලය<br>ද ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී<br>කළම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් කෝපරේෂන් පීඑල්සී<br>ලිබර්ටි හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ 2013 නොවැම්බර් 15 දක්වා<br>අධ්‍යක්ෂ 2013 ජූලි 19 දක්වා<br><br>අධ්‍යක්ෂ 2013 ජූලි 19 දක්වා |
| ලෝලිත අබේසිංහ මහතා | ලැයිස්තුගත සමාගම් මණ්ඩල අධයක්ෂ ධූරයක් නොමැත | - |
| මොහමඩ් සුරේෂ් හිෆාස් හෂීම් මහතා | ඩිවලොප්මන්ට් ඉන්ටර්ප්ලෑන් සිලෝන් (පුද්) සමාගම<br>කෙරී මාල්ෂිප් ලොජිස්ටික්ස් ලංකා (පුද්) සමාගම | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ |
| ඩී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා | ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනය<br>ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය<br>අපි වෙනුවෙන් අපි කළමණාකරණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය<br>පෙට්‍රෝලියම් කර්මාන්ත අමාත්‍යංශය - විශේෂ ස්ථාවර අමාත්‍ය මණ්ඩල පත්වීම් ප්‍රසම්පාදන කමිටුව<br>වෙස්ට් කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් | සභාපති<br>සභාපති<br>මණ්ඩල සාමාජික<br>මණ්ඩල සාමාජික<br>මණ්ඩල සාමාජික 2012 අගෝස්තු 10 සිට<br><br>මණ්ඩල සාමාජික |
| ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා | - | - |
| පී.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා | යුනියන් බැංකුව<br>කමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස්<br>තැප්‍රොබේන් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්<br>සිලෝන් ලෙදර් ප්‍රඩක්ට්ස්<br>හඹන පෙට්‍රොකෙමිකල්ස් ලිමිටඩ්<br>කමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්<br>ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කෝපරේෂන් ලිමිටඩ්<br>තෝමස් කුක් ට්‍රැවල්ස් - ශ්‍රී ලංකා | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>සභාපති<br>අධ්‍යක්ෂ |
| ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා | ලංකා විදුලිබල මණ්ඩලය<br>ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව<br>ලිත්රෝ ගෑස් ලිමිටඩ්<br>ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය<br>සෙවන අරමුදල<br>ශ්‍රී ලංකා කාබන් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>සීනි සමාගම<br>තේ පර්යේෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික<br>මණ්ඩල සාමාජික<br>කළමණාකරන මණ්ඩලය 2013 ජනවාරි 9 දක්වා<br>මණ්ඩල අධ්‍යක්ෂ 2013 ජනවාරි 9 දක්වා<br>මණ්ඩල අධ්‍යක්ෂ 2013 ජනවාරි 9 දක්වා<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>කළමණාකරන අධ්‍යක්ෂ සහ මණ්ඩල සමාජික<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>මණ්ඩල අධ්‍යක්ෂ 2013 මැයි 7 සිට |

| නම | ආයතනෙයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරන ආයතනය | මණ්ඩල සාමාජික 2013 අප්‍රේල් 1 සිට<br>මණ්ඩල සාමාජික 2013 අප්‍රේල් 1 සිට<br>මණ්ඩල සාමාජික 2013 අප්‍රේල් 1 සිට |
| අර්ජුන හේරත් මහතා | ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය<br>පශ්චාත් උපාධි කළමණාකරන ආයතනය<br>ජාතික ව්‍යාපාර කළමණාකරණ ආයතනය<br>අර්නස්ට් ඇන්ඩ් යන්ග් | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ 2014 ජනවාරි සිට<br>අධ්‍යක්ෂ 2014 ජනවාරි සිට<br>හවුල්කරු |

පහත දැක්වෙන වගුව මගින් සමාලෝචිත වසර තුළ ධූර අවසන් වූ කොමිෂන් සභා සාමාජිකයින්ට සම්බන්ධිත පාර්ශ්වයවන් දක්වා ඇත.

| නම | ආයතනෙයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| සුජීව රාජපක්ෂ මහතා | නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී.<br>ඒෂියන් එලයන්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.<br>හේකාබ් පී.එල්.සී.<br>ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පී.එල්.සී.<br>ලංකා හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>කෝනුකෝපියා ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ 2013 ජනවාරි 30 සිට<br>අධ්‍යක්ෂ 2013 ජුලි 30 සිට<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ |

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාරික ගණුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිදු ගණුදෙනුවක් සිදු නොවීය.

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එෆ්බී/කේ/එස්ජීඑෆ්/2013 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2014 මැයි 27 දින

සභාපති,
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත ප්‍රකාර ඇතිකරන ලද පියවීම් සහතික කිරීමේ අරමුදල සම්බන්ධයෙන් වූ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 11(ඇ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-----------------------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 56,244,470 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූපී අතිරික්තය රු. 42,095,856 ක් වූයෙන් රු.14,148,614 ක අතිරික්තයේ වැඩිවීමක් දැක්වුණි.

3.2 අරමුදලේ කටයුතු
---------------------

1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 5(අ) ඡේදය පරිදි මධ්‍යම තැන්පතු පද්ධතියේ නිශ්කාශන සාමාජිකයින් අතර අර්බුද වාර්තා වී නොතිබුණ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු වන්දි ගෙවීමක් සිදුකර නොතිබුණි.

**අ/කැඑච්. ඒ. එස්. සමරවීර**
**විගණකාධිපති**

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

# පියවීම සහතික කිරීමේ අරමුදල
# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | | 435,743,484 | 459,637,724 |
| ස්ථාවර තැන්පත්වල ආයෝජනය | | 98,881,487 | |
| ලැබිය යුතු මුදල් | 5 | 21,330,438 | 40,072,769 |
| බැංකුවේ ඇති මුදල් | | 26,424,697 | 193,168 |
| **මුළු වත්කම්** | | 582,380,106 | 499,903,661 |
| **ශුද්ධ වත්කම් හා වගකීම්** | | | |
| **ශුද්ධ වත්කම්** | | | |
| ප්‍රදානයන් - භාණ්ඩාගාරය | | 50,000,000 | 50,000,000 |
| ප්‍රදානයන් - සෙස් අරමුදල | | 100,000,000 | 100,000,000 |
| ප්‍රදානයන් - කොළඹ කොටස් හුවමාරුව | | 100,000,000 | 100,000,000 |
| සමුච්චිත අරමුදල | | 305,830,105 | 249,585,635 |
| | | 555,830,105 | 499,585,635 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වියදම් | 6 | 26,550,001 | 318,026 |
| | | 26,550,001 | 318,026 |
| **මුළු ශුද්ධ වත්කම් සහ වගකීම්** | | 582,380,106 | 499,903,661 |

104 සිට 107 දක්වා පිටුවල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකරුවන් සතු වගකීමකි

පියවීම් සහතික කිරීමේ අරමුදල වෙනුවෙන්

ආචාර්ය නාලක එච්. ගොඩහේවා
භාරකරු - පියවීම් සහතික කිරීමේ අරමුදල

රජීව බණ්ඩාරනායක
භාරකරු -පියවීම් සහතික කිරීමේ අරමුදල

කොළඹදීය
2014 මැයි මස 12 වෙනි දින දීය

# පියවීම සහතික කිරීමේ අරමුදල
# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය මත පොළිය | | 53,475,225 | 42,120,856 |
| ස්ථාවර තැන්පත්වල ආයෝජනය මත පොළිය | | 2,772,745 | |
| | | 56,247,970 | 42,120,856 |
| අඩු කළා: | | | |
| **වියදම්** | | | |
| විගණන ගාස්තු | | - | 25,000 |
| බැංකු ගාස්තු | | 3,500 | |
| | | 3,500 | 25,000 |
| **වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම** | | 56,244,470 | 42,095,856 |

104 සිට 107 දක්වා පිටුවල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි

# පියවීම සහතික කිරීමේ අරමුදල
# ශුද්ධ වත්කම් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 අවසන් වර්ෂයට | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| සමුච්චිත අරමුදල් | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | | 249,585,635 | 207,133,055 |
| එකතු කළා: රජයේ විගණන ගාස්තු අති ප්‍රතිපාදනය | | - | 356,974 |
| අඩුකළා: බැංකු අයකිරීම් ගැළපීම | | - | (250) |
| වර්ෂය සඳහා ශුද්ධ ආදායම | | 56,244,470 | 42,095,856 |
| වර්ෂය අවසාන ශේෂය | | 305,830,105 | 249,585,635 |

104 සිට 107 දක්වා පිටුවල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි

# පියවීම සහතික කිරීමේ අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂය සඳහා ශුද්ධ ආදායම | | 56,244,470 | 42,095,856 |
| ගැලපීම් | | | |
| පෙර වර්ෂ වලදී විගණන ගාස්තු සඳහා අති ප්‍රතිපාදනය | | - | 356,724 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| අනෙකුත් ලැබීම් වැඩි වීම/(අඩු වීම) | 5 | 18,742,331 | (18,395,679) |
| අනෙකුත් ගෙවීම් වැඩි වීම/(අඩු වීම) | 6 | 26,231,975 | (395,533) |
| | | 44,974,306 | (18,434,488) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)** | | 101,218,776 | 23,661,368 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| කොළඹ කොටස් හුවමාරුවෙන් ලැබීම් | | - | 100,000,000 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)** | | - | 100,000,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය | | (74,987,247) | (123,730,640) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)** | | (74,987,247) | (123,730,640) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | | 26,231,529 | (69,272) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ | | 193,168 | 262,440 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ (සටහන අ) | | 26,424,697 | 193,168 |
| **(සටහන අ)** | | | |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ** | | | |
| බැංකුවේ ඇති මුදල් | | 26,424,697 | 193,168 |
| | | 26,424,697 | 193,168 |

104 සිට 107 දක්වා පිටුවල අඩංග සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි

# පියවීම සහතිකකිරීමේ අරමුදල ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පියවීම සහතික කිරීමේ අරමුදල යනු ලාභ උපයනු නොලබන ආයතනයක් වන අතර, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර තිබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වූ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකාර මණ්ඩලය වගකිව යුතු වේ.

1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පියවීම් සහතික කිරීමේ අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව භාරකාර මණ්ඩලයක් විසින් තක්සේරු කර තිබේ. අවිනිශ්චිත අනාගතයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩවම සිදුකිරීම පිණිස පියවීම් සහතික කිරීමේ අරමුලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට භාරකාර මණ්ඩලයට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් භාරකාර මණ්ඩලය මෙහෙයුම් ඈවරකිරීමේ හෝ අවසන් අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දී පියවීම් සහතිකකිරීමේ අරමුදලෙහි භාරකාර මණ්ඩලය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම අඛණ්ඩවම යොදා ගැනීම සිදුකරයි.

1.4 පිළියෙල කිරීමේ පදනම

පියවීම් සහතික කිරීමේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත. මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මතය. යෝග්‍ය අවස්ථාවන්හිදී ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල දක්වා ඇත.

1.5 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

පහත සඳහන් හෙළිදරව් කිරීම් හැරුනු විට මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ආකාරයේ සිදුවීම් කිසිවක් ශේෂපත්‍ර දිනෙන් පසුව සිදුවී නොමැත.

1.6 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමග සංගත වේ.

1.7 සංසන්දනාත්මක අගයන්

සංසන්දනාත්මක අගයන් ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ඉදිරිපත්වන ආකාරයෙන් වෙනස්කම්වලට යෝග්‍ය පරිදි ගැලපීම් සිදුකර තිබේ.

2. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු වල සහ රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් වල පමණක් ආයෝජන සිදුකර ඇති අතර පිරිවැය යටතේ දක්වා ඇත.

2.2 ලැබිය යුතු මුදල්

ඇස්තමේන්තුගත උපලබ්ධිවන අගයට ලැබිය යුතු අගයන් සඳහන් කර ඇත.

3. වගකීම් සහ ප්‍රතිදාන

3.1 විශ්‍රාමික ප්‍රතිලාභ

පියවීම් සහතික කිරීමේ අරමුදලේ පරිපාලනමය කටයුතු භාරකරුවෙකු හරහා සිදුකරන බැවින් සහ අරමුදලේ සේවයේ නියුක්ත පූර්ණ කාලීන සේවක මඩුල්ලක් නොමැති බැවින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

3.2 ගෙවිය යුතු මුදල්

ගෙවිය යුතු මුදල් පිරිවැය යටතේ ගණනය කෙරේ.

4. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

4.1 ආදායම් හඳුනාගැනීම

ආයෝජන මත පොලිය උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.2 වියදම හඳුනා ගැනීම

අරමුදල පවත්වාගෙන යාම සඳහා දැරූ සියලු වියදම්, වියදමට වැඩි අතිරික්ත ආදායම ගණනය කිරීමේදී ආදායමෙන් අඩුකර පෙන්වා ඇත.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කොට ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිතා කරමිනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දේ අතැති මුදල් සහ බැංකු වීක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ.

### 5. ලැබිය යුතු දෑ

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| ලැබිය යුතු පොළිය | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 18,557,693 | 40,072,769 |
| - ස්ථාවර තැන්පත් | 2,772,745 | - |
| | 21,330,438 | 40,072,769 |

### 6. ගෙවිය යුතු දෑ

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| විගණන ගාස්තු | 257,882 | 318,026 |
| ලංකා බැංකුවට ගෙවිය යුතු | 26,292,119 | - |
| | 26,550,001 | 318,026 |

### 7. ප්‍රාග්ධන බැඳීම්

2013 දෙසැම්බර් මස 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

### 8. අසම්භාව්‍ය වගකීම්

2013 දෙසැම්බර් මස 31 වැනි දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නොවීය.

### 9. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

භාරකරුවන් විසින් සිදුවීම් සමීපව අධීක්ෂණය කරන අතර යෝග්‍ය පරිදි ශේෂ පත්‍ර දිනට පසු ප්‍රමාණවත් සිදුවීම්වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් සහ හෙළිදරව් කිරීම් සිදු කරනු ඇත.

### 10. සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (SEC), සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද කොළඹ කොටස් හුවමාරුවේ (CSE) සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ද පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවන් ලෙස කටයුතු කරති.

පහත සඳහන් භාරකරුවන් 2013 වසර තුළ ධුරයන් දරන ලදී.

* ආචාර්ය නාලක ගොඩහේවා මහතා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (SEC) සභාපති
* තිලාන් බාලේන්ද්‍ර මහතා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (SEC) සභාපති
* ආචාර්ය බී. එම්. එස්. බටගොඩ මහතා, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහතා 2013 නොවැම්බර් මස 14 වන දින නිලතල දැරීම හේතුකොටගෙන භාරකරුවෙක් ලෙස පත් කරන ලදී.

සමාලෝචිත වසර තුළ පහත සඳහන් භාරකාරයින්ගේ ධුර දැරීම අවසන් විය.

* ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය හරින්ද්‍ර දිසාබණ්ඩාර මහතා 2013 මැයි මස 28 වන දින භාරකරුවෙක් ලෙස පත් කරන ලදී.
* ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විධායක නිලධාරිනී සුරේඛා සෙල්ලහේවා මහත්මිය 2013 ඔක්තෝම්බර් මස 31 වන දින ඉල්ලා අස්වීමත් සමගම භාරකරුවෙක් ලෙස ඇයගේ තනතුර අවසන් විය.

# පියවීම සහතිකකිරීමේ අරමුදල ගිණුම්කරණ ප්‍රතිපත්ති

වර්ෂය තුළදී අරමුදලෙහි භාරකරුවන් විසින් දරන ලද සම්බන්ධතාවය පහත වගුවෙහි දක්වා ඇත

| භාරකරුගේ නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ආචාර්ය නාලක ගොඩහේවා | ශ්‍රී ලංකා කේටින් සර්විසස්<br>ශ්‍රී ලංකා අත්කම් මණ්ඩලය<br>ද ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී<br>කළම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලොප්මන්ට් කෝපරේෂන් පීඑල්සී<br>ලිබර්ටි හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ 2013 නොවැම්බර් 15 දක්වා<br>අධ්‍යක්ෂ 2013 ජූලි 19 දක්වා<br>සභාපති<br>සභාපති |
| ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා | ජෝන් කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්)සමාගම<br>ජේකේ මාර්කටින් ස්ර්විසස් (පුද්) සමාගම<br>නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී.<br>නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්) සමාගම<br>සවුත් ඒසියා ගේට්වේ ටර්මිනල්ස් (පුද්) සමාගම<br>ජෝන් කීල්ස් කැපිටල් (පුද්) සමාගම<br>ජෝන් කීල්ස් බී.පී.ඕ. හෝල්ඩින්ග් පුද්ගලික සමාගම<br>ජෝන් කීල්ස් බී.පී.ඕ. සොලියුෂන්ස් ඉන්දියා පුද්ගලික සමාගම<br>ජෝන් කීල්ස් බී.පී.ඕ. ඉන්වෙස්ට්මන්ට් පුද්ගලික සමාගම<br>ජෝන් කීල්ස් බී.පී.ඕ. ඇල්ෆා පුද්ගලික සමාගම<br>බ්‍රිටිෂ් ඕවර්සීස් (පුද්ගලික) සමාගම<br>වොඩ්ලොක් මැකන්සි ලිමිටඩ්<br>ඇලිඩ් ප්‍රොපර්ටි ලිමිටඩ්<br>කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව<br>කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව<br>ජෝන් කීල්ස් බී.පී.ඕ. සොලියුෂන්ස් පුද්ගලික සමාගම<br>ජෝන් කීල්ස් සොලියුෂන්ස් කැනඩා ඉන්ක් අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ 2008 මාර්තු7 සිට<br>සභාපති 2011 ජූනි 14 සිට<br>අධ්‍යක්ෂ<br>"TBA" |

| භාරකරුගේ නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ආචාර්ය බී එම් එස් බටගොඩ | ලංකා විදුලිබල මණ්ඩලය<br>සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව<br>ලිත්රෝ ගෑස් ලිමිටඩ්<br>ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යාපන ආයතනය<br>කළමණාකරන පශ්චාත් උපාධි ආයතනය<br>සෙවන අරමුදල<br>ශ්‍රී ලංකා කාබන් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>ලංකා සීනි සමාගම<br>තේ පර්යේෂණ මණ්ඩලය<br>මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | මණ්ඩල සාමාජික<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>කළමණාකරන මණ්ඩලය 2013 ජනවාරි 9 දක්වා<br>මණ්ඩල අධ්‍යක්ෂ 2013 ජනවාරි 9 දක්වා<br>මණ්ඩල අධ්‍යක්ෂ 2013 ජනවාරි 9 දක්වා<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>මණ්ඩල සාමාජික<br>මණ්ඩල අධ්‍යක්ෂ<br>කළමණාකරන අධ්‍යක්ෂ සහ මණ්ඩල සාමාජික<br>මණ්ඩල සාමාජික<br>මණ්ඩල අධ්‍යක්ෂ 2013 මැයි 7 සිට<br>නියෝජ්‍ය භාණ්ඩාගාරික ලේකම් |
| රජීව බණ්ඩාරනායක මහතා | කොළඹ කොටස් හුවමාරුව | ප්‍රධාන විධායක නිලධාරි 2013 නොවැම්බර් 14 සිට |

සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලේ භාරකරුවන් වශයෙන් පත්ව ධුර දැරීම අවසන් වූ සාමාජිකයින්ගේ ධුර දැරීම් පිළිබඳ විස්තරයක් පහත දැක්වෙන සටහනෙහි දක්වා ඇත.

| භාරකරුගේ නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| සුරේඛා සෙල්ලහේවා මහත්මිය | කොළඹ කොටස් හුවමාරුව | ප්‍රධාන විධායක නිලධාරි - 2013 ඔක්තෝම්බර් 23 දක්වා |
| මහාචාර්ය හරින්ද්‍ර දිසාබණ්ඩාර මහතා | ඉදිකිරීම් ඇප අරමුදල<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික 2013 මැයි 27 දක්වා<br>මණ්ඩල සාමාජික 2013 මැයි 27 දක්වා |

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාරික ගණුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිදු ගණුදෙනුවක් සිදු නොවීය.

# සටහන්

## කාර්යාලීය ලිපිනය
28 හා 29 වන මහල
නැගෙනහිර කුළුන
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය
ඇචිලන් චතුරශ්‍රය
කොළඹ 01.
ශ්‍රී ලංකාව

## දුරකථන
+94 11 2331013-6
+94 11 2439144-8

## ෆැක්ස්
+94 11 2439149

## ඊ මේල්
mail@sec.gov.lk

## අන්තර්ජාලය
www.sec.gov.lk

## නෛතික ස්වභාවය
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 1991 අංක 26 හා 2003 අංක 18 සහ 2009 අංක 47 දරණ පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරන ව්‍යවස්ථාදායක පනත යටතේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයක් වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ විෂය පථය යටතට ගැනේ.

## ගිණුම් වර්ෂය
2013 දෙසැම්බර් 31

## විගණකවරුන්
විගණකාධිපතිවරයා

## බැංකුකරුවන්
ලංකා බැංකුව
සම්පත් බැංකුව
ස්ටෑන්ඩඩ් චාටඩ් බැංකුව
හොංකොං ඇන්ඩ් ෂැන්හයි බෑංකින් කෝර්පරේෂන් ලිමිටඩ්
කොමර්ෂල් බැංකුව

REDWORKS
Designed & produced by REDWORKS
Photography by Studio Times & Sumedha
Digital plates & Printed by Printel (Pvt) Ltd

www.sec.gov.lk